# රණවිරුවා

2025 සැප්තැම්බර් • 280 කලාපය






කතුන් වෙහෙර මහ දෙව් පෙර දවස වගේ
ඇතුන් වන් පුතුන් පුද දී රටට අගේ
අතින් අත නොහැර ආ මඟ ලකුණු දිගේ
ඉතින් ආයුබෝවන් මව්තුමිය මගේ

- ලුතිනන් කර්නල් ඊඑච් සුජිත් චමින්ද

ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.

# නොහැක්කක් නොමැති විරුවන්ගේ අභිමානවත් පෙළහර









**කමාන්ඩෝ** පුහුණු පාඨමාලා අංක 52 A සහ 52 B හි විසිරයාම ඌව - කුඩාඔය, කමාන්ඩෝ රෙජිමේන්තු පුහුණු පාසලේ දී ඉකුත් සැප්තැම්බර් මස 20 වන දින පැවති අතර, එහිදී නිලධාරීහු 07 දෙනෙක් සහ සෙසුනිලයින් 78 දෙනෙකු විසිර ගියහ. මෙම අභිමානවත් උත්සව අවස්ථාව සඳහා 1 බලකායේ බලකාධිපති සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් කේඑච්එම්එස් වික්‍රමරත්න ආර්එස්පී ගේ ආරාධනයෙන් යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මිය ප්‍රධාන අමුත්තන් ලෙස එක්වූහ.







එහිදී, පාඨමාලාව සාර්ථකව නිම කළ නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ දෙමාපියන් හා ළඟම ඥාතීන් විසින් ඔවුන් හට කමාන්ඩෝ නිල ලාංඡන පැළඳවීම සිදුකරනු ලැබූහ. අනතුරුව, යුද්ධ හමුදාධිපති සහ කමාන්ඩෝ රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති, විසිර යන ලද නිලධාරීන්ගේ හා සෙසුනිලයින්ගේ අනන්‍යතාවය සහ වෘත්තීය ගෞරවය සංකේතවත් කරන්නාවූ මෙරූන් හිස්වැසුම ඔවුන් වෙත පැළඳ වූහ. එසේම, යුද්ධ හමුදාධිපති විසින් එම පාඨමාලාවේ විශිෂ්ට දක්ෂතා දැක්වූවන් වෙත විශේෂ ත්‍යාග ද පිරිනමන ලදී. පාඨමාලාවේ දක්ෂතම කමාන්ඩෝ භටයාට හිමි සම්මානය ලුතිනන් ආර්එම්ආර්යූ දිසානායක දිනාගත් අතර, දක්ෂතම වෙඩික්කරු වූයේ ලුතිනන් එන්එම්එස්සී දිසානායක ය. හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් යුත් සෙබළා ලෙස ලාන්ස් කෝප්‍රල් වීරසිංහ ඩබ්ලිව්එම්සීඑස් සම්මානයට පාත්‍රවිය. විසිර යාමේ පෙළපාලිය අවසානයේ තූර්ය වාදක සංදර්ශනයක් සහ කමාන්ඩෝ භටයන්ට ආවේණික වීර ක්‍රියාදාමයන් රැසකින් උත්සවය වර්ණවත් කරලීය.









# 76 වන සංවත්සරය

1949 2025

**ඔක්තෝබර් මස 10 වන දිනට යෙදුන 76 වන යුද්ධ හමුදා සංවත්සරයට සමගාමීව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ ප්‍රධානත්වයෙන් උත්සව කටයුතු රැසක් පැවැත්විණ. එහිදී, සර්ව ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් ශ්‍රී දළදා මාලිගය, අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය, කතරගම කිරිවෙහෙර, වවුනියාවේ ශ්‍රී කන්දසාමි කෝවිල කේන්ද්‍ර කොටගෙන පැවති පිංකම් ප්‍රධාන විය. තවද, අනුරාධපුර අභිමංසල - I හි නේවාසික රණවිරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා ද යුද්ධ හමුදාධිපති එක්විය.**

ඉකුත් සැප්තැම්බර් 26 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධිය අභියසදී පැවැති යුද්ධ හමුදා ධජයන්ට සෙත්පැතීමේ අවස්ථාවට අටමස්ථානාධිපති පූජ්‍ය ආචාර්ය පල්ලේගම හේමරතන නායක ස්වාමීන් වහන්සේ ද එක් වූ සේක. එහිදී, ලංකාරාම රජමහා විහාරස්ථානයේ විහාරාධිපති අතිපූජ්‍ය රළපනාවේ ධම්මජෝති හිමිපාණන් විසින් යුද්ධ හමුදාව ජාතිය වෙනුවෙන් සිදුකළ අනුපමේය කාර්යභාරය අගය කරමින් විශේෂ අනුශාසනාවක් ද සිදුකළ සේක.





වවුනියාවේ ශ්‍රී කන්දසාමි කෝවිලෙහිදී ප්‍රධාන කුරුක්කල් සිව ශ්‍රී සර්වේශ්වර කුරුක්කල්ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් සැප්තැම්බර් 26 වන දින විශේෂ හින්දු 'ආශිර්වාද' පූජාවක් පැවැත්විණ. එහිදී, එම කෝවිලේ භාණ්ඩාගාරික අරුල් සෙල්වම් මහතාට යුද්ධ හමුදාධිපති විසින් කෝවිලේ සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරන ලදී.





ඉකුත් සැප්තැම්බර් 26 වන දින යුද්ධ හමුදාධිපති, අනුරාධපුරයේ පිහිටි "අභිමන්සල - 1" සුවතා නිකේතනයෙහි රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ සුවදුක් විමසා බලමින්







මහනුවර ශ්‍රී දළදා මාළිගාවේදී යුද්ධ හමුදා ධජයන්ට සෙත්පැතීම ඉකුත් සැප්තැම්බර් මස 28 වන දින සිදුකෙරුණු අතර, එහිදී ශ්‍රී දළදා මාළිගාවේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යුද්ධ හමුදාධිපති විසින් මූල්‍ය පරිත්‍යාගයක් ද සිදුකරන ලදී. තවද, අස්ගිරි පාර්ශ්වයේ අනුනායක අතිපූජ්‍ය නාරම්පනාවේ ආනන්ද හිමියන් බැහැදැක ආශිර්වාද ලබාගන්නට ද හෙතෙම අමතක නොකළේය.





ඓතිහාසික කිරිවෙහෙර චෛත්‍යරාජයාණන් අභියසදී හා කතරගම දේවාල පරිශ්‍රයේදී 2025 සැප්තැම්බර් 29 වන දින පැවැති යුද්ධ හමුදා ධජයන්ට සෙත්පැතීමේ අවස්ථාවේදී කිරිවෙහෙර විහාරාධිපති පූජ්‍ය කොබවක ධම්මින්ද හිමියන් විසින් ආගමික වතාවත් සිදුකරන ලද අතර, පසුව මහසෙන් දේවාලයේ දී විශේෂ පූජාවක් ද  පැවැත්විණ.





බටහිර ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් සංවිධානය කළ ආගමික වැඩසටහනක් පනාගොඩ, ශ්‍රී බෝධිරාජාරාම විහාරස්ථානයේදී ඉකුත් සැප්තැම්බර් මස 07 වන දින පැවැත්විණ. ජාතිය වෙනුවෙන් උත්තරීතර පරිත්‍යාගයක් සිදුකළ දිවංගත රණවිරුවන්ට උපහාර දැක්වීම සහ සන්නද්ධ හමුදා සාමාජිකයන් වෙත ආශිර්වාද එක්කිරීමේ අරමුණින් සිදුකළ මෙම පිංකම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ද එක්විය.

මෙම අවස්ථාවට බටහිර ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් යූකේඩීඩීපී උඩුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරීන්, සෙසුනිලයින් සහ ප්‍රදේශවාසීහු රැසක් සහභාගි වූහ.

# බටහිර ආරක්ෂක සේනා මූලස්ථානය වෙතින් පොහෝ දින වැඩසටහනක්





# 27 වන ඉන්දු-පැසිෆික් ආරක්ෂක ප්‍රධානීන්ගේ සමුළුව

27 වන වාර්ෂික ඉන්දු-පැසිෆික් ආරක්ෂක ප්‍රධානීන්ගේ සමුළුව ඉකුත් අගෝස්තු මස 25 සිට 28 වන දින දක්වා තායිලන්තයේදී පැවති අතර, ඒ සඳහා රටවල් 29ක් නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ හමුදා නායකයින් එක්වූහ. මේ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් යුද්ධ හමුදාධිපති සහභාගි විය.



"ශක්තිය තුළින් සාමය" යන තේමාව යටතේ පැවති මෙවර සමුළුවේදී, කලාපීය ආරක්ෂක අභියෝගයන්ට විසඳුම් සෙවීමේදී ආරක්ෂක සහ හමුදා ක්ෂේත්‍රවලින් ඔබ්බට විහිදෙන විවිධ පරාසයන් ඔස්සේ විසඳුම් සෙවීමේ වැදගත්කම පිළිබඳව එම විෂය පිළිබඳ පුළුල් දැනුමකින් යුත් කථිකයෝ අදහස් ඉදිරිපත් කළහ. එසේම, මෙම සමුළුවට සමගාමීව යුද්ධ හමුදාධිපති මිත්‍රපාක්ෂික රටවල ජ්‍යෙෂ්ඨ හමුදා නායකයින් කිහිප දෙනකු සමග හමුදා සහයෝගීතාව වැඩිදියුණු කිරීම සහ කලාපීය හවුල්කාරීත්වයන් ශක්තිමත් කිරීම පිළිබඳව ද්විපාර්ශ්වික සාකච්ඡාවන් ද පැවැත්වීය.

# නව පොලිස්පති යුද්ධ හමුදාධිපති හමුවෙයි

**නව පොලිස්පති ලෙස පත්වීම් ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා ඉකුත් සැප්තැම්බර් මස 12 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවිය.**







යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රය වෙත පැමිණි එතුමන් වෙත යුද්ධ හමුදා භටපිරිස් වෙතින් හිමිවූයේ ගෞරවණීය පිළිගැනුමකි. අනතුරුව පැවති හමුවේදී විවිධ රාජකාරි කටයුතුවලදී යුද්ධ හමුදාව සහ පොලිස් නිලධාරීන් අතර ඇති සමීප සහයෝගීතාවය යුද්ධ හමුදාධිපති විසින් සිහිපත් කරන ලදී.








ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ බ්‍රිගේඩියර් ඩීඩීඩී සේරසිංහ යූඑස්පී විසින් රචිත "මරණයේ හෝරාව දුටු භටවර ජයසෙන්" නම් ග්‍රන්ථය දොරට වැඩීමේ උත්සවය 2025 සැප්තැම්බර් මස 24 දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති සහභාගි විය. සිවිල් ආරක්ෂක භටයකු පිළිබඳ ප්‍රබන්ධ කතාවක් ඇසුරින් ලියැවුනු මෙම කෘතිය එම ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ දෙවන සාහිත්‍ය කෘතියයි.

# හටකාර්ය සම්පාදන සම්මන්ත්‍රණය 2025





යුද්ධ හමුදා හටකාර්ය සම්පාදන විද්‍යාලය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන හටකාර්ය සම්පාදන සම්මන්ත්‍රණය - 2025, රත්මලාන, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී ඉකුත් සැප්තැම්බර් මස 10 වන දින පැවැත්විණ. එහිදී, ත්‍රිකුණාමලය වරාය අනාගත හටකාර්ය සම්පාදන මධ්‍යස්ථානයක් ලෙස පත්කිරීමේ විභවතාවය, ඒ සඳහා ඇති අභියෝග සහ තිරසාර ක්‍රමවේද කෙරෙහි අවධානය යොමුවිය. යුද්ධ හමුදා හටකාර්ය සම්පාදන විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්ටී ලොකුතොටහේවා යූඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ප්‍රධානත්වය දැරීය. මෙවර සම්මන්ත්‍රණයට සමගාමීව, Logistics Journal 2025 සඟරාව නිල වශයෙන් එළි දැක්වීමද එහිදී සිදුවිය. මෙම සම්මන්ත්‍රණය සඳහා මාණ්ඩලික ප්‍රධාන, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන ඇතුළු පිරිසක්ද එක්වූහ.

# ඉන්දු පැසිපික් හමුදා ප්‍රධානීන්ගේ සමුළුව - 2025





14 වන ඉන්දු-පැසිෆික් හමුදා ප්‍රධානීන්ගේ සමුළුව, 49 වන ඉන්දු-පැසිෆික් හමුදා කළමනාකරණ සම්මන්ත්‍රණය සහ 11 වන ජ්‍යෙෂ්ඨ නායකයින්ගේ සංසදය, ඉකුත් සැප්තැම්බර් මස 23 වන දින සිට 26 වන දින දක්වා මැලේසියාවේ ක්වාලාලම්පූර් හිදී පැවැත්විණි. මෙවර එහි සම සත්කාරකත්වය මැලේසියානු හමුදාවට සහ එක්සත් ජනපද හමුදාවට හිමිවිය. මේ සඳහා යුද්ධ හමුදාධිපති නියෝජනය කරමින් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් ඩීකේඑස්කේ දොලගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී සමඟින් බ්‍රිගේඩියර් ටීඑම්එස්ජේ තෙන්නකෝන් ආර්එස්පී සහ ලුතිනන් කර්නල් එම්ජ්කේආර්කේ අබේවික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී යන නිලධාරීහු සහභාගි වූහ. මෙම සම්මන්ත්‍රණය සඳහා ඉන්දු-පැසිෆික් කලාපයේ හමුදා ප්‍රධානීහු 12 දෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ හමුදා නායකයින් 13 දෙනෙක් ඇතුළුව රටවල් 25කින් 190කට වැඩිපිරිසක් සහභාගි වූහ.




# පොපි මල් සැමරුම සංකේතවත් කරමින්



රට වෙනුවෙන් දිවිපිදූ සියලුම රණවිරුවන් සිහිකිරීමේ අරමුණින් ලෝක පොපි මල් දිනයට සමගාමීව ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ නියෝජිතයින් පිරිසක් ඉකුත් සැප්තැම්බර් මස 12 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවී පොපි මලක් පළඳවනු ලැබූහ. මෙම වසරේ පොපි මල් සැමරුම සංකේතවත් කරමින් ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ පොපි මල් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එල්එම් මුදලිගේ (විශ්‍රාමික) විසින් එහිදී යුද්ධ හමුදාධිපති වෙත එම පොපි මල පළඳවන ලදී.

පොපි මල් කමිටුවේ පරිපාලන කළමනාකරු බ්‍රිගේඩියර් එස්ජේඑම්ජ්ආර් සෙනෙවිරත්න (විශ්‍රාමික), භාණ්ඩාගාරික මේජර් ඩබ්ලිව්සී ද සිල්වා (විශ්‍රාමික) ඇතුළු තවත් සාමාජිකයින් කිහිප දෙනෙක් ද මෙම අවස්ථාවට එක්වූහ. රට වෙනුවෙන් ජීවිත පූජා කළ සන්නද්ධ හමුදා සාමාජිකයින්ගේ කැපකිරීම් සිහිපත් කිරීම සඳහා පළමු ලෝක යුද්ධය අවසන් වීමෙන් පසුව පොදුරාජ්‍ය මණ්ඩලීය සාමාජික රටවල් ඇතුළුව ලොව පුරා රටවල සෑම වසරකම නොවැම්බර් මස දෙවන ඉරු දින මෙම පොපිමල් සැමරුම පවත්වනු ලබයි.

# උසස්වීම් ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීට යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්



මේජර් ජෙනරාල් නිලයට උසස්වීම් ලද විශේෂ බලකායේ මේජර් ජෙනරාල් ආර්පීඑස් ප්‍රසාද් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඉකුත් සැප්තැම්බර් මස 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය. එහිදී, එම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත යුද්ධ හමුදාධිපති විසින් සංකේතාත්මකව මේජර් ජෙනරාල් නිලයට හිමි අසිපත පිරිනමමින් සිය සුබ පැතුම් එක්කරන ලදී.

# යුද්ධ හමුදාධිපති හමුවීම් රැසක

## ඉන්දීය යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් සමඟින්





ඉන්දීය යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් Lieutenant General R.S Raman PVSM AVSM YSM සමඟින් Brigadier S.S Dhaliwal SC YSM SM, Colonel Yash Vardhan Patel, Colonel Ashish Sood, මෙරට ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක ඉන්දීය නාවික හමුදාවේ Captain Anand Mukundan, Lieutenant Colonel Vikrant Vishwasrao Deshmukh සහ Lieutenant Colonel Mandeep Singh යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත දූත පිරිසක් ඉකුත් සැප්තැම්බර් මස 17 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවූහ.

## ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ උපදේශක සමඟින්





ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරතව සිටින ඉන්දියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ උපදේශක Major General Pawanpal Singh VSM SDS (Army-II), ඉකුත් සැප්තැම්බර් මස 01 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී හමුවිය.

## මොන්ගෝලියානු ආරක්ෂක උපදේශක සමඟින්





ශ්‍රී ලංකාවේ නිල සංචාරයක නිරතව සිටින මොන්ගෝලියානු තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක Colonel Zayat Odsuren, ඉකුත් සැප්තැම්බර් මස 23 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති හමුවිය.

# ‘My Journey with the Commando Regiment’ කෘතිය පිළිගන්වයි



කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිර්මාතෘ වන ලුතිනන් කර්නල් එස්ඩී පීරිස් (විශ්‍රාමික) යූඑස්පී පීඑස්සී විසින් රචිත ‘My Journey with the Commando Regiment’ නම් කෘතියෙහි පිටපතක් 2025 සැප්තැම්බර් මස 09 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී වෙත පිළිගන්වන ලදී.

ලුතිනන් කර්නල් සුනිල් දයාල් පීරිස් ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවේ නිර්මාතෘ වන අතර, එම ජ්‍යෙෂ්ඨ නිලධාරි යුද්ධ හමුදාව තුළ දූරදර්ශී නායකයෙක් වශයෙන් වඩාත් ප්‍රචලිතය. සිය කීර්තිමත් යුද්ධ හමුදා දිවිය තුළදී යුද්ධ හමුදාවේ හැකියාවන් වැඩි දියුණු කරමින් නවීකරණය කිරීමට එතුමන් විසින් ලබාදී ඇත්තේ මහත් වූ දායකත්වයකි.

# සමස්ත ලංකා පෙරදිග ශිෂ්‍යභට තූර්ය වාදක අභියෝගතා කුසලානය - 2025



**ජාතික ශිෂ්‍යභට බලකාය අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව සංවිධානය කළ සමස්ත ලංකා පෙරදිග ශිෂ්‍යභට තූර්යවාදක කණ්ඩායම් අභියෝගතා කුසලාන තරඟාවලිය ඉකුත් සැප්තැම්බර් මස 25 වන දින රන්ටැඹේ ශිෂ්‍යභට පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.**





ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂ මේජර් ජෙනරාල් ඒපීසීආර් ප්‍රේමතිලක ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහ රන්ටැඹේ පුහුණු මධ්‍යස්ථානයේ සේනාවිධායක කර්නල් ඒපී ලියනගේ ගේ ආරාධනයෙන් මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ප්‍රධාන අරාධිතයා ලෙස එක්විය.

එහිදී, ශිෂ්‍යභටයින් විසින් යුද්ධ හමුදාධිපති වෙත කඳවුරු මුරයේ ගෞරවාචාරය ද පිරිනමනු ලැබූහ. දිවයින පුරා පාසල් කණ්ඩායම් 136කින් තෝරාගත් ශිෂ්‍යභට කණ්ඩායම් 44ක් සහභාගී වූ මෙම තරඟාවලියේ ජයග්‍රහනය හිමිකරගත් කණ්ඩායම්වල ශිෂ්‍යභටයින් වෙත යුද්ධ හමුදාපති විසින් පදක්කම් පිරිනමන ලදී.









> හැමෝටම අලුත් පොත් ලියන්න පරිසරය හදලා තමන්ගෙ ජීවිත පරිච්ඡේදය සදහට වසාගත්ත පිරිසක් හිටියා. අලුත් පොත්වල අලුත් අලුත් මාතෘකා ඔස්සේ කතා ලියවුනත් ඒ අය ගැන ලියැවෙන්නේ නැතිතරම්. යුද්දෙ කියන්නෙ වෙඩි තියා ගන්න එකම නෙවෙයි. හමුදාව කියන්නෙ තුවක්කුමත් නෙවෙයි. ඒ නිසා ඔවුන්ගේ කතා කියවන්න...





# අවි දහසකට කළ නොහැකි දේ එක පෑනකට කළ හැකියි

"යුද්ධය" කියන නීරස මාතෘකාව ඇතුලෙ ඉතිරි වුනු රසවත් අව්‍යාජ මතක එකතුවක් සටන් බිමේ පයගහපු හැම කෙනෙක් තුළම තියනවා. "යුද සාහිත්‍යය" තුළින් කතාකරන්නෙ ඒ ගැනයි. මෙවරත් BMICH හි පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට සමගාමීව "යුද සාහිත්‍යය" කුටියක් පැවැත්විණ. දෙවන වරට යුද හමුදාව මඟින් සංවිධානය කළ මෙම සාහිත්‍යය කුටියට පැමිණි සැමට ගෙන දුන්නේ නැවුම් අත්දැකීමකි. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ගේ මඟපෙන්වීම මත ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සම්බන්ධීකරණයෙන් මෙම සාහිත්‍යය කුටිය පැවැත්විණ. විශේෂයෙන්ම රණබිමේ මතක හා අත්දැකීම් යුද සාහිත්‍යය ඔස්සේ සමාජගත කරවීම එහි අරමුණ වූ අතර, එමගින් ගිනි අවියට වැසුණු රණවිරුවන් සතු සාහිත්‍යය කුසලතා හා මානුෂීය ගුණ පොදු පාඨකයින් වෙත සමීප කරවීම අරමුණ විය. එසේම, දැනට යුද සාහිත්‍යකරණයේ නියැලී සිටින යුද හමුදා රචකයින් දිරිමත් කරලීමත් තවදුරටත් එවැනි සාහිත්‍යයධරයින් යුද හමුදාව තුළින් බිහිකිරීම සඳහා උනන්දු කරවීමත් මෙම වැඩසටහනෙහි තවත් අරමුණකි. මෙවර මෙම යුද සාහිත්‍යය කුටිය සඳහා දැනට සේවයේ නියුතු කතුවරුන් සේම විශ්‍රාමික කතුවරුන් රැසක් ද එක්ව සිටීම විශේෂත්වයකි. රණවිරු සාහිත්‍යය කියවීම වෙනුවෙන් පාඨකයින් දැක්වූ උනන්දුව කොතෙක් ද යන්න එහි රොක්වූ දහස් ගණන් ජනතාව තුළින් කදිමට සනාථ විය.






## සංග්‍රාමික කිමිදුම් පාඨමාලාව සාර්ථකව අවසන් කරමින්

සංග්‍රාමික කිමිදුම් පාඨමාලා අංක - 12 විසිර යාමේ පෙළපාලිය ඉකුත් සැප්තැම්බර් මස 06 වන දින නයාරු, විශේෂ බලකා සංග්‍රාමික කිමිදුම් පුහුණු පාසලේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් සහ විශේෂ බලකා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එම්ටීඅයි මහලේකම් ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී සහභාගි විය.

මෙම පාඨමාලාවේ දී කමාන්ඩෝ රෙජිමේන්තුවේ, යුද්ධ හමුදා විශේෂ බලකායේ සහ ගුවන් හමුදා විශේෂ බලකායේ නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ ශාරීරික දරාගැනීම, උපායශීලී කුසලතා සහ කිමිදුම් කුසලතා පරීක්ෂා කළ අතර, එහිදී ඔවුහු එම අභියෝගයන්ට මුහුණු දී මෙම පාඨමාලාව සාර්ථකව නිම කරනු ලැබූහ.

## සයිබර් ආරක්ෂණය සහ විද්‍යුත් සංග්‍රාමික සම්මන්ත්‍රණය - 2025




ඉකුත් සැප්තැම්බර් මස 12 වන දින පනාගොඩ, ශ්‍රී ලංකා සංඥා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරි නිවස්නයේදී "Securing the Digital Frontline" යන තේමාව යටතේ සයිබර් ආරක්ෂණය සහ විද්‍යුත් සංග්‍රාමික සම්මන්ත්‍රණය - 2025 පැවැත්විණ. මෙම වැඩසටහන 9 සහ 12 ශ්‍රී ලංකා සංඥා බලකායන් සමඟින් 2 සංඥා බලසේනාව එක්ව සංවිධානය කරන ලදී. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදා ප්‍රධාන සංඥා නිලධාරි සහ ශ්‍රී ලංකා සංඥා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ජීඑල්එස්ඩබ්ලිව් ලියනගේ යූඑස්පී එන්පීඑස් පීඑස්සී සහභාගි විය.

මෙය සයිබර් සහ විද්‍යුත් සංග්‍රාමික යුද අභියෝග පරිණාමය වීම පිළිබඳව සැසි වාර හතරක් යටතේ පැවැත් වූ අතර, මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයින් වූ ලක්මාල් ඇඹුල්දෙණිය, ලසන්ත ප්‍රියංකර, ෂර්වින් ජැන්සේ යන මහත්වරුන් සහ කර්නල් බීපී උඩගේ යූඑස්පී හා ලුතිනන් කර්නල් ඒඑම්සීකේ අතපත්තු යූඑස්පී විසින් එම සැසි මෙහෙයවනු ලැබූහ. මෙම සම්මන්ත්‍රණය සඳහා සංඥා බලකායේ නිලධාරීන් 71කට වැඩි පිරිසක් සහභාගි වූ අතර, තොරතුරු තාක්ෂණ ආරක්ෂක නිලධාරීහු 75ක් මාර්ගගතව ද එක්වූහ.

# බිම්බෝම්බ හඳුනාගැනීම පිළිබඳ වැඩමුළුවක්




ඕස්ට්‍රේලියානු රාජකීය හමුදා ඉංජිනේරු බලකා සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් වූ F3 බිම් බෝම්බ හඳුනා ගැනීම පිළිබඳ වැඩමුළුවක් ඉකුත් සැප්තැම්බර් මස 08 සිට 11 වන දින දක්වා ශ්‍රී ලංකා යුද හමුදා ඉංජිනේරු පාසලේදී පැවැත්විණ. එම පාසලේ සේනාවිධායක කර්නල් ජේඡ්සීඑස් ජාගොඩ පීඑස්සී ගේ ආරාධනයෙන් වැඩමුළුවේ අවසන් දින ප්‍රධාන ආරාධිතයා ලෙස ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක Colonel Amanda Johnston සහභාගි විය. එහිදී ආරක්ෂාව, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ මානුෂීය වගකීම යන පොදු අරමුණු පෙන්වා දෙමින් හමුදා ඉංජිනේරු විද්‍යාවේ වැදගත්කම අවධාරණය කළේය.







# එක්සත් ජාතීන්ගේ සිවිල් හමුදා සම්බන්ධීකරණ පාඨමාලාව අවසන්

ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනය විසින් 2025 සැප්තැම්බර් මස 08 වන දින ආරම්භ කරන ලද එක්සත් ජාතීන්ගේ සිවිල් හමුදා සම්බන්ධීකරණ පාඨමාලා අංක 06හි සමාප්ති උත්සවය ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින පැවැත්විණි. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ එම පුහුණු ආයතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඑම්එස්සීබී ජයතිලක ආර්එස්පී යූඑස්පී විසින් පාඨමාලාව සඳහා සහභාගිවූවන් වෙත සහතිකපත් ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිලධාරීන් 20ක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරීන් 02ක්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් 02ක් සහ බංග්ලාදේශය, ෆීජි, ඉන්දුනීසියාව, මොන්ගෝලියාව, නේපාලය සහ වියට්නාමය යන රටවල විදේශීය නිලධාරීන් 09 දෙනෙක් ඊට සහභාගි වූහ.

මෙම පාඨමාලාව සඳහා ගෝලීය සාම සාධක මෙහෙයුම් මුලපිරීම වැඩසටහනෙහි විශේෂඥයන්ගේ උපදේශකත්වය හිමිවූ අතර, එහි කණ්ඩායම් නායිකාව ලෙස කැනඩාවේ Tracey Martineau මහත්මිය කටයුතු කළාහ. ආර්ජන්ටිනාවේ Victor Manuel Nunez මහතා සහ නේපාලයේ Brigadier General Naresh Subba (Retd) අනෙකුත් විෂය ක්ෂේත්‍ර විශේෂඥයන් ලෙස කටයුතු කළහ.



# ස්කෝපියන් අභ්‍යාසය සාර්ථකව නිමකරමින්









කෙඩෙට් පාඨමාලා අංක 94B, කෙටිකාලීන පාඨමාලා අංක 23, ස්වේච්ඡා පාඨමාලා අංක 62, කාන්තා කෙඩෙට් නිලධාරිනි පාඨමාලා අංක 20 සහ ස්වේච්ඡා පාඨමාලා අංක 19 ට අයත් කෙඩෙට් නිලධාරීන් සහභාගි වූ ස්කෝපියන් අභ්‍යාසය ඉකුත් සැප්තැම්බර් මස 08 වන දින සිට 13 වන දින දක්වා වැල්ලවාය ප්‍රදේශයේදී පැවැත්විණ. සතියක් පුරා පැවති මෙම ක්ෂේත්‍ර අභ්‍යාසය එම කෙඩෙට් නිලධාරීන් හට අත්දැකීම් රාශියක් ලැබදුන් අවස්ථාවක් විය. ස්කෝපියන් අභ්‍යාසය යනු කෙඩෙට් පුහුණුවේ ප්‍රධාන ක්ෂේත්‍ර අභ්‍යාසයක් වන අතර, එය අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී අවස්ථාවලදී පුහුණුවීම් සහ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුවන්නන් දැනුම්වත් කිරීම සඳහා පවත්වනු ලැබේ. විශේෂයෙන් මර්මස්ථාන සහ වැදගත් පුද්ගලයින් තෝරා ගැනීම සහ ආරක්ෂා කිරීම, මාර්ග බාධක ස්ථාපිත කිරීම, නීතිවිරෝධි රැස්වීම් විසුරුවා හැරීම සහ වටලෑම පිළිබඳව මෙමඟින් දැනුම්වත් කෙරේ. එමෙන්ම සෝදිසි මෙහෙයුම් පැවැත්වීම සඳහා ප්‍රාදේශීය පොලීසියේ සහය ඇතිව අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම, සිදුවිය හැකි ප්‍රායෝගික අභියෝග සාර්ථකව ජයගැනීම පිළිබඳව පුහුණුවන්නන් දැනුම්වත් කිරීම ද ඊට අයත්ය.

මෙම පුහුණු අභ්‍යාසය ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ පුහුණු අංශයේ ප්‍රධාන උපදේශක, පුහුණු කණ්ඩායම් ප්‍රධානී සහ ජ්‍යෙෂ්ඨ උපදේශකයින්ගේ අධීක්ෂණය යටතේ පැවැත්වූ අතර, මෙම අවස්ථාව නැරඹීම සඳහා එම විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ඇතුළු පිරිසක් එක්වූහ.

# කොමිෂන් නොලත් නිලධාරි නායකත්ව සහ ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලාව සාර්ථකව අවසන්





අම්පාර සටන් පුහුණු පාසල මඟින් පවත්වන ලද කොමිෂන් නොලත් නිලධාරි නායකත්ව සහ ප්‍රගමන ප්‍රවර්ධන පාඨමාලා අංක - 61හි සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් සැප්තැම්බර් මස 16 වන දින එම පුහුණු පාසලේදී පවත්වනු ලැබීය. මාසයකට ආසන්න කාලයක් පැවති මෙම පාඨමාලාව සඳහා යුද්ධ හමුදාවේ විවිධ රෙජිමේන්තු නියෝජනය කරමින් කොමිෂන් නොලත් නිලධාරීන් 73 දෙනෙකු සහභාගි වූ අතර, එයින් 9 බළඇණිය ගැමුණු හේවා බලකායේ ලාන්ස් කෝප්‍රල් ගුණරත්න ඩීඑම්එල්එස් පාඨමාලාවේ දක්ෂතම ශිෂ්‍යයා ලෙස තේරී පත් විය. පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානෝත්සවයට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ අම්පාර සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ඒකේසීඑස් ද සිල්වා ආර්එස්පී එන්ඩීසී විසින් සමාප්ති දේශනය පවත්වන ලදී. මෙම උත්සව අවස්ථාවට එම පාඨමාලාවේ ප්‍රධාන උපදේශක, ජ්‍යෙෂ්ඨ නිලධාරිහු, නිලධාරිහු සහ සෙසුනිලයින් සහභාගි වූහ.

# දූෂණ විරෝධී පුහුණු වැඩසටහනක්





ශ්‍රී ලංකාවෙන් අල්ලස් හා දූෂණය තුරන් කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, ජනාධිපති ලේකම් කාර්යාලය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා අභ්‍යන්තර කටයුතු ඒකකය සමඟ එක්ව ඉකුත් සැප්තැම්බර් මස 12 වන දින යුද්ධ හමුදා මූලස්ථාන ශ්‍රවණාගාරයේදී එක්දින දූෂණ විරෝධී පුහුණු වැඩසටහනක් පවත්වනු ලැබීය. මේ සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ නිලධාරීන් සහ සෙසුනිලයින් 103ක් මෙන්ම Zoom තාක්ෂණය ඔස්සේ තවත් යුද්ධ හමුදා සාමාජික 1,800ක් පමණ සහභාගී වූහ.



මෙම පුහුණු වැඩසටහනේ ප්‍රධාන අමුත්තිය සහ දේශකවරියක් ලෙස සහභාගි වූ ජනාධිපති අතිරේක ලේකම් චන්දිමා වික්‍රමසිංහ මහත්මිය විසින් රාජ්‍ය ආයතන තුළ අල්ලස, දූෂණය සහ වංචාවෙන් තොරව, අවංක හා පිරිසිදු පාලනයක් ඇති කිරීමේදී අභ්‍යන්තර කටයුතු ඒකකවල වැදගත් කාර්යභාරය පිළිබඳව ප්‍රථම දේශනය පැවැත්වූවාය. ඉන් පසුව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ ජෙනරාල් තනුජා බණ්ඩාර මහත්මිය විසින් සිදුකරනු ලැබූ දේශනයේදී දූෂණයේ ස්වභාවය, ජාතික සම්පත් කෙරෙහි එහි බලපෑම සහ එවැනි අභියෝගවලට මුහුණ දීමේදී ජාත්‍යන්තර වශයෙන් භාවිතා කරනු ලබන ක්‍රමවේද පිළිබඳව පෙන්වා දුන්නාය. තවද, මෙරට නීති රාමුව, අල්ලස් හා දූෂණය පිටුදැකීමේ යාන්ත්‍රණ සහ අල්ලස් හා දූෂණයට එරෙහිව කටයුතු කිරීමේදී එම විමර්ශන කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල සහ වගකීම් පිළිබඳව ද දැනුම්වත් කරනු ලැබුවාය. මෙම පුහුණු වැඩසටහන මඟින් අල්ලස් හෝ දූෂණයෙන් තොර ශ්‍රී ලංකාවක් පිළිබඳ රජයේ දැක්ම සමඟ එක්ව කටයුතු කරමින් යුද්ධ හමුදා නිලධාරීන්ගේ වෘත්තීයභාවය, විනිවිදභාවය සහ සදාචාරාත්මක හැසිරීම වැඩි දියුණු කිරීමේ වැදගත් පියවරක් සනිටුහන් කළේය.

# රේගු ක්‍රියා පටිපාටිය පිළිබඳ දේශනයක්







සැලසුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද යුද්ධ හමුදා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ රේගු ක්‍රියා පටිපාටිය පිළිබඳ විශේෂ දේශනයක් ඉකුත් සැප්තැම්බර් මස 30 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණ.

රේගු නියෝජ්‍ය අධ්‍යක්ෂ මිහිරාජ් අබ්දුල්ලා මහතා විසින් මෙම දේශනය පවත්වන ලද අතර, එහිදී යුද්ධ හමුදා ප්‍රසම්පාදන ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා අත්‍යවශ්‍ය රේගු රෙගුලාසි සහ ක්‍රියා පටිපාටීන්හි ප්‍රායෝගික අංශ කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම දේශනය සඳහා නිලධාරිහු සහ සෙසුනිලයින් 150කට වැඩි පිරිසක් සහභාගී වූහ.

# දිවි නොතකා දිවි බේරූ රණවිරුවාට යුද්ධ හමුදාධිපතිගෙන් පැසසුම්



ඇල්ල-වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ රාවණා ඇල්ල අසළ ඉකුත් සැප්තැම්බර් මස 04 දින සන්ධ්‍යාවේ සිදු වූ බස්රථ අනතුරෙන් තුවාලලත් මගීන් තිදෙනෙකු බේරා ගනිමින් 2 වන විශේෂ බලකායේ කෝප්‍රල් බණ්ඩාර ඩබ්ලිව්එම්වීඑම් විසින් සිදුකළ එම නිර්භීත ක්‍රියාව යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී විසින් 2025 සැප්තැම්බර් මස 16 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී ඇගයීමට ලක්කරන ලදී.

මෙහි ඇති විශේෂත්වය වූයේ එම කොනොනි රාජකාරියෙන් බැහැරව නිවාඩු ලබාසිටියදී මෙම ක්‍රියාව සිදුකිරීම හා එම ජීවිත ගලවා ගැනීමේ කටයුතුවල යෙදී සිටියදී ඔහුගේ හිසට බරපතල තුවාල සිදු වුවද ඒ ගැන පවා නොතකා ඔහු ඊට මැදිහත්වීමය. එම නිර්භීත ක්‍රියාව වෙනුවෙන් තත් කොමිෂන් නොලත් නිලධාරි ලාන්ස් කෝප්‍රල් නිලයේ සිට කෝප්‍රල් නිලය දක්වා උසස් කරන ලද අතර, ඔහුගේ එඩිතරකම අගය කළ යුද්ධ හමුදාධිපතිතුමන් ඔහු වෙත මූල්‍ය පරිත්‍යාගයක් ද ප්‍රදානය කළේය. තවද, ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමයේ ලේකම් ලුතිනන් කර්නල් අජිත් සියඹලාපිටිය (විශ්‍රාමික) විසින් ද කෝප්‍රල් බණ්ඩාරගේ එම නිර්භීත ක්‍රියාව සහ කැපවීම අගය කරමින් මූල්‍ය පරිත්‍යාගයක් සිදුකරන ලදී.




# වීරෝදාර විරුවන්ට ආඥාපතිගෙන් පැසසුම්



මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති විසින් ලාන්ස් කෝප්‍රල් බණ්ඩාර ඩබ්ලිව්එම්වීඑම් වෙත සුබ පැතුම් එක්කරමින්

ඇල්ල - වැල්ලවාය ප්‍රධාන මාර්ගයේ සිදුවූ බස් රථ අනතුරේදී ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුම් කටයුතුවල නියැලී සිටි යුද්ධ හමුදා භටපිරිස්හි නිර්භීත ක්‍රියාව මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ ද ඇගයීමට ලක්විය. ඉකුත් සැප්තැම්බර් මස 13 වන දින එම ආරක්ෂක සේනා මූලස්ථානයේදී ඒ නිමිත්තෙන් සංවිධානය කෙරුණු ඇගයීමේ වැඩසටහනේදී ආඥාපති විසින් එම යුද්ධ හමුදා භටපිරිස් ආමන්ත්‍රණය කරමින් එවැනි ව්‍යසනකාරී අවස්ථාවන්හිදී ජනතාවට සහාය වීමේ සමාජ වගකීම අවධාරණය කළේය.

අදාළ සිදුවීම සැලවීමත් සමගම අනතුරට පත් එම බස් රථයේ මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා විජයබාහු පාබල රෙජිමේන්තුව, ගැමුණු හේවා බලකාය සහ කමාන්ඩෝ රෙජිමේන්තුවට අයත් යුද්ධ හමුදා සාමාජිකයින් 200කට අධික පිරිසක් සහභාගී වූහ. බස් රථය මීටර් සිය ගණනක ප්‍රපාතයකට පෙරළි ගොස් තිබූ හෙයින් එහි සිටි පුද්ගලයින් මුදවාගැනීමේ මෙහෙයුම් අතිශය දුෂ්කර විය. එහිදී, කමාන්ඩෝ රෙජිමේන්තු විශේෂඥ කණ්ඩායම් කඹ ආධාරයෙන් එම ප්‍රපාතයට බැස විවිධ මුදවාගැනීමේ ශිල්පීය ක්‍රම භාවිතා කරමින් අනතුරට පත් මගීන් ආරක්ෂිත ස්ථානයක් වෙත රැගෙන ඒමට කටයුතු කරනු ලැබූහ. එහිදී, මුදවාගත් පුද්ගලයින් හදිසි වෛද්‍ය ප්‍රතිකාර කටයුතු සඳහා කඩිනමින් ගිලන් රථ මඟින් බදුල්ල, බණ්ඩාරවෙල සහ දියතලාව රෝහල් වෙත මාරු කර යවන අතරේ තවදුරටත් මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා යුද්ධ හමුදාව අඛණ්ඩව සිය දායකත්වය ලබාදෙනු ලැබීය. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ උපදෙස් මත 112 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් බීඒඩීඑන්කේ බුලත්සිංහල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී සමඟ ඒකකවල අණදෙන නිලධාරීන් මෙම මෙහෙයුම් කටයුතු සඳහා සාමූහිකව එක්වූහ.

# 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ ප්‍රථම උපකරණ පරීක්ෂාව

16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම ඉකුත් ජූලි මස 04 දින සිය රාජකාරීන් භාරගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ ප්‍රථම මෙන්ම මෙම වසරේ තෙවන කාර්තුව සඳහා වන උපකරණ පරීක්‍ෂාව ඉකුත් සැප්තැම්බර් මස 04 වන දින සිදුකරනු ලැබීය. නිලධාරීන් 18 දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් විසින් නාකියුරාහි ස්ථාපිත එම කඳවුරේදී මෙම වසරේ තෙවන කාර්තුව සඳහා පරීක්‍ෂාව සිදුකරනු ලැබූහ.



පරීක්ෂණය අවසානයේදී ලෙබනනයේ එක්සත් ජාතීන්ගේ අතුරු බලකා මූලස්ථානයේ නිලධාරීන් විසින් කිසිදු නිරීක්ෂණයක් ඉදිරිපත් නොකරමින් එම කණ්ඩායම සතු මෙහෙයුම් සූදානම සහ උපකරණ නඩත්තුව පිළිබඳ ඉහළ ප්‍රමිතියක් ලබාදෙමින් එම කණ්ඩායම ඇගයීමට ලක්කිරීම විශේෂය.






# ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ අණදෙන නිලධාරි ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති හමුවෙයි



නාකියුරාහි ස්ථාපිත 16 වන ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායමේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් වයිඑස්එච්එන්පී සිල්වා යූඑස්පී පීඑස්සී ඉකුත් අගෝස්තු මස 29 වන දින බේරූට් හි තානාපති කාර්යාලයේදී ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කපිල ජයවීර මහතා හමුවිය.

එහිදී, එක්සත් ජාතීන්ගේ සාම සාධක කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ දායකත්වය සහ ලෙබනනයේ ශ්‍රී ලංකා හමුදා ආරක්ෂක භට කණ්ඩායම හිමිකර ගෙන ඇති කීර්තිය පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය.

# යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ලබන සාමාජිකයන් සඳහා එක් දින වැඩසටහනක්







රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංවිධානය කළ "යුද්ධ හමුදා සේවයෙන් ඔබ්බට ජීවිතයක් සඳහා සෙසුනිලයින් බලගැන්වීම" යන මැයෙන් වූ එක්දින වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 09 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ.

මේ යටතේ නුදුරේදී යුද්ධ හමුදාවෙන් විශ්‍රාම ලබන සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණය, මුදල් ඉතිරි කිරීම, නව ආයෝජන අවස්ථා, ව්‍යවසායකත්වය සහ විශ්‍රාම දිවිය තුළදී මුහුණු දීමට සිදුවන සමාජීය හා මානසික අභියෝග ආදිය පිළිබඳ දැනුවත් කෙරේ. එම විෂයන් පිළිබඳව හසල දැනුමක් ඇති ආරාධිත දේශකයින් විසින් එම දේශන පවත්වනු ලැබූහ.

වැඩසටහන් අවසානයේදී මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස එක්වූ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් විසින් ඔවුන් වෙත සහතිකපත්‍ර ප්‍රදානය කරනු ලැබූහ. උත්සවය අවසානයේදී යුද්ධ හමුදාධිපති විසින් සභාව අමතමින් විශ්‍රාමික ජීවිතය සඳහා සූදානම් වීමේ වැදගත්කම පිළිබඳව ද අවධාරණය කළේය.







## විශ්‍රාමික සහ රණක්ෂිතයට පත් විරුවන් වෙනුවෙන්

# බහුවිධ සායනයක්







යුද්ධ හමුදාධිපතිගේ මඟපෙන්වීම යටතේ, රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය එක්ව සංවිධානය කළ බහුවිධ වෛද්‍ය සායන කඳවුරක් ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින අම්පාර සටන් පුහුණු පාසලේදී පැවැත්විණ. නැගෙනහිර ප්‍රදේශයේ පදිංචි රණවිරුවන්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් එම ප්‍රදේශයේ රණක්ෂිතයට පත් විශ්‍රාමික හමුදා සාමාජිකයන් සහ එම පවුල්වල සාමාජිකයින් සඳහා මෙම කඳවුර වෙන්විය.

එහිදී, නැගෙනහිර ආරක්ෂක සේනා ආඥාපති - මේජර් ජෙනරාල් ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ උණුසුම් පිළිගැනුම් මධ්‍යයේ මෙම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගී විය.

මෙම වෛද්‍ය සායනය අතරතුරදී, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සම්බන්ධීකරණයෙන් රෝද පුටු 20ක්, කිහිලිකරු 69ක්, වෝකර් යන්ත්‍රයක් සහ වෛද්‍ය උපකරණ තොගයක් රණක්ෂිතයට පත් රණවිරුවන් වෙත ප්‍රදානය කිරීම ද සිදුවිය. මෙම වැඩසටහන මඟින් ආබාධිත, විශ්‍රාමික, වෛද්‍ය හේතූන්මත ඉවත් වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුළු 1250කට අධික සංඛ්‍යාවක් සඳහා වෛද්‍ය උපදේශන සේවා, කෘත්‍රිම අවයව නඩත්තු කිරීම, චර්ම රෝග සහ දන්ත සායන, මානසික සෞඛ්‍ය උපදේශන සේවා සහ පෝෂණ උපදේශන සේවා සැපයිණ.

# මිහිඳු සෙත් මැදුරේදී රෝද පුටු පරිත්‍යාගයක්



දිවංගත ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව පදනම සහ රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය එක්ව ඉකුත් සැප්තැම්බර් මස 13 වන දින මිහිඳු සෙත් මැදුර සුවතා නිකේතනයේදී විශේෂ රෝද පුටු පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පවත්වනු ලැබීය. යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී ප්‍රධානත්වය දැරූ මෙම අවස්ථාවට යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මිය, කොබ්බෑකඩුව පදනමේ නිර්මාතෘ කොබ්බෑකඩුව මහත්මිය සහභාගී වූහ. එහිදී, එම රණවිරුවන්ගේ ප්‍රයෝජනය සඳහා රෝද පුටු 56ක් නිල වශයෙන් පරිත්‍යාග කෙරිණ.



# කලා හා සාහිත්‍ය තරඟාවලියේ සහතිකපත් ප්‍රදානෝත්සවය





රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් සංවිධානය කරනු ලැබූ කලා හා සාහිත්‍ය තරඟාවලියේ සහතිකපත් ප්‍රදානෝත්සවය ඉකුත් සැප්තැම්බර් මස 04 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී පැවැත්විණි. රණවිරු සේවා හා පුනරුත්ථාපන අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජීඑස්ආර් විජේදාස ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ගේ ඇරයුමෙන් මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ස්වෙන්ද්‍රිනි දිසානායක මහත්මිය සහභාගි වූහ.

"Clean Sri lanka" ව්‍යාපෘතියේ තවත් අදියරක් ලෙස යුද්ධ හමුදා සුවතා නිකේතනයන්හි ප්‍රතිකාර ලබන රණවිරුවන්, යුද ප්‍රවීණයන්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහ මව්බිමේ ඒකීයභාවය වෙනුවෙන් දිවිපිදූ වීරෝදාර රණවිරුවන්ගේ දූවා දරුවන් වෙනුවෙන් මෙම තරඟාවලිය පැවැත්විණි. සහභාගිවූවන්ගේ දක්ෂතා හඳුනාගැනීම, කලාත්මක හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ ආත්ම විශ්වාසය ගොඩනැංවීම මෙහි අරමුණ විය. උත්සවයට එක්වූ ප්‍රධාන ආරාධිතයා සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් විසින් තරඟ ජයග්‍රාහකයින් 47 දෙනෙක් වෙනුවෙන් පදක්කම් සහ සහතිකපත් ප්‍රදානය කරනු ලැබූහ.



> "එදා රට වෙනුවෙන් තම ජීවිත කැපකළ රණවිරුවන්ම මෙදා අන් ජීවිත සුරැකීම උදෙසා ද තම රුධිරය දන්දෙන්නේ ඔවුන් වචනයේ පරිසමාප්තියෙන්ම දේශයේ මුර දේවතාවුන් බැව් කියාපාමිනි."

# ජන දිවි රකින මෙහෙයට විරු රුහිරු පුද දී

122 වන පාබල බලසේනාව යටතේ ඇති 12 බළඇණිය ගජබා රෙජිමේන්තුවේ සහ 3 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ භටපිරිස් එකතුව ඉකුත් සැප්තැම්බර් මස 11 වන දින "Double Tree by Hilton" වීරවිල රාජවර්ණ නිවාඩු නිකේතනයේදී රුධිර පරිත්‍යාග වැඩසටහනක් පවත්වනු ලැබූහ. මේ සඳහා රණවිරුවෝ රැසක් ස්වේච්ඡාවෙන්ම තම රුධිරය පරිත්‍යාග කළහ.







5 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ භටපිරිස් එකතුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ සහයෝගය ඇතිව ඉකුත් සැප්තැම්බර් මස 04 වන දින මොල්ලිපතාන, අග්‍රබෝධි විහාරස්ථානයේදී රුධිර පරිත්‍යාග වැඩසටහනක් පවත්වනු ලැබූහ. මෙම වැඩසටහන සඳහා නිලධාරීන්, සෙසුනිලයින් සහ ප්‍රදේශවාසීහු විශාල පිරිසක් ද සහභාගි වූහ.

පලාලි යුද්ධ හමුදා රෝහල විසින් යාපනය ශික්ෂණ රෝහලේ රුධිර බැංකුව සමඟ එක්ව ඉකුත් සැප්තැම්බර් මස 20 වන දින රුධිර පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. යාපනය ආරක්ෂක සේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ පැවති මෙම වැඩසටහනේදී නිලධාරිහු 10 දෙනකු සහ සෙසුනිලයින් 84 දෙනකු ස්වේච්ඡාවෙන් සිය රුධිරය පරිත්‍යාග කළහ.







# ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිතුමිය යුද්ධ හමුදා විද්‍යාපීඨයේ නිල සංචාරයක

ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනි අතිගරු ජූලි චුන්ග් මහත්මිය ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ නිල සංචාරයක නිරත වූවාය. එහිදී, එම විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිජී විසින් එතුමියව මහත් ගෞරවයෙන් පිළිගනු ලැබීය.

මෙම සංචාරය අතරතුර, තානාපතිතුමිය විසින් ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ යුද්ධ හමුදා නිලධාරීන් පුහුණු කිරීම සඳහා පවතින පහසුකම් නිරීක්ෂණ කළාය. පසුව කෙඩෙට් නිලධාරි භෝජනාගාරයේ පැවති තේ පැන් සංග්‍රහයක් සඳහා සහභාගි වූ එතුමිය කෙඩෙට් නිලධාරීන් සහ උපදේශකයින් සමඟින් සුහද කථා බහක ද නිරත වූවාය. තවද, සේනාවිධායක විසින් තානාපතිතුමිය වෙත සමරු තිළිණයක් ප්‍රදානය කළ අතර, එහිදී එතුමිය විසින් ද විද්‍යාපීඨ පුස්තකාලය වෙත වටිනා පොත් පරිත්‍යාගයක් ද සිදු කළාය.





# ඉන්දීය හමුදා දූත පිරිසක් යුද්ධ හමුදා විද්‍යාපීඨයේ නිල සංචාරයක






ඉන්දීය යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් Lieutenant General R.S Raman PVSM AVSM YSM ඇතුළු දූත පිරිසක් ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ නිල සංචාරයක නිරත වූහ. ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨයේ සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ජේආර්එස් මැදගොඩ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී අයිජී විසින් පැමිණි දූත පිරිස පිළිගනු ලැබීය. අනතුරුව, ඔවුන් සමඟ පැවති සුහද සාකච්ඡාවකින් පසුව, එම අවස්ථාව සනිටුහන් කිරීම වස් සමරු තිළිණ හුවමාරුවක් ද සිදුවිය. පිරිස යුද්ධ හමුදා විද්‍යාපීඨය වෙතින් නික්ම යාමට පෙර එම විද්‍යාපීඨයේ පුස්තකාලය, ව්‍යායාම ශාලාව සහ කෙඩෙට් නිලධාරි භෝජනාගාරය ඇතුළු ප්‍රධාන පහසුකම් ද නිරීක්ෂණය කළහ.

# 54 වන පාබල සේනාංකයේ අභිමානවත් සංවත්සරය





54 වන පාබල සේනාංකයේ 15 වන සංවත්සරය ඉකුත් සැප්තැම්බර් මස 10 වන දින එම මූලස්ථානයේදී අභිමානවත් අයුරින් සැමරිණ. එහිදී, එම සේනාංකයේ භටපිරිස් විසින් සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්සී අබේකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී වෙත කඳවුරු මුරයේ සහ සම්මාන මුරයේ ගෞරවාචාර පිරිනමනු ලැබූහ. අනතුරුව සේනාංකාධිපති විසින් භටපිරිස් ඇමතීමට ද කටයුතු කරන ලදී. තවද, සියලු නිල දිවා භෝජන සංග්‍රහය ද සන්ධ්‍යාවේදී පැවති සංගීත ප්‍රසංගය ද එම සංවත්සර කටයුතු තවදුරටත් වර්ණවත් කරලීය. සංවත්සරය නිමිත්තෙන් සේනාංකය යටතේ සේවය කරනු ලබන යුද්ධ හමුදා සාමාජිකයින් වෙත ආශිර්වාද පතා ඉකුත් සැප්තැම්බර් මස 05 වන දින මන්නාරමේ පිහිටි තිරුකේතීස්වරම් කෝවිලේදී මෙන්ම ඉස්ලාම් පල්ලියේදී සහ ක්‍රිස්තියානි පල්ලියේදී ආගමික වතාවත් ද පැවැත්විණ.

එසේම, ඉකුත් සැප්තැම්බර් මස 07 වන දින තන්තිරිමලේ රජමහා විහාරස්ථානයේදී සිල් සමාදන් වූ බැතිමතුන් වෙනුවෙන් දානය පිරිනමන ලද අතර, එදින විහාරස්ථාන පරිශ්‍රයේ කිරිබත් දන්සැලක් ද පවත්වනු ලැබීය. තවද, මනු වෙහෙර විහාරස්ථානයේදී බෝධි පූජා පිංකමක් ද පැවැත්විණ. තවද, ඉකුත් අගෝස්තු මස 26 වන දින සිට සැප්තැම්බර් මස 08 වන දින දක්වා පැවති ක්‍රීඩා තරඟාවලියක් ද වැඩසටහන් අතරට අයත් විය.

# කිංග්ස්වුඩ් විද්‍යාලයේ වාර්ෂික රණවිරු උපහාර උළෙල උත්සවාකාරයෙන්



ඉකුත් සැප්තැම්බර් මස 12 වන දින මහනුවර, කිංග්ස්වුඩ් විද්‍යාලයේ පැවති වාර්ෂික රණවිරු උපහාර උළෙල සහ කෙඩෙට් දිනය සැමරීමේ උත්සවයට ප්‍රධාන ආරාධිතයා ලෙස 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ටීසීඑම්ජීඑස්ටී කුරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.



එහිදී, පාසල් කෙඩෙට් කණ්ඩායම විසින් එතුමන් වෙත ගෞරවාචාර පිරිනැමූ අතර, මෙම අවස්ථාවට එම විද්‍යාලයට අයත් ජ්‍යෙෂ්ඨ ත්‍රිවිධ හමුදා නිලධාරිහු, පොලිස් නිලධාරීන්, ආදි ශිෂ්‍යයින්, දෙමාපියන් රැසක් ද එක්වූහ.

# නවීන තාක්ෂණයෙන් බලගැන්වෙන නව කිරි සැකසුම් ඒකකයක් සහ පිසනිමි ආහාර ඒකකයක්



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය විසින් කන්දකාඩු ගොවිපලෙහි ඉදිකරන ලද නව කිරි සැකසුම් ඒකකය සහ නවීකරණය කරන ලද පිසනිමි ආහාර කර්මාන්ත ශාලාව කෘෂිකර්ම හා පශු සම්පත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂ බ්‍රිගේඩියර් බීඑන් මදනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ඉකුත් සැප්තැම්බර් මස 17 වන දින විවෘත කරන ලදී.

මේ හරහා කිරි ආශ්‍රිත නිෂ්පාදන වැඩි වශයෙන් වෙළෙඳ පොළට එක්කිරීමත් යුද්ධ හමුදාව තුළ කිරි පරිභෝජනය ඉහළ නැංවීමත් අරමුණු වේ. මෙම ව්‍යාපෘතිය හරහා සිදුකෙරෙන නිෂ්පාදන සේවා වනිතා ඒකක මඟින් පාලනය වන වෙළඳසැල් මෙන්ම යුද්ධ හමුදා සුබසාධන වෙළඳසැල්වලට බෙදාහරිනු ලබයි. මෙහිදී, ලබාගන්නා දියර කිරි ඇසුරුම් කර චොකලට් හා වැනිලා රසයෙන් දිනකට බෝතල් 600ත් 1000ත් අතර ප්‍රමාණයක් වෙළඳ පොළට නිකුත් කරනු ලබයි. තවද, එළු කිරි ආශ්‍රිත නිෂ්පාදනයන් ද නව කිරි සැපයුම් ඒකකය මඟින් ලබාදෙනු ඇත.







එමෙන්ම, එහි නවීකරණය කරන ලද පිසනිමි ආහාර ඒකකයෙන් යුද්ධ හමුදාවට පමණක් නොව නාවික හමුදාවට ද අවශ්‍ය ප්‍රධාන ආහාර වේල් තුනම ආවරණය වන කැළෑ සලාක ආහාර මළු ලබාදීමට කටයුතු කර ඇත. ඒ හරහා මෙතෙක් විදේශ රටවල නිෂ්පාදිත එම සලාක මළුවලට වැයවූ විශාල මුදලක් ඉතිරිකර ගැනීමට හැකියාව ලැබීම සුවිශේෂී කරුණකි.





# යුද්ධ හමුදාධිපති කුසලාන ගොල්ෆ් තරඟාවලිය - 2025

යුද්ධ හමුදාධිපති කුසලාන ගොල්ෆ් තරඟාවලිය වසර හයකට පසු ඉකුත් සැප්තැම්බර් මස 27 වන දින දියතලාව ගොල්ෆ් පිටියේදී පැවැත්විණි. මධ්‍යම ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී ගේ ඇරයුමෙන් මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහභාගී විය.





ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨයේ සේනාවිධායක සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ගොල්ෆ් කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් එම්ජේආර්එස් මැදගොඩ යූඑස්පී එන්ඩීසී පීඑස්සී අයිජී ගේ පිළිගැනීමේ කතාවෙන් උත්සවය ආරම්භ විය. අනතුරුව, ප්‍රධාන ආරාධිතයා විසින් ගොල්ෆ් පන්දුවට පහර දීමෙන් තරඟාවලිය නිල වශයෙන් ආරම්භ විය. ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග සහ සහතික පත් පිරිනැමීම යුද්ධ හමුදාධිපති සහ අනෙකුත් සම්භාවනීය අමුත්තන් අතින් සිදුවූ අතර, උත්සවයේ සමාප්ති දේශනය යුද්ධ හමුදාධිපති විසින් සිදුකරන ලදී.

# ලෝක මලල ක්‍රීඩා ශූරතාවලියට තේරී පත්වූ යුද්ධ හමුදා සාමාජිකයන්




IAAF ලෝක මලල ක්‍රීඩා ශූරතා තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට, මීටර් 400 ධාවන ඉසව්වේ ජාතික ශූරිය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ මාණ්ඩලික සැරයන් නදීශා ආර් තේරීපත්ව ඇත. මෙවර ලෝක ශූරතා තරඟාවලියට සුදුසුකම් ලැබූ එකම ශ්‍රී ලාංකික මලල ක්‍රීඩිකාව වන ඇය සැප්තැම්බර් මස 13 සිට 21 වන දින දක්වා ජපානයේ ටෝකියෝ නුවර දී තරඟ වැදීමට නියමිතය. එසේම, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ කෝප්‍රල් රණසිංහ ආර්ජේඑස්ජේ ද මෙම තරඟාවලියේ පිරිමි හෙල්ල විසිකිරීමේ ඉසව්ව සඳහා තරඟ කිරීමට සුදුසුකම් ලබා ඇත. ඔහුනගේ නිසැක ජයග්‍රහණ සඳහා "රණවිරුවා" ද මෙලෙස සුබ පැතුම් එක්කරයි.









# අන්තර් රෙජිමේන්තු පාපැදි තරඟාවලිය



යුද්ධ හමුදා පාපැදි කමිටුව විසින් සංවිධානය කළ ශ්‍රී ලංකා යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු පාපැදි තරඟාවලිය ඉකුත් අගෝස්තු මස 28 සහ 29 යන දෙදින තුළ උඩවලවේදී උත්කර්ෂවත්ව පැවැත්විණ. රෙජිමේන්තු 12ක් නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 118 දෙනක් සහභාගී වූ මෙම තරඟාවලියට ප්‍රධාන ආරාධිතයා වශයෙන් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාධිපති, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යක්ෂ ජෙනරාල් සහ යුද්ධ හමුදා පාපැදි කමිටු සභාපති මේජර් ජෙනරාල් සී කලුතරආරච්චි සහභාගී විය.

කේවල කාලය මැනීමේ ස්ටෑන්ඩඩ්/ රේසිං, මාර්ග පාපැදි ස්ටෑන්ඩඩ්/ රේසිං, අවු 45 ට වැඩි රේසිං සහ කාන්තා මාර්ග තරඟය ස්ටෑන්ඩඩ් යන ඉසව්වලින් සමන්විත විය. එහිදී තරඟාවලියේ ශූරතාව ලකුණු 95 ක් ලබා ගනිමින් ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකාය විසින් හිමිකරගත් අතර, ලකුණු 43 ක් හිමිකරගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය එහි අනු ශූරතාව හිමි කරගත්තේය. රේසිං මාර්ග පාපැදි තරඟය පිරිමි ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ සෙ/632212 කාසෙ පෙරේරා ඒඩීඑස් විසින් හිමිකරගත් අතර, ස්ටෑන්ඩඩ් පාපැදි තරඟයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකායේ සෙ/කේ100872 ලා/කෝ මදුෂාන් ජීසී විසින් හිමි කර ගන්නා ලදි. කාන්තා ස්ටෑන්ඩඩ් මාර්ග පාපැදි තරඟයේ ප්‍රථම ස්ථානය ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ සෙ/ආර්102014 කෝප්‍රල් කුමාරසිංහ යුළුන් ක්‍රීඩිකාව හිමිකර ගත්තාය.

# පොදුරාජ්‍ය මණ්ඩලීය වෙරළ අත්පන්දු ශූරතාවලිය

පොදුරාජ්‍ය මණ්ඩලීය වෙරළ අත්පන්දු ශූරතාවලිය ඉකුත් සැප්තැම්බර් මස 18 වන දින සිට 22 වන දින දක්වා මාලදිවයිනේ පැවති අතර, ඒ සඳහා සහභාගී වූ ශ්‍රී ලංකා ජාතික පිරිමි වෙරළ අත්පන්දු කණ්ඩායම විසින් රිදී පදක්කම දිනාගන්නා ලදී.







ශ්‍රී ලංකාව, පාකිස්ථානය, මාලදිවයින, බංග්ලාදේශය, ඉන්දියාව සහ දකුණු අප්‍රිකාව ඇතුළු රටවල් හයක් නියෝජනය කරමින් කණ්ඩායම් මෙම ඉසව්වට සහභාගි වූහ. අවසන් පූර්ව තරඟයේදී ශ්‍රී ලංකා කණ්ඩායම සත්කාරක මාලදිවයින් කණ්ඩායම පරාජය කරමින් අවසන් මහා තරගයට සුදුසුකම් ලැබීය. අවසන් තරඟය ශ්‍රී ලංකා කණ්ඩායම සහ පාකිස්ථාන කණ්ඩායම අතර පැවති අතර, එහිදී පාකිස්ථාන කණ්ඩායම 26ට 18ක් සහ 28ට 18ක් ලෙස ලකුණු ලබාගනිමින් ජයග්‍රහණය හිමිකර ගත්තේය. මෙම තරඟාවලියේදී ශ්‍රී ලංකා කණ්ඩායම ලබාගත් රිදී පදක්කම පොදුරාජ්‍ය මණ්ඩලීය වෙරළ අත්පන්දු ක්‍රීඩාවෙන් ලබාගත් පළමු ජාත්‍යන්තර පදක්කම ද වේ.

# යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු මල්ලවපොර තරඟාවලිය - 2025






"යුද්ධ හමුදා අන්තර් රෙජිමේන්තු මල්ලවපොර තරඟාවලිය - 2025" පනාගොඩ, යුද්ධ හමුදා ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් සැප්තැම්බර් මස 01, 02 සහ 03 යන දිනයන්හිදී පැවැත්විණි. ඒ සඳහා රෙජිමේන්තු 10ක් නියෝජනය කරමින් සහභාගි වූ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 120කට වැඩි පිරිසක් තම දක්ෂතා, විනය සහ ක්‍රීඩාශීලීත්වය පෙන්නුම් කළහ. තරඟාවලියේ සමාප්ති උත්සව අවස්ථාවට ප්‍රධාන ආරාධිතයා ලෙස 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා මල්ලවපොර කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඒඑම්සී අබේකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී සහභාගි විය. තරඟාවලියේදී ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු කණ්ඩායම විසින් ලකුණු 31ක් ලබා ගනිමින් පිරිමි අංශයේ ශූරතාවය දිනාගත් අතර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු කණ්ඩායම ලකුණු 23.5ක් ලබා ගනිමින් එම අංශයේ අනුශූරතාවය හිමිකර ගත්තේය.

එසේම, 3(ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම ලකුණු 17ක් ලබා ගනිමින් කාන්තා අංශයේ ශූරතාවය ද 2(ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා කණ්ඩායම ලකුණු 10ක් ලබා ගනිමින් අනුශූරතාවය ද හිමිකරගත්හ. තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ ලාන්ස් කෝප්‍රල් චන්ද්‍රසේකර එච්පීටීපී හිමිකරගත් අතර, පරාජිත ක්‍රීඩකයා වූයේ ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ප්‍රේමරත්න ජීජ්ජීඑම්ය.

# ආරක්ෂක සේවා යතුරුපැදි තරඟාවලියේ සමස්ත ශූරතාව යුද්ධ හමුදාවට










13 වන ආරක්ෂක සේවා යතුරුපැදි ශූරතාවලිය ඉකුත් සැප්තැම්බර් මස 11 වන දින සාලියපුර ගජබා රෙජිමේන්තු සුපර් ක්‍රොස් ධාවන පථයේදී පැවති අතර, එම තරඟාවලියේ සමස්ත ශූරතාව යුද්ධ හමුදාවට හිමිවිය. මේ සඳහා ඉසව් පහක් ඇතුළත් වූ අතර, ඊට යුද්ධ හමුදාවේ රෙජිමේන්තු 11ක් නියෝජනය කරමින් යතුරුපැදි ධාවකයින් 18 දෙනෙක් සහභාගි වූහ. එහිදී, ඔවුහු රන් පදක්කම් පහක්, රිදී පදක්කම් පහක් සහ ලෝකඩ පදක්කම් දෙකක් ඇතුළුව පදක්කම් 12ක් දිනාගැනීමට සමත්වූහ.

තරඟාවලියේ MX 125cc සහ MX 250cc යන ධාවන කාණ්ඩ දෙකෙහිම පළමු ස්ථානයන් ලබාගත් ශ්‍රී ලංකා කාලතුවක්කු රෙජිමේන්තුවේ තුවක්කු සෙබළ කුමාර ටීඑන් ශූරතාවලියේ දක්ෂතම යතුරුපැදි ධාවකයා ලෙස සම්මාන ලැබීය. සහතිකපත්‍ර ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී සහභාගි විය.





# අන්තර් මාධ්‍ය මුෂ්ඨි ප්‍රහාරක ශූරතාවලිය 2025



ශ්‍රී ලංකා බොක්සිං සංගමය මගින් සංවිධානය කරන ලද "අන්තර් මාධ්‍ය මුෂ්ඨි ප්‍රහාරක තරගාවලිය - 2025" කොළඹ රාජකීය විද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඉකුත් අගෝස්තු මස 18 සිට 21 වන දින දක්වා පැවැත්විණ. මෙම තරගාවලිය සඳහා ක්‍රීඩා සමාජ 20ක් නියෝජනය කරමින් ක්‍රීඩකයන් 85 දෙනෙක් සහ ක්‍රීඩිකාවෝ 36 දෙනෙක් සහභාගි වූහ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුෂ්ඨි ප්‍රහාරක කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් පීකේඩබ්ලිව්ඩබ්ලිව්එම්ජේඑස්බීඩබ්ලිව් පල්ලේකුඹුර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ තරග වැදුණු යුද්ධ හමුදා පිරිමි කණ්ඩායම, බර පන්ති 10ක් යටතේ රන් පදක්කම් 5ක්, රිදී පදක්කම් 4ක් සහ ලෝකඩ පදක්කම් 4ක් දිනාගනිමින් සමස්ත පදක්කම් සටහනේ පළමු ස්ථානයට පත්වීමට සමත්විය. එසේම, 7 ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකායේ ලාන්ස් කෝප්‍රල් විරාජනී පීඑච්අයි කිලෝග්‍රෑම් 54ට අඩු කාන්තා පන්තියේ රන් පදක්කම දිනාගත් අතර, ඇය තරගාවලියේ හොඳම කාන්තා ක්‍රීඩිකාව ලෙස ද සම්මානයට පාත්‍ර වූවාය.

# ශ්‍රී ලංකා යුද්ධ හමුදා බර ඉසිලීමේ කණ්ඩායම දිවයිනට



පොදුරාජ්‍ය මණ්ඩලීය බර ඉසිලීමේ ශූරතාවලිය - 2025 ඉකුත් අගෝස්තු මස 24 සිට 28 වන දින දක්වා ඉන්දියාවේ අහමාද්බාද් නගරයේදී පැවැත්විණ. එහිදී, යුද්ධ හමුදාවට සහ ජාතියට අභිමානයක් එක් කරමින්, කිලෝග්‍රෑම් 60 බර පන්තියෙන් ලෝකඩ පදක්කම දිනාගැනීමට 2 (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ සැරයන් කුමාර වයිඩීඅයි ඇතුළු ජාතික බර ඉසිලීමේ කණ්ඩායම සමත්විය. තරගාවලියෙන් අනතුරුව ඔවුන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළින් පසුගියදා දිවයිනට පැමිණි අතර, එහිදී කණ්ඩායම් කළමනාකරු, පුහුණුකරු සහ සෙසු සාමාජිකයන් විසින් ඔවුන්ව උණුසුම් ලෙස පිළිගනු ලැබූහ.

# වන්නි හා බටහිර ආරක්ෂක සේනා බලප්‍රදේශයන්හි ජනතාවට සේවා රැසක්





යුද්ධ හමුදාව විසින් ඉකුත් සැප්තැම්බර් මස 05 වන දින වන්නි දිස්ත්‍රික්කයේ තෙන්නියන්කුලම් සහ උයිලන්කුලම් යන ගම්මානවල ග්‍රාමීය ජනතාව නඟාසිටුවීම සඳහා මානුෂීය වැඩසටහනක් පවත්වන ලදී. ජනාධිපති නීතිඥ බ්‍රිගේඩියර් ආර්ඩීඕ පතිරණගේ සහ එම පවුලේ සාමාජිකයන් ඒ සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූහ.

වන්නි ආරක්ෂක සේනා ආඥාපති මේජර් ජෙනරාල් කේඑම්පීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන මඟින් පවුල් 300කට ආසන්න සංඛ්‍යාවකට නොමිලේ පිරිසිදු පානීය ජලය සපයන ජල පිරිපහදු යන්ත්‍රයක් පරිත්‍යාග කරනු ලැබීය. එමඟින් එම ප්‍රදේශයේ ජනතාවට ජලය මිලදී ගැනීමට වැය වන වියදම් ඉතිරි කරගැනීමට සහ සෞඛ්‍යයට හිතකර පානීය ජලය ලබා ගැනීමට ද හැකිවනු ඇත. තවද, ප්‍රදේශයේ තෝරාගත් අඩු ආදායම් ලාභී පවුල්වල ගැබිණි මව්වරුන් 50 දෙනකු සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අඩංගු උපකරණ කට්ටල බෙදාදීමක්ද එහිදී සිදුකෙරිණ. 561 වන පාබල බලසේනාවේ බලසේනාධිපතිගේ අධීක්ෂණය යටතේ 10 බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ හටපිරිස් එකතුව මෙම වැඩසටහන සංවිධානය කරනු ලැබූහ.





වකුගඩු රෝගයෙන් පීඩාවට පත්ව සිටින කොහොඹන්කුලම ගම්මානයේ වැසියන්ගේ ප්‍රයෝජනය සඳහා ද යුද්ධ හමුදා හටපිරිස් එකතුව ඉදිකළ ජල පිරිපහදු යන්ත්‍රයක් 2025 අගෝස්තු මස 26 වන දින විවෘත කෙරිණ. ප්‍රදේශයේ ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීමේ අරමුණින්, "රන්දිය" ජල පවිත්‍රකරණ ව්‍යාපෘතිය යටතේ ඉකුත් මැයි මස 30 වන දින එහි ඉදිකිරීමේ කටයුතු ආරම්භ විය. ආචාර්ය ආරියරත්නම් ගෝබික්‍රිෂ්ණා මහතාගේ මූල්‍ය දායකත්වයෙන් සිදුකරන ලද මෙම ව්‍යාපෘතිය මේජර් ජෙනරාල් (විශ්‍රාමික) රවී රත්නසිංහම් විසින් සම්බන්ධීකරණය කරන ලද අතර, 1 සහ 9 ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු හටපිරිස් ඊට ශ්‍රම දායකත්වය ලබාදුන්හ. විවෘත කිරීමේ අවස්ථාවට 57 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේඩීඑම්එල් සමරදිවාකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ඇතුළු රාජ්‍ය නිලධාරිහු සහ ප්‍රදේශවාසීහු පිරිසක් ද සහභාගි වූහ.

# ඉගෙනුමට අත්වැලක්





"Clean Sri Lanka" වැඩසටහනට අනුව යමින් යුද්ධ හමුදා භටපිරිස් එකතුව ඉකුත් සැප්තැම්බර් මස 23 වන දින අධ්‍යාපන සත්කාරයක් සිදු කළහ. මේ යටතේ පාසල් ළමුන්ගේ කියවීමේ රුචිකත්වය වැඩි දියුණු කිරීමේ අරමුණින් කොස්ගලාන ප්‍රාථමික පාසලේ පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් 470ක් පරිත්‍යාග කෙරිණ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සාම සාධක මෙහෙයුම් පුහුණු ආයතනයේ සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඑම්එස්සීබී ජයතිලක ආර්එස්පී යූඑස්පී ඇතුළු නිලධාරීන් සහ සෙසු නිලයින් සහභාගි වූහ.






ත්‍රිකුණාමලය සංගමය ප්‍රාථමික විද්‍යාලයේ දරු දැරියන් හට පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර මස 17 වන දින සිදුකෙරිණ. 2 (ස්වේච්ඡා) ගජබා රෙජිමේන්තුව විසින් මෙම මහඟු කර්තව්‍යය සංවිධානය කරන ලදී.

# යාපනයේ පාසල් දරුවන්ට අධ්‍යාපනික සත්කාරයක්






යාපනය ප්‍රදේශයේ අධ්‍යාපනය ලබන දූ දරුවන් 80 දෙනෙකු සඳහා පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 27 වන දින කරුගම්පනෙයි ප්‍රජා මධ්‍යස්ථානයේදී පැවැත්විණ. රත්නපුර, සිරිදේවනාන්ද පිරිවෙනෙහි නියෝජ්‍ය පරිවේණාධිපති පූජ්‍ය ඕපනායක සුසීම හිමියන් විසින් මෙම වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය දක්වන ලදී. මෙම අවස්ථාවට 51 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්පීඑන්ජ් මුතුමාල යූඑස්පී පීඑස්සී, යාපනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නෝබට් උදයකුමාර් මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.



# ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීමේ වැඩසටහන් ද්විත්වයක්





212 වන පාබල බලසේනා බලප්‍රදේශයට අයත් අනුරාධපුර කලාගම ප්‍රදේශයේ පිහිටි කලා වැවෙහි අක්කර 10ක පමණ ප්‍රදේශයක් සහ බලලු වැවේ වැව් බැම්මේ පවතින ආක්‍රමණශීලී ශාක ගණයට අයත් අගඩාන් සහ ජපන් ජබර ආදී ශාක ඉවත් කිරීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 05 සිට 07 වන දින සිදුකෙරිණ. Clean Sri Lanka වැඩසටහනට අනුව යුද්ධ හමුදා භටපිරිස් සමඟ එක්ව Wild Tuskers සංවිධානය මෙම කටයුත්ත සිදුකළ අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ද සහය මේ සඳහා හිමිවිය.

වැව් පිටියේ එලෙස එම ආක්‍රමණශීලී ශාඛ වැවී තිබීම වන අලින් එහි නොපැමිණීමට හේතු වේ. ඔවුන් ආහාර සොයා ගම් වැදීමේ වැඩි ප්‍රවණතාවක් ද මතුව ඇත්තේ එබැවිනි. මෙලෙස වැව් පිටිය හා වැව මතුපිට එවැනි ශාඛ ඉවත්කිරීම මඟින් වන අලින්ට එහි සුපුරුදු ජීවන රටාව පවත්වාගෙන යාමට හැකිවනවා සේම ඔවුන් ගම්වැදීම ද අවමවනු ඇත.

## අන්තරායකර මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්



පාසල් ප්‍රජාව සඳහා අන්තරායකර මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 542 වන පාබල බලසේනා බලප්‍රදේශයේදී දියත් කෙරිණ. මන්නාරම දිස්ත්‍රික්කයේ දරු දැරියන් මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවීමේ අවදානමට ලක්විය හැකි ඉලක්ක අතර සිටීම නිසා එම ප්‍රදේශයේ පාසල් ප්‍රජාව ඉලක්කර කරගනිමින් පුනරුත්ථාපන කාර්යාංශයේ සහ ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලයේ සහාය ඇතිව මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. එහිදී මෙම වැඩසටහනේ පළමු අදියර ඉකුත් සැප්තැම්බර් 11 වන දින සිසුන් 240කගේ සහභාගීත්වයෙන් මන්නාරම මුරුන්කන් මධ්‍යම විද්‍යාලයේ සහ පරිකරිකන්ඩල් ජීටීඑම් (GTM- Goverment Tamil Mix) විද්‍යාලයේදී පැවැත්විණ.

මෙම අවස්ථාවට 54 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඒඑම්සී අබේකෝන් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී, මන්නාරම දිස්ත්‍රික් ලේකම් කේ කනකේෂ්වරම් මහතා, 542 වන පාබල බලසේනාවේ බලසේනාධිපති බ්‍රිගේඩියර් ඒආර්ඩබ්ලිව්සී අසුරසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ඇතුළු පිරිසක් සහභාගී වූහ. යාපනය දිස්ත්‍රික්කයේ ජාතික අන්තරායකර ඖෂධ පාලන මණ්ඩලයේ සම්බන්ධීකරණ නිලධාරිනිය මෙන්ම උපදේශකවරියක් සහ කථිකාචාර්යවරියක් ලෙස කටයුතු කරන ඒ සියමිණි වයලත් මහත්මිය විසින් මෙම දේශනය මෙහෙයවනු ලැබුවාය.







# සේවා වනිතාවෙන් පරිත්‍යාග රැසක්

යුද්ධ හමුදාවේ සක්‍රීය සේවයේ නියුතු රණවිරුවන්ගේ සහ සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් මූල්‍යාධාර, ජල පිරිපහදු යන්ත්‍ර සහ වියළි සලාක බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 24 වන දින යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් ලසන්ත රොද්‍රිගෝ ආර්එස්පී සීටීඑෆ් - එන්ඩීයූ පීඑස්සී අයිජී සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකක සභාපතිනි ස්වේන්ද්‍රිනී දිසානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.





එහිදී, යුද්ධ හමුදා මූලස්ථානයෙහි රාජකාරී නියුතු සිවිල් සේවක මහත්ම මහත්මීන් 517 දෙනකු සඳහා වියළි සළාක බෙදා දෙන ලදී. එමෙන්ම, අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්කයන්හි පදිංචි පිරිසිදු පානීය ජලය සපයා ගැනීමට අපහසු යුද හමුදා සක්‍රීය සේවයේ නියුතු අයවලුන්ගේ ජල අවශ්‍යතා සපුරාගැනීම සඳහා රුː 74,029.05ක් වටිනා ජල පිරිපහදු යන්ත්‍ර 19ක් ලබාදීම ද සිදුකෙරිණ.

තවද, අභිමංසල - 2 කඹුරුපිටිය සුවසහන මධ්‍යස්ථානයට ප්‍රවේශ මාර්ගය ලබාගැනීම සඳහා ඉඩම් කොටස පරිත්‍යාග කරන ලද සිවිල් සේවිකා පීකේ ප්‍රියංකා මහත්මියගේ ආර්ථික අපහසුතා මඟහරවා ගැනීම සඳහා රුː 50,000.00 මූල්‍යාධාරයක්ද, ඇයගේ පුතුගේ අධ්‍යාපන කටයුතු සිදුකිරීම සඳහා රුː 100,000.00ක මූල්‍යාධාරයක් ද පිරිනැමිණ. එමෙන්ම, යුද්ධ හමුදා රාජකාරී නියුතු රණවිරුවන් තිදෙනෙකුගේ තුන් නිවුන් දරු උපත් සඳහා කිරි පිටි මිලදී ගැනීම වෙනුවෙන් මාසිකව රුː 12,000.00 බැගින් අවුරුද්දක් සඳහා රුː 144,000.00ක මූල්‍යාධාර 03 ක්ද, තවත් රණවිරුවෙකුගේ නිවුන් දරුවන් සඳහා මාසිකව රුː 8,000.00 බැගින් අවුරුද්දක් සඳහා රුː 96,000.00ක මූල්‍යාධාරයක් ද ලබාදෙන ලදී.









ඔක්තෝබර් මස 01 වන දිනට යෙදුනු ලෝක ළමා දිනය නිමිත්තෙන් පමුණුගම සුරස බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දැරියන් සහ කාර්ය මණ්ඩලය වෙනුවෙන් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය වෙතින් සත්කාර රැසක් සිදුකරන ලදී. යුද්ධ හමුදාවේ 76 වන සංවත්සරයට සමගාමීව ඉකුත් සැප්තැම්බර් මස 30 වන දින සිදු කරනු ලැබූ මෙම කටයුත්තට ප්‍රධාන ආරාධිතයින් ලෙස යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය සහභාගී වූහ. එහිදී, නේවාසික දැරියන් සඳහා අවශ්‍ය නිමි ඇඳුම් හා 4rever Skin Naturals පුද්ගලික ආයතනය වෙතින් ලබාදෙන ලද රූපලාවන්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් ද, එහි කාර්ය මණ්ඩලය සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුළත් ත්‍යාග පාර්සල් ද පිරිනැමිණ. එසේම එම දැරියන්ගේ රසාස්වාදය උදෙසා සංගීත සැඳෑවක්ද පැවැත්විණ.

# මින්නේරිය ආයුර්වේද රෝහල වෙත ගෑස් උදුන් පරිත්‍යාගයක්





ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි වින්දා්‍යා ප්‍රේමරත්න මහත්මියගේ අදහසකට අනුව මින්නේරිය ආයුර්වේද රෝහලෙහි නේවාසිකව ප්‍රතිකාර ලබන අයවලුන්ගේ ප්‍රයෝජනය වෙනුවෙන් ගෑස් උදුන් දෙකක් පරිත්‍යාග කිරීම ඉකුත් සැප්තැම්බර් මස 15 වන දින සිදුකෙරිණ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ සේනාවිධායක මෙන්ම කාලතුවක්කු හමුදා රෙජිමේන්තු කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේවීඑන්පී ප්‍රේමරත්න ආර්එස්පී යූඑස්පී එන්ඩීඑස් පීඑස්සී ඇතුළු නිලධාරීන් සහ සේවා වනිතා සාමාජිකාවෝ රැසක් සහභාගි වූහ.

# 5 වසර ශිෂ්‍යත්ව සමතුන්ට පාසල් උපකරණ බෙදාදීමක්







ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සේවයේ නියුතු හා දැනට විශ්‍රාම ගොස් සිටින නිලධාරීන්, සෙසුනිලයින් හා සිවිල් සේවක මහතුන්ගේ 2023 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් දූ දරුවන් 50 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ හා ත්‍යාග වවුචර්පත් බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 19 වන දින සිදුකෙරිණ. එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දර්ශනී යහම්පත් මහත්මියගේ උපදෙස් හා මගපෙන්වීම මත සිදුකෙරුණු මෙම සත්කාරය සඳහා හිමෙත් මෙන්ඩිස් සහ දිසත් මෙන්ඩිස් යන මහත්වරුන්ගේ මෙන්ම පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මූල්‍ය දායකත්වය හිමිවූහ. එම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ, පරිත්‍යාගශීලීන් සහ ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධායක ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# මනෝ උපදේශනය පිළිබඳ දේශනයක්





ගජබා සේවා වනිතා ශාඛාවේ 18 වන වාර්ෂික මහාසභා රැස්වීම ඉකුත් සැප්තැම්බර් මස 14 වන දින සාලියපුර ගජබා නිවහනේදී එහි සභාපතිනි උදාරි අනුපමා ගමගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, "ආතතිය හා කෝප කළමනාකරණය" යන මාතෘකාව ඔස්සේ මනෝ වෛද්‍ය උපදේශිකා කේඑස්ආර් ද සොයිසා මහත්මිය විසින් දේශනයක් ද සිදු කළාය.

# සිසුන්ට ශිෂ්‍යත්ව ප්‍රදානයක්





2024 වසරේ අපොස (සා/පෙළ) හා අපොස (උ/පෙළ) විභාගයන්හි විශිෂ්ට දක්‍ෂතා දැක්වූ ඉංජිනේරු සේවා බලකායේ සාමාජිකයින්ගේ දුවා දරුවන් ඇගයීමට ලක්කිරීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 25 වන දින පනාගොඩ ඉංජිනේරු සේවා බලකා මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ඉංජිනේරු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි අනුපමා රත්නායක මහත්මියගේ මඟපෙන්වීම යටතේ මෙම වැඩසටහන සංවිධානය කෙරිණ. මෙහිදී, මානව කුසලතා සංවර්ධන පුහුණුව පිළිබඳ විශේෂඥයකු වන සනත් ගමගේ මහතා විසින් "ඔබේ උපරිමයට ළඟා වන්නේ කෙසේද?" යන මැයෙන් දේශනයක් ද පැවැත්විය. එහිදී. පාසල් අධ්‍යයන කටයුතු සහ ජීවිතය තුළ වැඩි සාර්ථකත්වයක් අත්කර ගැනීමට පෙළඹවීමේ ක්‍රමෝපායන් පිළිබඳ ඔහු සිසුන් සහ දෙමාපියන් දැනුවත් කරන ලදී. මෙම අවස්ථාවට ඉංජිනේරු සේවා බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් කේඑච්එන් රසික කුමාර එන්ඩීසී පීඑස්සී ඇතුළු නිලධාරීන්, එම සේවා වනිතා ශාඛා සාමාජිකාවෝ සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# පරිත්‍යාග වැඩසටහනක්





අනුරාධපුර ප්‍රදේශයේ පවත්වාගෙන යන "සතුට" ළමා නිවාසයෙහි නේවාසිකව වෙසෙන උපතින්ම විවිධ ආබාධ සහිත ගැහැණු දරුවන්ගේ දෛනික පරිහරණය සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ පිරිනැමීම හා ඇවිදීමට අපහසු ගැහැණු දරුවෙකු වෙනුවෙන් රෝද පුටුවක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් ඉකුත් සැප්තැම්බර් මස 11 වන දින එම ළමා නිවාස පරිශ්‍රයේදී පැවැත්විණ. ඒ සඳහා ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බළකා සේවා වනිතා ශාඛාවේ උප සභාපතිනියගේ මඟපෙන්වීම මත පරිත්‍යාගශීලීන්ගේ මූල්‍ය දායකත්වය හිමිවිය. මෙම වැඩසටහන සඳහා එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ මෙන්ම නිලධාරීන් සහ ළමා නිවාසයෙහි පාලිකාවන් ද එක්වූහ.



# නිවාස සිහිනය සැබෑ කරමින්

ශ්‍රී ලංකා ජාතික ආරක්‍ෂක බළමුළුවට අයත් සෙ/කිපු107377 සාසෙ රත්නායක එච්එස් යන කොනොනි වෙත නව නිවසක් ඉදිකරදීම සඳහා මුල්ගල තැබීම ඉකුත් සැප්තැම්බර් මස 02 වන දින එම සේවා වනිතා ශාඛා සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණ. මෙම අවස්ථාවට එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ, නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# ඔබේ කතා බහ ඔබේ පෞරුෂත්වයේ කැඩපතයි



පුද්ගලයෙක් ලෙස ඔබේ කතා බහ තුළින් ඔබව අභිමානවත් පුරවැසියෙක් බවට පත් කරනු ලබයි. සෑම පුද්ගලයෙක්ම තමන්ගේම පෞරුෂත්වයක් සහ යම් කතාවක් සමඟ මේ ලෝකයට පැමිණෙනවා. ඔබේ කතාව අන් අය අතරට රැගෙන යන ආකාරය නැතිනම් ඔබේ කතා බහ ඔබව අර්ථ දක්වන ප්‍රබලම සාධකය බවට පත් වෙනවා. ඔබ කතා කරන විදිහ තුළින් ඔබේ වටිනාකම වැඩි කරනවා පමණක් නොව, ඔබට අවශ්‍ය ගෞරවය දිනා දෙනවා. පුද්ගලයෙක් විදිහට ඔයාට තියෙන සහ තිබිය යුතු වටිනාම දේ තමයි ඔයාගේ ආත්ම ගෞරවය. හැමදාම හැම තැනකදීම අනිත් අය ඔයාගේ වටිනාකම තීරණය කරනවාට වඩා ඔයාටම තීරණය කරන්න පුළුවන් නම් ඔයා කවුද කියන දේ ඒක ඔයාගේ ජීවිතයේ වටිනා ජයග්‍රහණයක්. ආත්ම ගෞරවය කියන්නේ අහංකාරකමක් හෝ ආඩම්බරකමක් නෙවෙයි. ඒක තමයි ඔයාගේ ජීවිතයේ සීමා මායිම් හදාගන්න, ඔයාගේ කාලයට වටිනාකමක් දෙන්න සහ ඔයා වෙනුවෙන්ම ආයෝජනය කරන්න තියෙන හොඳම අවස්ථාව.

අපි හැමෝටම කතා කරන්න ආස හිතෙන, හිතේ ගොළු වෙලා තියෙන සියලු හැඟීම් මුදා හරින්න කැමති වෙලාවල් තියෙනවා. නමුත් ඒ හැමවෙලාවකම කතා කරනවාට වඩා නිහඬව සිටීමට පුරුදු වීමෙන් වටිනාකම් රැසක් අත්කර දෙනවා. ඔබට යමක් කීමට පෙර ඒ ගැන හොඳින් හිතන්න. ඔබට කියන්න තියෙන දේ මේ වෙලාවේ කියන්න අවශ්‍යම ද? එයින් කවුරු හෝ කෙනෙකු මානසික පීඩනයකට ලක්වෙයිද නැතිනම් යහපතක් සිදුවෙයිද යන්න නැවත නැවත සිතා බලන්න. ඒ වගේම අන් අය කතා කරන විට හොඳින් සවන් දෙන්න. ඔවුන්ගේ අදහස්වලට ගරු කරන්න. මේ නිහඬ බවත්, සවන් දීමත් ඔබට විශාල ගෞරවයක් දිනා දෙනවා.

ප්‍රඥාවන්තව වචන භාවිතා කිරීම තුළින් ගෞරවනීය බව නිතැතින්ම ලැබීමට හේතුවක් වනු ඇත. ඔබ ඉදිරියේ සිට කතා කරන සෑම පුද්ගලයෙකුටම ගරු කරන්න. ඔවුන්ගේ තනතුර හෝ වයස කුමක් වුවත් ඔබ ගෞරවනීය වචන භාවිතා කිරීම තුළින් ඔබව වඩාත් උසස් කරනවා.

ඔබ කරන කතා බහ ගැටුම් ඇති කිරීමට නොව ඒවා විසඳීමට මාධ්‍යයක් කර ගන්න. ගැටලු නිරාකරණය කිරීමට හොඳම මාධ්‍යය යහපත් වචන භාවිතයයි. කේන්තියෙන් හෝ කලබලයෙන් කතා

කරනවා වෙනුවට සන්සුන්ව හා සාධාරණව අදහස් දක්වන්න.

ඔබ තවකෙනෙකුට කියන්න යන දේ ඉතා පැහැදිලිව, සංක්ෂිප්තව සහ සෘජුවම කියන්න. වචන අවුල් කරගෙන කතා කරනවා වෙනුවට මේ සංක්ෂිප්ත බව ඔබේ විශ්වාසය පෙන්වනවා. ඔබේ හැසිරීම සහ ශබ්දය පාලනය කර ගැනීම ද ඔබේ පෞරුෂත්වය ඉහළට ඔසවා තබනු ලබයි. ඉක්මනින් කඩිමුඩියේ නොඉවසිලිමත්ව කතා කරන්නේ නැතිව සෙමින් හා පැහැදිලිව කතා කරන්න. ඒ තුළින් ඔබ අවබෝධයෙන් හා සන්සුන්ව කටයුතු කරන බව පෙන්වනවා. එමෙන්ම අනවශ්‍ය ලෙස උච්ච ස්වරයෙන් කතා නොකර මධ්‍යස්ථ ශබ්දයකින් කතා කිරීම ද පෞරුෂත්ව වර්ධනයට හේතුවක් වනු ඇත.

අනුන්ගේ ජීවිත ගැන ඕපාදූප කතා කරනවා වෙනුවට ඔබටත් අන් අයටත් ප්‍රයෝජනවත් වන දේවල් ගැන පමණක් කතා කරන්න. ඔබට හොඳ දැනුමක් ඇති මාතෘකා ගැන පමණක් කතා කරන්න. පෞද්ගලික කාරණා හැම තැනම කියනවා වෙනුවට ඒවා ඔබට පමණක් සීමා කර ගන්න.

ඔබ කතා කරන හැම වචනයක්ම ඔබේ පෞරුෂත්වය පිළිබිඹු කරනවා. ඒ නිසා ඔබේ කතාව ඔබේ වටිනාකම තහවුරු කරනවා වගේම ඔබට අභිමානයක් ගෙන දෙන වස්තුවක් බවට පත් කරගන්න උත්සාහ කරන්න. මේ පුංචි පුරුදු ඔබේ ජීවිතයම වෙනස් කරන්න රුකුලක් වන බව නම් නොඅනුමානයි.

යම් පුද්ගලයෙක් ඔබට අගෞරව කරන විට නිශ්ශබ්දව සිටීමෙන් ඔබට ඔබගේ වටිනාකම තේරුම් ගෙන ඉදිරියට යාමට අවස්ථාව උදා වනු ඇත. ඔබ පුරුද්දක් විදිහට තමන්ට අගෞරවයක් වුණාම ඒක නොසලකා හරින්න පුරුදු වී සිටී නම් එය ඔබටම කර ගන්නා හානියකි. යම් පුද්ගලයෙක් ඔබට අගෞරව කළහොත් ඒ සම්බන්ධයෙන් සන්සුන්ව පැහැදිලිව කතා කරන්න. එවැනි අවස්ථාවක ප්‍රතිචාර නොදක්වා නිහඬව සිටීමෙන් සිදුවන්නේ ඔබට අගෞරව කළ පුද්ගලයාට නැවත එසේ කිරීමට අවස්ථාවක් ඔබම ලබා දීමයි. එම නිසා මෙහිදී ඔබ කළ යුත්තේ ඉතා සන්සුන්ව සහ පැහැදලිව ඔබේ අදහස් ප්‍රකාශ කිරීමයි. මෙහිදී, ඔබේ අරමුණ වන්නේ ආරවුලක් ඇති කර ගැනීම නොව ඔබ වෙනුවෙන් පෙනී සිටීමයි. මෙවැනි ක්‍රියාවන්ගෙන් ඔබ

ඔබ කතා කරන හැම වචනයක්ම ඔබේ පෞරුෂත්වය පිළිබිඹු කරනවා. ඒ නිසා ඔබේ කතාව ඔබේ වටිනාකම තහවුරු කරනවා වගේම ඔබට අභිමානයක් ගෙන දෙන වස්තුවක් බවට පත් කරගන්න උත්සාහ කරන්න. මේ පුංචි පුරුදු ඔබේ ජීවිතයම වෙනස් කරන්න රුකුලක් වන බව නම් නොඅනුමානයි.

ඔබේ සීමාවන් සහ ආත්ම ගෞරවය ආරක්ෂා කර ගැනීමට අවබෝධයක් ඇති අයෙකු ලෙස ඔබ අන් අයට පෙන්වා දෙනවා.

ඔබ වචන හසුරුවන ආකාරය, වචනවල ගුණාත්මකභාවය, ඔබ යම් කෙනෙකුට ගෞරවනීය ලෙස කතා කරන ආකාරය, ඔබ යම් දෙයක් පිළිබඳව දක්වන ආකල්පය ප්‍රකාශ කරන ආකාරය, තැනට සුදුසු ලෙස කතා කරන ආකාරය, හඬ පාලනය කරන ආකාරය, ඔබගේ හැඟීම් ප්‍රකාශ කරන ආකාරය මෙන්ම ඔබ කතා කරන්න වගේම නිහඬව ඉන්න ඕනේ කොතනදිද කියලා දැන ගන්න එකත් හරිම වැදගත්. බොහෝ වෙලාවට ඔබගේ කතා බහ නිසා ඔබගේ ආත්ම ගෞරවයට හානි වෙන්න පුළුවන් නිසා ඔයා හැම වෙලාවෙම මතක තියා ගන්න ඔයාගේ කතාව ඔයාගේ ගෞරවය එක්ක එකට බැඳී තිබෙන බව.

ඔයාගේ ඇඳුම් පැළඳුම් බාහිරින් ඔයා පිළිබඳව සමාජයට නිහඬව පණිවිඩයක් ලබා දෙනවා. සෑම විටම ඔබේ ඇඳුම් පැළඳුම් ඔබට ගෞරවනීය බවක් එක් කරන බව මෙන්ම ඔබ ගැන නිහඬ ප්‍රකාශයක් අනිත් අයට ලබා දෙන බව අමතක කරන්න එපා. තැනට සුදුසු ලෙස අඳින්න. වර්ණ පිළිබඳව සැලකිලිමත් වන්න. පිරිසිදුව පිළිවෙළට අඳින්න. පළඳින ආභරණ ගැන සැලකිලිමත් වන්න.

සම්බන්ධතාවලදී සමබර වීම ද ඉතා වැදගත්. නිරෝගී සම්බන්ධතාවයක් කියන්නේ දෙපාර්ශවයෙන්ම අවබෝධය, සැලකිල්ල සහ උත්සාහය තියෙන්න ඕන දෙයක්. එහෙම නැතුව එක පැත්තකට බර වුණොත් ඔයා විතරක් ඒ සම්බන්ධතාවය ඇදගෙන යනවා වගේ දැනෙන්න පුළුවන්. ඒ නිසා ඔයාගේ වටිනාකම තියාගෙන ඉන්න නම් දෙන සහ ගන්න දේ අතර සමබරතාවයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍යයි.

අන් අයගේ කාලයට ගරු කරන නිසාත්, ඔයාගේ වචනවලට වටිනාකමක් එකතු වෙන නිසාත් අවශ්‍ය දේ පමණක් කතා කර නිහඬ වීම හොඳ පුරුද්දක්. ඕනෑවට වඩා දේවල් කතා කරන එක හොඳ පුරුද්දක් නෙවෙයි. හැම තැනකදීම අනවශ්‍ය විස්තර කියන කෙනෙක්ට වඩා අදාල තැනට අදාල දේ පමණක් කතා කරන කෙනාට ඇහුම්කන් දීමට දක්වන ප්‍රතිචාර ඉතා ඉහළයි. ඒකෙන් ඔයා කියන දේට වටිනාකමක් එකතු වෙනවා. ඔයාගේ වචනවලට බරක් එකතු වෙනවා. ඉතින් ඔයා කියන එක වචනයකින් අනිත් අය ඔයාට ගරු කරන තැනට එන්න උත්සාහ කරන්න. ඒකට කරන්න තියෙන්නේ කතා කරන හැම වෙලාවකම "මම කියන්න යන දේ ඇත්තටම අවශ්‍ය දෙයක් ද?" කියලා තත්පරයක් හිතලා බලන එක. මේ පුරුද්ද ඔයාට වගේම ඔයාගේ සම්බන්ධතාවලටත් ගොඩක් වැදගත්.



■ **දිල්මි ශානුකී**

**වාණිජවේදී (විශේෂ) උපාධිධාරී)**
**පේරාදෙණිය විශ්ව විද්‍යාලය.**



# තත්වය හා විවාහය

ඔහුට දැන් වයස තිස් පහක් පමණය. ඔහු සොට්ටියෙකි. එතරම් උසද නැත. ඔහු කෙරෙහි හැඩ වැඩ ගතියක් ද ඇතැයි සිතිය නොහැක. කණිෂ්ඨ පංතියට වැටෙන රැකියාවක් කරන ඔහු සතු ධනයක්ද නැත. එහෙත් සිය එදිනෙදා ඕනෑ එපාකම් ඉටු කර ගැනීමට ඔහුට බැරිකමක් නැත. ඔහුගේ පවුලේ අන් කිසිවකු රැකියාවක් නොකරයි. දෙමාපියන් තරමක් මහළුය. ඔහු ළඟට සිටින සොහොයුරා මෝඩ පහේ කෙනෙකි. නංගි ජ්‍යෙෂ්ඨයට පෙනී සිට ගෙදර නැවති සිටී. මා දන්නා හැටියට ඔහු විවාහ වීමට සහකාරියක සොයන්නේ අවුරුදු පහක පමණ සිටය. එහෙත් ඔහුට මෙතෙක් එය කර ගත නොහැකි වී ඇත. විවාහ යෝජනා විසි පහකටත් වඩා ඔහු වෙනුවෙන් ඉදිරිපත් විය. ඒ එකක්වත් ඔහුගේ සිත් නොගනී. ඔහු සොට්ටියෙකු වුවද සියලු අඟ පසඟින් යුත් රූමත් තරුණියක පතයි. ඔහු ධනවතෙකු නොවුවද දෑවැද්ද ලොකුවට සොයයි.

ඔහුගේ පවුලට ඊනියා තත්වයක් නැතත් ඉහළ පෙළේ පවුලකට සම්බන්ධ වීමට ඔහු බලාපොරොත්තු වෙයි.

තමා කෙබඳු කෙනෙක්දැයි තේරුම් ගැනීමට නොහැකි මෙවැනි අය සහකාරියක සොයා යමින් ස්වකීය මුළු ජීවිත කාලයම ඒ වෙනුවෙන් ගත කිරීම වඩාත් හොඳ යයි මට සිතෙන්නේ මොවුන් විවාහ වුවත් ඔවුනට සාර්ථක ජීවිතයක් ගත කිරීමට නොහැකි වන බව නිශ්චිත වශයෙන් කිව හැකි බැවිනි. තමාගේ තත්වය තේරුම් ගැනීමට නොහැකි පුද්ගලයෙකුට තවත් කෙනෙකු හා එකතු වී ජීවත් වීමට කොහෙත්ම නුපුළුවන. තමා නිසා තවත් කෙනෙකු අමාරුවේ නොදමා යටකී ලෙසට කාලය ගෙවීම වඩාත් හොඳ යයි මට සිතෙන්නේ එබැවිනි. විවාහයක් ගැන සිතීමේදී රූපය, ධනය, තත්වය අප කවුරුත් සලකන කරුණු බව ඇත්ත. එහෙත් ඒවාට සීමාවක් තිබිය යුතුය. තමා විරූපියෙක් නම් තමාගේ

> ඕනැවට වඩා ලස්සන විනාශයට හේතු වෙයි. ඕනැවට වඩා ධනයත් ඕනෑවට වඩා තත්වයත් එසේමයි. ලස්සන ධනය හා තත්වය සොයමින් ගෙදරට නාකි වන තරුණ තරුණියන්ට මුහුණ පාන්නට වී ඇති ගැටලුව නම් ලස්සන ධනය හා තත්වය කුමන ප්‍රමාණයකට තමාට සෑහේද යන්න තේරුම් ගැනීමට බැරිකමය.

සහකාරිය හැටියට අභිරූපිකාවක් බලාපොරොත්තු වීම මෝඩකමකි. තමා ධන හීනයෙක් නම් ලොකු දැවැද්දක් සෙවීම තවත් මෝඩකමකි. මවාගනු ලබන ලොකු තත්වයක් සෙවීම ද තේරුමක් නැති දෙයකි. රූපය ධනය හා තත්වය තේරුමක් නැති දේවල් හැටියට මින් අදහස් නොකෙරේ. කවුරුත් ලස්සනට කැමතිය. එහෙත් ඕනැවට වඩා ලස්සන විනාශයට හේතු වෙයි. ඕනැවට වඩා ධනයත් ඕනෑවට වඩා තත්වයත් එසේමයි. ලස්සන ධනය හා තත්වය සොයමින් ගෙදරට නාකි වන තරුණ තරුණියන්ට මුහුණ පාන්නට වී ඇති ගැටළුව නම් ලස්සන ධනය හා තත්වය කුමන ප්‍රමාණයකට තමාට සෑහේද යන්න තේරුම් ගැනීමට බැරිකමය.

විවාහය වූ කලී ධනය, රූපය හා තත්වය මත පමණක් රඳා පවතින්නක් බව සිතීම විශාල මෝඩකමකි. මේ තුන් පැත්තෙන්ම සම්පූර්ණ විවාහයන් ඉතා කණගාටුදායක ලෙස කැඩී යන අන්දමත් ඇතැම් විවාහයන් එසේ කැඩී නොගියද අඹු සැමියන් හේද භින්න වී අපාගතව ජීවත් වන්නාක් මෙන් කල් හරින සැටිත් අප ඕනෑතරම් දැක තිබේ. පිවිත දෙකක් ගැලපෙන්නේ ධනය රූපය වැනි බාහිර දේවල් අනුව නොව එකිනෙකා ජීවිතය දෙස බලන පිළිවෙල අනුවය. පැරැන්නන් හැඳිච්චකම යනුවෙන් හඳුන් වන්නේ මෙයයි. යමෙකුගේ හැදිච්චකම රැඳී ඇත්තේ ඔහු ජීවිතය දෙස බලන පිළිවෙල අනුවය. ගති ගුණ යනුවෙන් හැඳින්වෙන්නේද මෙයයි. ගතිය යනු යමෙකුගේ ස්වභාවයයි. ගතිගුණ යනු එම ස්වභාවයේ ලක්ෂණ නොහොත් හොඳ නොහොඳයි. පුද්ගලයකුගේ ස්වභාවය පිහිටන්නේ ඔහු ජීවිතය තේරුම් ගන්නා ආකාරයට අනුකූලවය. රූපයෙහිත් ධනයෙහිත් තත්වයෙහිත් අගය තේරුම් ගත හැක්කේ ජීවිතය තේරුම් ගැනීමට හැකි නම් පමණි. ඉන් ජීවිතයට ප්‍රීතියක් ලද හැක්කේද එවිටය. රූපය ධනය හා තත්වය පමණක් සොයන්නා කිසි කලක තෘප්තියට පත් නොවන්නෙකි. රූපය, ධනය හා තත්වයේ මුවාවෙන් ජීවිතයේ වෙනත් දුබලකම් වසා ගැනීමට තැත් කිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් අත් නොවේ. ඉන් ජීවිත තෘප්තියක් ලද නොහැක්කේ ඇතුළතින් තමා කවුදැයි තමාගේ යටි සිත දන්නා බැවිනි.

තම හිතවතුන් අතර කැපී පෙනීමට, යන එන ගමනෙහිදී තමා කෙරෙහි අන්‍යන්ගේ අවධානය යොමු කර ගැනීමට, කා අතරත් තමා ගැන කථාබහ කිරීමට සැලැස්වීමට තමා සතු නිසඟ ස්වභාවයක් නැති පුද්ගලයන් රූමත් බිරියක හෝ ධනවත් බිරියක හෝ තත්වයක් ඇති බිරියක හෝ ලබා ගැනීමෙන් යටකී තත්වයට එන්නට වෑයම් කරයි. එබඳු අන්දමට තමාගේ අඩුපාඩුකම් පිරිමසා ගන්නට යාමෙන් තව තවත් අමාරු තත්වයකට සිය ජීවිතය පත්වනු විනා ඉන් සැනසීමක් නම් නොලැබේ.

විවාහ ජීවිතයේ එකම සැපත අඹු සැමියන් වශයෙන් නිවී සැනසිල්ලේ ජීවත් වීමයි. මේ සඳහා උවමනාවට වඩා ධනය රූපය හා තත්වය අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ තම තමන් ගැන අවබෝධය හා ලෝක තත්වය වටහා ගැනීමය. විවාහ වීමට සහකාරියක හෝ සහකරුවෙකු සෙවීමේදී පළමුවෙන් කළ යුත්තේ තමාගේ තරාතිරම හොඳින් අවබෝධ කර ගැනීමය. එවිට ඔබේ තරාතිරමට සම කෙනෙකු තෝරා ගැනීමට ඔබට ලෙහෙසියෙන්

හැකි වනු ඇත.

තමන්ගේ තරාතිරම වටහා ගැනීමට නොහැකි දෙමාපියන් නිසා ගෙදරට නාකි වන තරුණ තරුණියන් බොහෝය. මේ අවාසනාවන්ත තරුණ තරුණියන්ගේ ජීවිත අකාලයේ නාස්ති වීම ගැන වගකිව යුත්තෝ ඔවුන්ගේ දෙමව්පියෝය. තම පුතා හෝ දියණිය සඳහා සහකාරියක හෝ සහකරුවකු සොයන

දෙමාපියෝ බොහෝ කොට සොයන්නේ ධනය හා තත්වයයි. මේ අතරට පවුල්වල ඇද කුදත් ඇදෙයි. තම තමන්ගේ අඩුපාඩුකම් ගැන තැකීමක් නොකොට තම පුතාට හෝ දියණියට සොයන සහකාරිය හෝ සහකරු පිළිබඳ ඇදකුද අඩුලුහුඩුකම් සෙවීම නිසා තමන් බලාපොරොත්තු වන විධියේ කෙනෙකු ඔවුනට කිසි කලෙක නොලැබෙනු ඇත. මේ අවාසනාවන්ත තත්වය හේතුකොට ගෙන සිත් වේදනාවෙන් කාලය ගත කරන තරුණ තරුණියන්ගේ සංඛ්‍යාව ඉතා විශාලය. දෙමාපියන් සිය වැඩිවිය පත් දූ පුතුන් ගැන දැඩි ආත්මාර්ථකාමයෙන් නොබලා තමන්ගේ තරාතිරම වටහාගෙන ඒ අනුව ඔවුන්ගේ අනාගතය ගැන පියවර

**තමන්ගේ තරාතිරම වටහා ගැනීමට නොහැකි දෙමාපියන් නිසා ගෙදරට නාකි වන තරුණ තරුණියන් බොහෝය. මේ අවාසනාවන්ත තරුණ තරුණියන්ගේ ජීවිත අකාලයේ නාස්ති වීම ගැන වගකිව යුත්තෝ ඔවුන්ගේ දෙමව්පියෝය.**

ගන්නේ නම් යටකී අවාසනාවන්ත තත්වය බොහෝ දුරට මඟ හැරෙනු ඇත. විවාහයට හා ජීවිතයට රූපය ධනය හා බාහිර තත්වය අනුව අර්ථ දිය නොහැක. ඒ අනුව මේ දෙක තේරුම් ගැනීමටද නොහැක. සුදුසු විවාහයක් කර ගැනීමට නොහැකිව තැවෙන්නේ මේ සත්‍යය වටහා ගැනීමට නොහැකි වීමෙනි.

*- "ශ්‍රී" සඟරාව ඇසුරිනි*





# ඔවුන් කිසිවකු මියගියේ නැත

## උතුරේ

එවකට ඇවිලෙමින් තිබූ යුද්දය පිළිබඳ සත්‍ය තොරතුරු මෙලෝ ඉටිගෙඩියක් නොදන්නා කාලයේදී වුවද මා ආසාකරේ යුද හමුදාවට බැඳෙන්නට මුත් ලැබුණු අවස්ථාවන් දෙකම මා වෙතින් ගිලිහී ගියේ ශාරීරික පරීක්ෂණයෙන් මා අසමත් වූ නිසාවෙනි. නියමිත උස සහ බර නොමැති කමෙන් මා පරීක්ෂණයෙන් ඉවත් කිරීමට සිදුවූ බව හේතු සාදක ලෙස සටහන්ව තිබුණි. මා සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වීමට පැය අටකට ආසන්න කාලයක් ගෙවා දමමින් එවකට සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද වැලිසර යුද හමුදා කඳවුරට පැමිණිය ද ඒ සියලු බලාපොරොත්තු බිඳ දමා ගනිමින් ගමන් මහන්සිය පමණක් අතැතිව නැවත නිවස බලා ගිය අයුරු දැනුදු මට සිහිපත් කළ හැකිය. නිවසට ගොඩ වැදුන පළමු තත්පරයේදීම මා සන්ධුවකට පැටලුනේ අක්කා සමගිනි. ස්වභාවයෙන්ම උස මහත දේහයකට හිමිකම් කියූ ඇ හා සැසඳූ කළ මා නිකන්ම නිකන් හාල්මැස්සියක මෙනි. "තමුසෙ ඔච්චර උස ගිහින් මහත් උනේ මොනව ගිලලා ද" යැයි මා ඇගෙන් විමසූ අයුරු අදටත් මට මතකය. කෝපයෙන් පුපුරු ගසනා මාගේ ඇස් මෙන්ම රත් පැහැයෙන් දිලුලනා මාගේ මුහුණ දුටු විගස සිදුවන්නට ඇත්තේ කුමක්දැයි ඇයට අවබෝධ වන්නට ඇත. "තමුසෙට තව වයස තියනවනේ. ටිකක් දඟලන්නෙ නැතුව ඉන්නවා. යුද්දෙටම යන්න ඕනෙ කියල දෙයක් නැහැනේ ආමි එකේ වෙන ඔය ඕනතරම් සෙක්ෂන්ස් තියෙන්නේ. ගැසට් කළහම එහෙම එකක් බලනවා" ඇය පැවසූයේ මාගේ බිඳී ගිය සිත සනසවන්නට වුවද එය යථාර්තයක් නොවන බව මා ඒ වන විට ප්‍රත්‍යක්ෂ වශයෙන්ම දැන උන්නෙමි. මායාකාරී බලයකින් මෙන් කිසිවෙකුටත් මා අඟල් පහ හයක් දෙපසට ඇද ටිකක් දික් කරන්නට හැකි උනොත් මිසක.

එවකට අපේ ගමේද සැතපුමකට එකක්වත් බැගින් යුද හමුදාවේ දිවි පිදූ වීර සෙබළු වෙනුවෙන් ඉදිවුන චාම් සොහොන් කොත් මෙන්ම තනිපලයට ගොඩ නගන ලද සරල බස් නැවතුම්පලවල්ද සුලභව තිබුණි. ඒවා පසු කරගෙන යන සෑම අවස්තාවකදීම හිස මදක් පහත් කොට නිදාසිටිනා ඒ උදාර මිනිසුන් වෙනුවෙන් මාගේ ආචාරය පුද කිරීමට කිසිදු විටක මට අමතක නොකලෙමි. කෙමෙන් වයසින් වැඩී ගිය ද මා සතු ඒ පුරුද්ද අදටත් නොනැසී ඉතුරු වී පවතින්නකි. සොහොන් පලක් මත ජායාරූපයක්ව හිඳිනා එවැනි බොහෝ මිනිසුන්, ඒවා දෙස බලන වාරයක් පාසාම තවමත් අප දෙස, ඔවුන් දිනාදුන් මහ පොළව දෙස නොනිදනා දෑස් දල්වා බලා සිටිනා ලෙසක් මට හැඟුණි.

මාගේ පළමු ප්‍රේමය එවැනි මියගිය රණවිරුවකු සමඟ ඇති වූවක් යැයි මා පැවසුහොතින් ඔබ පුදුම වනු නිසැකය. එවකට මා පාසලේ දොලොස්වන ශ්‍රේණියේ ඉගනුම ලබමින් හුන් කාලසීමාවයි. අමතර පන්ති යාම සඳහා අප බසයක් එනතුරු රැඳී හුන් මාරගස යට දිනක් ඔහු වෙනුවෙන් ස්මාරකයක් ලෙස කුඩා බස් නැවතුම්පලක් ඉදි වී තිබුණි. මා ජීවිතයේ කිසිම දිනයක සජීවීව ඔහු දැක නොමැත. ඔහු කාගේ කවුරුන්ද කොහේද යන්න පවා නොදත් නමුත් මා සිත තුළ ඔහු වෙනුවෙන් නමක් නොදන්නා හැඟීමක් ඇතිව තිබුණි.

බස් නැවතුමෙහි ඇතුලත කලු ග්‍රැනයිට් ගල් පොත්තක ඔබ්බවා තිබූ ඔහුගේ උඩුකය වර්ණ ජායාරූපය මෙතරම් කාලයක් ගෙවී ගොස් නමුදු අදද මට මතක් කර ගතහැකිය. උස් වූ ගිරා හොටක් වන් නාසයකිනුත්, පුළුල් නළල් තලයකිනුත් තීක්ෂණ දෑසකිනුත් හෙබි ඔහුට වූයේ පැහැදිලි සඳක් වන් වටකුරු මුහුනකි. ජායාරූපයට ඔහු පෙනී සිට තිබුනේ සිය රාජකාරී නිලඇඳුමින් බැවින් එයට ගැලපෙන අන්දමට කැප් තොප්පියක් පැලඳ සිටියෙන් ඔහුගේ හිස්කෙස් කෙසේද යන්න ගැන අවබෝධයක් මා තුළ නොවුණාය. සතියකට දින තුනක් බසයක් එනතුරු මෙසේ බස්නැවතුම් පල අසල කල්මැරීම පුරුද්දක් වූ නිසාවෙන්ම ගෙවී යන කාලය තුළ මම ඔහුගේ කිසිදාක නොපියවුණු දෙනෙත් දෙස බලා දොඩමලු වන්නට වීමි. පස්සෙන් පසු වන්නට මා බසය පැමිණීමට විනාඩි තිහක් වත් කලින් නැවතුමට පැමිණෙන්නට පුරුදු වූයෙන් මාගේ වෙනස හොඳම මිතුරිය වූ දීශාට ද දැනී ගොස් තිබුනි.

අප රැඳී සිටිනා බස් නැවතුම්පල එතරම් කාර්යබහුල තැනක් නොවූයේ

මාගේ වාසනාවකටය. නැතහොත් පාලු බස් නැවතුමක තනියම සිනහවෙමින් කතා කරන තරුණ කෙල්ලක දුටුවෙකු නිසැකයෙන්ම මා පිස්සියක ලෙස සලකා එතනින් නොනැවතී මා ගැන නිවසට ද පැමිණිලි කරනු නියතය. වාසනාවකට මා පන්ති යන්නට පැමිණෙන්නේ දවසේ අතරමැද කාල සීමාවක බැවින් ඒ වේලාවට පාරේ මිනිසුන් සිටියේ කිහිපදෙනෙකි.

ඔහුගේ ජායාරූපයෙහි පහල කෙලවරේ උපත සහ විපත ලෙස සටහන් වූ කාලසීමාවන් ගනනයෙන් ඔහු තවමත් හිරිමල් යොවුන් වියේ හිනිපෙත්තේ උන් තරුණයකු යැයි මම නිගමනය කලෙමි. "දිශා මට මෙයාලගේ ගෙදර හොයාගන්න ඕනේ" දිනක් මා කියුවේ ඉවසාගත නොහැකි තැනමය. බල්බ දෙකක් වන් සුවිසල් දෑස් එලියට පනින තරමෙන් තවත් විසල් කරගත් ඈ මා දෙස බැලුවේ "උඹට ඇත්තටම පිස්සු හැදීගෙන එනවාදැයි" විමසමිනි. කෙසේ නමුත්, සතියක ඇවෑමෙන් මමත් දීශාත් ජායාරූපයෙහි වූ ලිපිනය සොයා යමින් සිටියෙමු. ඇයි ආවේ කියල ඇහුවොත් කියපන් ඉස්කෝලේ ප්‍රොජෙක්ට් එකක් කරනවා ඒකට තොරතුරු ටිකක් ගන්න කියලා. යමින් ගමන දීශා මට ගුරුගරුකම් දුන්නේ මා එවැනි වැඩවලට අදක්ෂයකු නිසාවෙනි.

ත්‍රීවීල් රථයේ රියදුරා අපව හරියටම ඔහුගේ නිවස අසලටම ගෙන ගිය අතර අප කතාබහ කර පැමිණෙන තුරු ඔහු නැවතී සිටින බවට පොරොන්දු කරවා ගනිමින් අපි දෙදෙනා දෙඩියාවකින් යුතුව නිවස දෙසට පා තැබුවෙමු. එවැනි දේකට නිවසකට යද්දී ගෙන යාමට සුදුසු කුමක් දැයි මා මෙන්ම දීශා ද නොදැන උන් නිසාවෙන් කෝකටත් කියා අප දෙදෙනා නොස්ටොමෝල්ට් පැකට්ටුවකුත් ක්‍රීම් ක්‍රැකර් බිස්කට් පැකට්ටුවකුත් බ්‍රවුන් පේපර් බෑගයක දමා ගත්තෙන් හිස් අතින් නිවසට ගොඩවැදීමේ දී නැගෙන හිස් බව අප දෙදෙනාට නොදැනුණි.

එය සම්පූර්ණයෙන්ම වාගේ කටුමැටි ගැසූ නිවසකි. නිවස ඉදිරිපිට වූ වැල් පුටු දෙකෙහි වැල් කැඩී තවදුරටත් ඒවා භාවිතයට ගත හැකි මට්ටමක නොවූ බව දුර තියාම අප දෙනෙතට අසුවුණි. අප පැමිණි ත්‍රීරෝද රථය නිවස ඉදිරිපිට නවතනු ඇසීමෙන් දෝ

> **සටන්බිමෙහි වුන් කිසිවෙක් මියගොස් නැත. ඔවුන් සැමදා ජීවමානය. මියගියද නැවත නැවතත් ජීවය ලබන්නා උන්ය. අප හුස්ම ගන්නා සෑම වා බුබුලක්ම, කොල පාටින් බබලනා සෑම ගහක් කොලක් මෙන්ම පිපී දිලිසෙනා සුවඳවත් මල් ද ගුම් නදින් පෙන විසිරුවමින් ගලා හැලෙනා සීතල දිය දහරා ද ඔවුහු දරාගෙන සිටින්නෝය. උදෑසන සොම්‍යයත් දහවල කටුක රස්නයත් රාත්‍රියේ සොඳුරු බවත් ඔවුන් අපට උරුම කරදුන් දෑය. ඉතින් උන් කිසිවෙකුත් කිසිම කලක මියගොස් නැත. මිය යන්නේ අප පමණි. ඔවුන් කිසිදාක මියගොස් නැත්තා සේම මියයන්නේ ද නැත.**

නිවස තුළ සිට මැදිවියේ කාන්තාවක් අප දෙසට ඇවිද ආවාය. දුටු සැනින්ම ඒ ඔහුගේ මව විය යුතුයැයි මා හඳුනා ගත්තේ ඔහුගේ මුහුණේ වූ පියකරු වටකුරු මුහුණ කිසිදු අඩුවක් නොමැතිව ඇයට පිහිටා තිබූ නිසාවෙනි.

දීශා විසින් අප දෙදෙනා හඳුන්වා දීමෙන් අනතුරුව අපට දැනගන්නට අවැසි වූ ඔහු පිලිබඳ තොරතුරු ඇය අප ඉදිරියේ දෑසට උනනා කඳුළු බිඳු හැඳ උන් චීත්ත රෙද්දෙන් වරින් වර පිසදාහරිමිනි. මා කලේ ලොකු වැරැද්දක් බව ඒත්තු යනවිට ප්‍රමාද වැඩිය. යාන්තමින් හෝ යටපත් කරගනිමින් තිබූ ඇයගේ වේදනාව මා නැවත අලුත් කිරීම පිළිබඳව මා ගැනම කේන්තියන් නැග එනු මට දැනුණි. ඔහු ඉගෙනීමට රුසියෙකි. කලා අංශයෙන් විශ්ව විද්‍යාලයට සමත් වූව ද එයට පෙර ඔහුට රට එක වී තිබුණි. සියල්ල හැරදා ඔහු යුද හමුදාවට බැඳී ඇත්තේ එබැවිනි. රැකියාවට බැඳුනු දිනේ සිටම ඔහු සිය පඩිපත ඇයට එවා තිබූයේ සිය නිවස අලුතින් ගොඩ නැංවීමටත් සිය බාල සහෝදරයාට

හොඳින් ඉගැන්වීමටත්ය. ඈ කීදේ සත්‍යයක් ලෙස අපට පෙනුනේ නිවසේ එක් පසෙක ගොඩගසා තිබූ සිමෙන්ති කොට්ට කිහිපයක් මෙන්ම පරන ඉටි කොලයකින් වසා තිබූ මිදුලේ වූ වැලි ගොඩත් නිසාවෙනි.

උතුරේ සටන් ඇවිලී යත්ම ක්‍රියාන්විතය සඳහා එක් වූ ඔහු සතුරන්ගේ මෝටාර් ප්‍රහාරයකට මැදිව සිය ජීවන ගමන නිමාකොට තිබුණි. ඇය නිවස තුළින් ගෙන ආ කුඩා ජායාරූප ඇල්බමයක ඔහුගේ සම්පූර්ණ ජායාරූප කිහිපයක් පාසල් නිල ඇඳුමෙනුත්, ක්‍රීඩා කුසලානයක් අත දරා සිටිනා ජායාරූපයකිනුත් යුද හමුදා විසිරයාමේ උත්සවයක ජායාරූප කිහිපයකිනුත් සැරසී තිබුණි.

ඔහුගේ මවට ස්තුතිවන්ත වූ අප ආවාට වඩා බරක් සිත පුරවා ගනිමින් නැවත ත්‍රීරෝද රථයට ගොඩ වූයේ දෙදෙනාගේ හිස් වූ හුස්ම ඔහු ජීවත් වූ නිවස වටා පා කර හරිමිනි. "ෂික්... මහ මෝඩ කොල්ලෙක්. වීරයෙක් වෙන්න ගිහින් නිකන් මැරුම් කාල" දීශා පිටකළේ ඇගේ සිත තුළ වූ වේදනාවයි. මා කිසිත් නොකියා නිහඬවීමි. ආපසු එන ගමනේදී ඔහුගේ නිවසට එපිටින් වූ පොදු සුසාන භූමිය අසල මඳකට ත්‍රීරෝද රථයෙන් බැසගත් මමත් දීශාත් අලුතෙන් ගොඩ නගන ලද ඔහුගේ සොහොන් කොත කරා පිය නැගීමු. විස්සක් පමණ වූ පැරණි සොහොන් කොත් අතරින් ඔහුගේ සොහොන් කොත කැපී පෙනුණි. රතු සිමෙන්තියෙන් බඳින ලද සොහොන් පලකයෙහි වූයේ බස් නැවතුම්පලහි ඔබ්බවා තිබූ ජායාරූපයම විය. කිසිවෙකුත් විසින් දින කිහිපයක් පහන් දල්වන ලද බව කියාපාමින් නිවී ගිය මැටිපහන් කිහිපයකුත් අඩක් දැල්වී තිබූ ඉටිපන්දමකුත් සොහොන් කොත මත විය. අවට සැරසිලිකර තිබූ සුදුපැහැ ගොක් කොල තද දුඹුරු පැහැයට හැරී ඉර අව්වට කරකුට්ටන් වී තැන තැන ඒවා එල්ලා තිබූ නූල් පටවල්වලින් එල්ලා හැලෙමින් තිබුණි. මුලු වටපිටාවම ගෙන ආයේ ශෝකයත් වේදනාවත් වුවද ඔහු සිනාසෙන දෑසින් ස්ථාවරව තවමත් අපදෙස බලාසිටිනු මා ඒ දෙස බැලූ අවසන් වරටත් දැනුනි. සෙමෙන් මා අත තිබූ බෑගය විවර කළ මා එතුළ වූ රතු රෝසමල් පොකුර සොහොන් කොත

පරිස්සමට තැබුවෙමි. දීශා මා දෙස බැලුයේ වික්ෂිප්ත වූ දෑසිනි. මා මල් ගෙනු ඇතැයි ඇ අපේක්ෂා නොකළ දෙයකි. පරිස්සමට රතු පීත්ත පටියකින් ගැට ගැසූ මල් කලඹෙන් හමා ආයේ මුදු සිත සනසවන සුවඳකි.

එවලෙහි මා තුළින් නික්මුනු හුස්මවල තවත් වසර ගණනාවකට ඇතිවන්නට තරමේ කතාන්දර ගොඩක් ඔහුට අසන්නට ඇතැයි සිතමින් මම නිවස බලා ආවේ එලෙස මල් කලඹක් දුන් ප්‍රථම සහ එකම ආදරවන්තයා ඔහු ලෙස හිතේ සටහන් කරගනිමිනි. අදටත් මේ වනතුරුත් මා කිසිදු පිරිමියෙකුට මල් දී නොමැත.

මම මුලින්ම ඔහු ගැන ශෝක වීමි. තරුණ වයසින් සිය ජීවිතය අතහැර යෑම ගැන දුක් වීමි. විශේෂයෙන්ම ජයාරූපයේ පෙනෙන තරමේ කඩවසම් කොල්ලෙකු වූ විට. දෙවනුව මා ඔහු සමඟ කෝප වීමි. ඒ වෙනත් රස්සාවන් කොතෙකුත් තිබියදී ආමිකාරයෙකු වන්නට ඔහුට තිබූ පෙළඹවීම පිළිබඳව මෙන්ම උතුරේ සටන්වලට එකතු නොවී සාමාන්‍ය සෙබළෙකු ලෙස වෙනත් ප්‍රදේශයක සේවයට නොයා සිටියේ මන්දැයි අසමිනි. අවසානයේ මම ඔහුට ප්‍රේම කළෙමි. සිය ජීවිතය ගැන වුවද පරදුවට තබමින් දේශය වෙනුවෙන් සටන් වැදීමට ඔහුගේ සිත කොතරම් ශක්ති සම්පන්න දැයි සිතමින් මම ඔහුට ප්‍රේම කළෙමි. මේ සියල්ලම පැවතියේ ඔහුගේ කිසිම දවසක නොපියෙනා දෙනෙතත් තත්පරයකට විසි වතාවත්වක් ඇසිපිය සලනා මාගේ දෙනෙතත් අතර පමණි.

බසයක් එනතෙක් ගතවන විනාඩි විසිපහ තිහ අප දෙඩමළු වූ තරමක්...

මා හට මුලින්ම යුද හමුදාවට බැඳීමට උත්තේජනය සැපයුයේ ඔහු යැයි පැවසීම වැරදි නැත. නමුත්, පසුව එය තවත් තදබල ලෙසම අවැසි වූයේ එවකට මා උසස් පෙළ කරන කාලයේදී සංසරණය වූ වීඩියෝ පටයක් නිසාවෙනි. එහි වූයේ නිරායුද සෙබළු රැගත් ට්‍රක් රථයකට එල්ටීටීඊ සාමාජිකයන් පහර දෙන වීඩියෝවකි. බොහෝ සෙබළුන් ට්‍රක් රථය තුළම අවසන් සුසුම් හෙලා තිබූ අතර, යාන්තමින් අතක් පයක් හෝ සොලවනු දුටු සෙබළුන්ට ද එම පාදඩයන් විසින් කිසිදු හිතක්

**ජීවිතය හරිම පුදුමාකාරය. වරෙක වේදනාවක් විඳි සුලඟම වරෙක සනීපදායක විලසින් අප වෙත පැමිණ ඇත. යුද්ධය ගැන සත්‍ය කිසි කලෙක සාමාන්‍ය මිනිසුන් වන අපට දැන ගැනීමට නොහැකි වනු ඇත. එහෙත්, ඉඳහිටක හෝ එහි වූ රුදුරු බව "අට පාස් ආමී කාරයන්ට කළ හැකි දේ සහ කී බෝඩ් වීරයන්ට වීරයන් විය හැක්කේ ඩිජිටල් මතුපිටක පමණක්" යැයි දැන ගැන්මට හැරීම වටින්නේය.**

පපුවක් නොමැති උන් ලෙස පපු තුළට උණ්ඩ මුදාහැරියේ උන්ගේ දෙමළ බසින් සිනාසෙමින් ගී ගයමිනි. මෙය එකල කොතරම් ත්‍රාසයක් ගෙනාවේදැයි කියතොත් ඒ කෙරෙහිම ඇතිකරගත්තේ එසේ මෙසේ වෛරයක් නොවේ.

එදා හමුදාවට බැඳීමේ ආසාවට තිත තබන්නට සිදුවූ මුත් අදටත් අවස්ථාවක් ලදොත් මා එක පයක් නොව දෙපයම ඒ දෙසට තබනු නොඅනුමානය. නමුත්, අප වාසනාවන්තය.

අද වනවිට ඇවිලී යන යුද ගින්නක් නැත. සියල්ල සාමකාමීය. යහපත්ය. ඒ වෙනුවෙන් අපි ඇතුළු සියලු පරම්පරාවන් ඔබලාට ණයගැති වන්නෙමු.

ජීවිතය හරිම පුදුමාකාරය. වරෙක වේදනාවක් විඳි සුලඟම වරෙක සනීපදායක විලසින් අප වෙත පැමිණ ඇත. යුද්ධය ගැන සත්‍ය කිසි කලෙක සාමාන්‍ය මිනිසුන් වන අපට දැන ගැනීමට නොහැකි වනු ඇත. එහෙත්, ඉඳහිටක හෝ එහි වූ රුදුරු බව "අට පාස් ආමී කාරයන්ට කළ හැකි දේ සහ කී බෝඩ් වීරයන්ට වීරයන් විය හැක්කේ ඩිජිටල් මතුපිටක පමණක්" යැයි දැන ගැන්මට හැරීම වටින්නේය.

සටන්බිමෙහි උන් කිසිවෙක් මියගොස් නැත. උන් සැමදාම ජීවමානය. මිය ගිය ද නැවත නැවතත් ජීවය ලබන්නා උන්ය. අප හුස්ම ගන්නා සෑම වා බුබුලක්ම, කොළ පාටින් බබලනා සෑම ගහක් කොළක් මෙන්ම පිපී දිලිසෙනා සුවඳවත් මල් ද ගුම් නදින් පෙන විසිරුවමින් ගලා හැලෙනා සීතල දිය දහරා ද ඔවුහු දරාගෙන සිටින්නෝය. උදෑසන සෞම්‍යයත් දහවල කටුක රස්නයත් රාත්‍රියේ සොරුළු බවත් ඔවුන් අපට උරුම කරදුන් දෑය. ඉතින් උන් කිසිවෙකුත් කිසිම කලක මියගොස් නැත. මියයන්නේ අප පමණි. උන් කිසිදාක මියගොස් නැත්තා සේම මිය යන්නේ ද නැත.

යුද හමුදාව යනු තවත් එක් රැකියා කොට්ඨාසයක් නොව එය වෙනම මිනිසුන්ගෙන් සැදුම්ලත් ඒකකයක් යැයි මා සිතනුයේ සිය මිනිසුන්ටම එල්ලය මැනු උන්හටම කිසිදු අඩුවක් නොමැතිව ප්‍රතිකාර ලබාදෙන්නට තරම් ඔවුන් මානුෂීය වූ බැවිනි. එහෙයින් අපට ඇත්තේ ලොව ඉහළම මානුෂීය හමුදා බලකායක් බව තවත් කුමට කතා ද ?

ගෙවී නිම වෙන සෑම දවසකම අප සමස්ත ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් ඔවුන්ට මතකයකින් හෝ ස්තුතිවන්ත විය යුතුය. මන්ද, ඔවුන් නොසිටියේ නම් අද මේ වනවිටත් කොහේ හෝ තැනක බසයක් දුම්රියක් කඩ පිලක් පාසලක් හෝ සම්පූර්ණ ලෙස ගමක්ම හෝ විනාස වී දුම් නගමින් තිබෙනු ඇති බව අප අමතක නොකළ යුතුය. එහෙත් වරෙක ප්‍රකාකරත් කියූ පරිදි සිංහලයාට සියල්ල මතක දින හතක් පමණක් යැයි යන්න සත්‍ය කරමින් බොහෝ අය ඒ පිළිබඳව කතා කරන්න හෝ මැලිවෙති. ඉඳහිට ඔවුන්ගේ සේවය අවැසි වූ කළ නැවතත් පොළොවෙන් එකවර නැගී ආ දියමන්තීන් මෙන් ඔවුන් ගේ පුනරුප්පත්තීන් පුල පුලා සෑම වැනලයකම පුවත් පතකම දිග හරින්නේය.



**ලසිතා චලනි**

BSc( Hons)
professional nursing
(UK),BSc psy(UK)

# වෘත්තීය ප්‍රගමන පාඨමාලා වැදගත් වන්නේ ඇයි?





වර්තමානය වනවිට සීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක, යුද හමුදාවේ සාර්ථකත්වය තීරණය වන්නේ එහි ශක්තිය සහ විනය මත පමණක්ම නොව එහි සාමාජිකයන්ගේ දැනුම, කුසලතා සහ වෘත්තීයභාවය ද මතය. යුද හමුදා සාමාජිකයන් සඳහා වෘත්තීය අධ්‍යාපනය යනු නව අභියෝගයන්ට විශ්වාසයෙන් මුහුණදිය හැකි බුද්ධිමත් සහ දක්ෂ මෙන්ම අවශ්‍යතාව අනුව සිය සේවය කරගෙන යාමට එසේත් නැත්නම් වැටුණු තැනක රෝපණයවීමට ඇති හැකියාවයි.

වෙනත් වෘත්තීන්ට වඩා විශේෂත්වයක් ඇති හමුදා සේවය යනු අඛණ්ඩ අධ්‍යාපනය, තාක්ෂණික දැනුම සහ නව සංකල්ප පිළිබඳ යාවත්කාලීන කර ගැනීම මත පදනම් වූ වෘත්තියක් ලෙස හැඳින්විය හැක. එහිදී, ඔවුනට පීඩනයන් යටතේ පවා නිවැරදිම තීරණ ගැනීමේ හැකියාව ලැබෙනු ඇත. එමඟින් යුද්ධමය ක්‍රම හා පරිපාලනමය අත්හදා බැලීම්, විපත් කළමනාකරණය සහ සාමාරක්ෂක මෙහෙයුම් තුළදී සිය භූමිකාව මැනවින් නිරූපණය කිරීමට හැකිවනු ඇත.

වෘත්තීය ප්‍රගමන පාඨමාලා හැදෑරීම තුළින් හුදෙක් පුද්ගලමය වශයෙන් ප්‍රගමනය කරා පමණක්ම නොව නියැලෙන රාජකාරිය හෝ එහි සංස්ථාවට එය සෘජුවම බලපෑමකට ලක්වනු ඇත. එනම්, පුද්ගලයකු තමන් නියැලෙන ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට, රඳාපැවැත්මට මෙන්ම එහි අනාගතය තීරණය කිරීමට බලපානු නිසැකය. ඒ නිසාම වෘත්තීන් තුළ විවිධ වූ වෘත්තීය ප්‍රගමන පාඨමාලා, විභාග සහ පුහුණුවීම් අන්තර්ගත කර ඇත. එය පුද්ගලයා තුළින් සමස්ත වෘත්තියෙහි සාර්ථකත්වය සහ තිරසාරබව ළඟා කරගැනීමට යොදාගන්නා න්‍යායකි.

### වෘත්තීය හමුදා අධ්‍යාපන පාඨමාලා (Professional Military Education Course)

නිලධාරියකුගේ මෙන්ම සෙසු නිලයකුගේ වෘත්තීය ජීවිතයේ සෑම අදියරකදීම දැනුම සහ කුසලතා ලබාදීම සඳහා PME ව්‍යුහගත කර ඇත. මූලික නිලධාරී කෙඩෙට් පුහුණුවේ සිට උසස් මාණ්ඩලික සහ යුද විද්‍යාලය දක්වා දක්වා සෑම පාඨමාලාවක්ම සැළසුම් කර ඇත්තේ ක්‍රමානුකූලව ඉහළ වගකීම් සඳහා හමුදා නිලධාරීන් සූදානම් කිරීම සඳහාය.

### මූලික පුහුණු සහ තරුණ නිලධාරීන්ගේ පාඨමාලා (Basic Training and Young Officers)

ඕනෑම වෘත්තීය සොල්දාදුවකුගේ හෝ නිලධාරියකුගේ නායකත්ව, උපක්‍රම සහ ආචාර ධර්ම පිළිබඳ මූලික පදනම සහ පුහුණුව තරුණ නිලධාරීන්ගේ පාඨමාලා සමඟ ආරම්භ වේ. සිවිල්ගත හමුදා සාමාජිකයින් විනයගරුක යුද්ධ හමුදා සාමාජිකයකු බවට පත්කිරීම මෙම අවධියේදී සිදුවේ. ශාරීරික විඳදරා ගැනීම, ආයුධ හැසිරීම, ක්ෂේත්‍ර ශිල්පය සහ එහි මූලික කරුණු කෙරෙහි මෙහිදී අවධානය යොමු කරයි.

### මධ්‍යම වෘත්තීය පාඨමාලා (Mid-Carrer Course)

තම සේවාවේ මැද භාගයේදී ඉදිරියට යාමත් සමඟ කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලා, මාණ්ඩලික නිලධාරී පාඨමාලා වැනි පාඨමාලා තුළින් වෘත්තීය ප්‍රගතියට අවශ්‍ය මූලික යුද්ධමය දැනුම සංකීර්ණ මෙහෙයුම් සැළසුම් කිරීම හා තීරණ ගැනීමේ හැකියාව දියුණු කිරීම දක්වා මෙම අදියරයේදී පුහුණුව වර්ධනය කර ඇත. කුඩා ඒකක පාලනයෙන් ඔබ්බට විශාල අංශ, ආයතන තුළ පවා සංනිවේදනය සැළසුම් කිරීම බහු ක්ෂේත්‍රයන්හි රාජකාරිමය හැකියාව ද වැඩි දියුණු කරමින් නිවැරදි විසඳුම් සොයා ගැනීමට ඇති හැකියාව මෙම අදියරේදී ප්‍රායෝගිකව මෙන්ම න්‍යායාත්මකව පුහුණු කරයි.

ඒ අනුව සේවය තුළදී එහි ආයතනමය හෝ වෘත්තීමය ප්‍රගමනය උදෙසා පවත්වනු ලබන මෙම වෘත්තීය ප්‍රගමන පාඨමාලා, පුහුණු වැඩසටහන් ආදිය හුදෙක් හමුදා සාමාජිකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය තුළින් සමස්ත සංස්ථාවේම උන්නතියට ප්‍රගමනයට උරදීමක් සිදුකරනු ඇත. එහිදී, හමුදා සාමාජිකයන් වන අපගේ වගකීම වනුයේ වෘත්තීය නිපුණත්වය උදෙසා මෙන්ම යුද්ධ හමුදාවේ අනාගත සුරක්ෂිතතාවය සඳහා මෙම ප්‍රගමන පාඨමාලා මෙන්ම පුහුණු වැඩසටහන් සඳහා සිය දායකත්වය ලබාදීමයි.

*කපිතාන් කේවීඑන් ලක්මාලි*
*ශ්‍රීලයුපොදුසේබ*





# අන්තර්ජාල අපරාධ පැමිණිලි වැඩිවෙලා

"වඳුරාට දැළිපිහිය අහුවුණා වාගේ" යනුවෙන් කියමනක් අපි අසා ඇත්තෙමු. දැළිපිහිය දෙපැත්තට වනන විට කැපෙන බව නොදැන වඳුරා එය හැරෙන හැරෙන පැත්තට වනයි. එයින් සිදුවෙන විනාශය පිළිබඳව ඒ සත්වයාට දැනුමක් නැත. එහෙත් මනසින් උසස් අප අද වඳුරාටත් අන්ත අයුරින් දැළිපිහියකට වඩා මුවහත් වූ "අන්තර්ජාලය" භාවිත කරන අයුරු වර්තමානය තුළ පෙනෙන්නට ඇත. ගෝලීයකරණයේ අත්වාරුව වූ අන්තර්ජාලය තුළ හැසිරෙමින් කවුරුන් හෝ බිලි බා ගැනීමට කුරුමානම් අල්ලන "අන්තර්ජාල අතරමංවූවෝ" සම්බන්ධයෙන් මේ වෙන විට දැඩි කතා බහක් ඇති වී තිබෙන්නේ දිනෙන් දිනම වර්ධනය වෙන අන්තර්ජාල අපරාධ හේතුවෙනි.

ආදරයෙන් අන්ධවීම, ආදරයෙන් පරාද වීම නොඑසේනම් පළිගැනීම ආදි සිතුවිලි සමඟ මෙන්ම වංචා කිරීම් ආදිය සඳහා මහඟු තෝතැන්නක් ලෙසින් අද වනවිට මේ අන්තර්ජාලය භාවිත වෙමින් පවතී. සැබැවින්ම අන්තර්ජාලය යනු සාම්ප්‍රදායික ක්‍රම අභිබවා යන සූක්ෂම මාධ්‍යයකි.

වර්තමානයේදී අප තාක්ෂණික වශයෙන් ලබා ඇති දියුණුව පිළිබඳව කතා කිරීමේදී තාක්ෂණ ලෝකයේ විප්ලවීය සොයා ගැනීම "පරිගණකය" ලෙසින් හැඳින්වීම වරදක් නැත. එමෙන්ම අද වන විට පරිගණකයට නොදෙවෙනි තැනක් අප අත රැඳි ජංගම දුරකතනයට ද හිමි වෙයි. පාසල් යන වයසේ දරුවන් අත පවා අද වන විට ස්මාර්ට් ජංගම දුරකතනයක් දක්නට නොලැබෙන්නේ ඉතාමත් කලාතුරකිනි. පාසල් කාලසීමාවෙන් පසු කෙළි දෙළෙන් කල් ගෙවූ දරුවන් අද වන විට ජංගම දුරකතනයෙන් හෝ පරිගණකය මාර්ග යෙන් ඔවුන්ගේම ලෝකවල්වල තනිවී ඇති බව හොඳින් බැලූ කළ පෙනේ. ඇතැම් දෙමාපියෝ ජංගම දුරකතන මෙන්ම පරිගණක සමග තනිවන දරුවා ගැන කිසිදු සැලකිල්ලක් නොදක්වති. "අපරාදේ කියන්න බෑ රට වටේ රවුම් ගහන්නේ නැතුව ගෙදරට වෙලාම ඉන්නවා. නැත්නම් අද සමාජේ හැටියට යාළුවෝ විශ්වාස කරන්න බෑනේ" එවන් දෙමාපියන් සිය මතය එසේ ප්‍රකාශ කරනු අපට අසන්නට ලැබෙයි. එහෙත් තම දරුවා රට වටේ රවුම් ගැහුවා නම් හොඳයැයි ඒ දෙමාපියන්ට වැටහෙන විට දරුවා බොහෝ දුර ගොස් හමාරය.

පරිගණකය ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ සුදු කරපටි මධ්‍යස්ථානය, පරිගණක ප්‍රතිවෛරස් හා සමීක්ෂණ මධ්‍යස්ථානය මෙන්ම පරිගණක ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය ආදී විවිධ ආයතන ක්‍රියාත්මක වෙන අතර ශ්‍රී ලංකාව තුළදී නම් ශ්‍රී ලංකා හදිසි

ප්‍රතිචාර සංසදය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන ඒකකය මෙන්ම ඩිජිටල් වෝහාරික විද්‍යාගාරය සහ පුහුණු ඒකකය ද ක්‍රියාත්මක වෙයි.

මෙහිදී, ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය විශේෂයෙන්ම පරිගණක ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් ගත් කළ ඇතැම් අන්තර්ජාල මෘදුකාංගවලින් සිදුවෙන බලපෑම් පාලනය කිරීම සඳහා උදව් කරනු ලබන ආයතනයක් ලෙසින් හඳුනාගනු ලැබුවද විශේෂයෙන්ම ගෙවීම් උපක්‍රම පිළිබඳ වංචා පනත ප්‍රකාරව සිදුකරන විමර්ශනවලදී පරිගණක ආශ්‍රිත දත්තයන් ආදිය ලබා දෙමින් විමර්ශනවලට සහාය දැක්වීමක් සිදුකරනු දක්නට ලැබෙයි.

පරිගණක අපරාධ සම්බන්ධයෙන් විමර්ශනය සිදුකෙරෙන අවස්ථාවක ශ්‍රී ලංකාව තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක වෝහාරික විද්‍යාගාර පහසුකම ආරම්භ වන්නේ 2017 වර්ෂයේදීය. මේ වන විට මෙරට පරිගණක ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ සුවිශාල මෙහෙයක් ඉටුකරමින් මෙම ඒකකය තුළ පුහුණු ඒකකයක් ද පිහිටුවා දිනෙන් දින වර්ධනය වෙන මෙම අන්තර්ජාල අපරාධවලින් ඊට ගොදුරුවන්නන් මුදවා ගැනීමේ කටයුත්තක නියැළී සිටියි.

අන්තර්ජාල අපරාධ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපර්තමේන්තුව වෙත දිනකට පැමිණිලි 20ත් 25ත් අතර ප්‍රමාණයක් ලැබෙන අතර දිවයිනේ විවිධ ප්‍රදේශවලින් මෙම පැමිණිලි ලැබෙන බව එම දෙපාර්තමේන්තුව සඳහන් කරයි. ළමයින් කන්තාවන් මෙන්ම පුරුෂයන් සම්බන්ධයෙන් ද විවිධාකාර වූ පැමිණිලි ඒ අතර වෙන බවත්, මෙම පැමිණිලිකරුවන් අතර, සමාජයේ ඉහළ තලවල වැජඹෙන නීතිඥවරුන්, වෛද්‍යවරුන්, මහාචාර්යවරුන්, ක්‍රීඩකයින්, හමුදා නිලධාරීන්, හෙදියන් ගුරුවරුන් ඇතුළු පිරිස් ද හමුවෙන බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සඳහන් කරන්නකි.

වර්තමානය වනවිට අන්තර්ජාලය තුළ වැරැද්දට පෙළඹෙන ප්‍රධානම අංගය ලෙසින් Facebook, එනම් මුහුණු පොත හැඳින්විය හැකිය. දන්නා නොදන්නා සියල්ලන්ම සිය මුහුණු පොතේ මිතුරන් බවට පත්කර ගන්නා උදවිය අවසානයේ දැවෙමින් තැවෙමින් අතපසුවීම පිළිබඳව

> වර්තමානය වනවිට අන්තර්ජාලය තුළ වැරැද්දට පෙළඹෙන ප්‍රධානම අංගය ලෙසින් "Facebook" එනම් මුහුණු පොත හැඳින්විය හැකිය. දන්නා නොදන්නා සියල්ලන්ම සිය මුහුණු පොතේ මිතුරන් බවට පත්කර ගන්නා උදවිය අවසානයේ දැවෙමින් තැවෙමින් අතපසුවීම පිළිබඳව විස්සෝප වෙයි. දවල්ට උයන හොද්ද පවා මුහුණු පොතට නිදහස් කරන ඇතැම් අය ඒ සඳහා "Like" ලැබෙන තුරු දැස් දල්වාගෙන සිටින්නේ නිවාඩු දවසක් නම් මුළු දවසම පරිගණකයේ හෝ ජංගම දුරකතනයේ මුහුණ ඔබාගෙනය.

විස්සෝප වෙයි. දවල්ට උයන හොද්ද පවා මුහුණු පොතට නිදහස් කරන ඇතැම් අය ඒ සඳහා "Like" ලැබෙන තුරු දැස් දල්වාගෙන සිටින්නේ නිවාඩු දවසක් නම් මුළු දවසම පරිගණකයේ හෝ ජංගම දුරකතනයේ මුහුණ ඔබාගෙනය. ඒ තරමටම මේ මෙවලම අවභාවිත වී ඇත. මෙරට රාජ්‍ය සේවකයින් වැඩකරන පැය අට තුළ පැය දෙකහමාරක් පමණ මුහුණු පොතේ සැරිසරන බවට මෑතකදී කළ සමීක්ෂණයකින් හෙළිකර ඇත. හොඳට නරකට දෙකට කටමය කියා එදවස පිරුළු සිහියට නැඟුණද අද වෙන විට හොඳට නරකට දෙකට "චැට්" මය කියා වෙනස් කළ හැකිය.

කෙසේ වෙතත් වර්තමානය වෙන විට මෙම පරිගණක ආශ්‍රිත එනම් අන්තර්ජාලයේ අපරාධ සම්බන්ධයෙන් ගොදුරක් බවට පත්වෙන විවිධාකාර පුද්ගලයින් පිළිබඳව මාධ්‍ය තුළින් විටින් විට තොරතුරු ගෙන එමින් ජනතාව දැනුම්වත් කරයි. එහෙත් ඒවා ගඟට කැපූ ඉනි මෙනි.

නවීන තාක්ෂණයෙන් යුතු මේ මාධ්‍යකරණය තුළින් කාන්තාවන්ට හා ළමුන්ට පමණක් නොව තරුණයන් වෙතද විහිදෙමින් පවතින්නේ ඒ ආකාරයටය. අපරාධකරුවන් විසින් නොයෙක් උපක්‍රම අනුගමන කරමින් අපරාධ සඳහා නව ආරක් හඳුන්වා දෙයි. එසේම, එය කෙසේ කොයි ආකාරයෙන් සිදුවෙන්නේ දැයි කිව නොහැකියි. අපරාධකරුවා අපරාධයට ගොදුරුවන්නාගේ දුර්වලම තැන අල්ලා ගනු ලබයි. ගොදුරුවන්නාගෙන්ම ඔහුගේ වතගොත අසා දැනගන්නා අපරාධකරු ඌරාගේ මාළු උරා පිටේ තියා කපන්නේ ඉන් අනතුරුවය.

මෙවැන්නන්ට ගොදුරුවීමෙන් පසු ජීවිතය නැතිකර ගැනීමට පෙළඹෙන එහෙත් අවදානමට පෙර අවධානය යන්න සිත්හි තබා ගනිමින් කටයුතු කරන්නේ නම් බොහෝ අපරාධවලින් මිදීමේ හැකියාව නැත්තේ ම නොවේ.

1983 අංක 22 දරන අසභ්‍ය ප්‍රකාශන (සංශෝධන) පනත සම්බන්ධයෙන් සැලකිල්ලට ගැනීමේදී කාන්තාවක හෝ පුරුෂයකු තම නිරුවත පෙන්වීම, ඒ සඳහා පෙනී සිටීම, ප්‍රචාරණය සහ සන්තකයේ තබා ගැනීම ද වරදක් ලෙසින් දක්වා ඇත.

මෙම පනතේ වගන්ති ප්‍රකාරව මෙන්ම 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතින් මෙන්ම ලංකා දණ්ඩ නීති සංග්‍රහ පනත ප්‍රකාරව ද මෙවන් සිද්ධීන් හි සැකකරුවන්ට අධිකරණය මගින් දඬුවම් නියම කරනු ලබයි. ඒ නීති කෘත්‍යයයි.

අන්තර්ජාලයේ සැරිසරන සෑම පුද්ගලයකු ම සත්‍ය වූ අය වෙතැයි නොසිතිය යුතුය. විශේෂයෙන්ම මෙවන් අපරාධවලින් බේරීමට නම් තමන්ගේ හිත මිතුරන්ගෙන් පමණක් මුහුණු පොත පුරවා ගැනීම මෙන්ම අනවශ්‍ය අය ඉවත් කර ගැනීමද කළ යුතු වෙයි. එසේම, යාළු මිත්‍රයන් පමණක් මිස නොදන්නා අයවලුන්ගේ ඇරයුම් ප්‍රතික්ෂේප කිරීමද මේ අපරාධයන්ගෙන් තරමක් දුරට හෝ මිදීමේ උපක්‍රමයකි.

මෙවැන්නන්ට ගොදුරුවීමෙන් පසු ජීවිතය නැතිකර ගැනීමට පෙළඹෙන එහෙත් අවදානමට පෙර අවධානය යන්න සිත්හි තබා ගනිමින් කටයුතු කරන්නේ නම් බොහෝ අපරාධවලින් මිදීමේ හැකියාව නැත්තේ ම නොවේ.



**ලුතිනන්**
**ඒබීඅයි**
**ලක්ෂිත**




# යුද කලාව

මෙයින් වසර 2500කට පමණ පෙර සන්-ත්සු තුමා චීනයේ ප්‍රභූ පවුලක උත්පත්තිය ලැබීය. යුද සේනාධිපති ලෙස සිය රාජ්‍යයට සේවය කර ඇති එතුමා වඩාත් ගෞරවයට පාත්‍ර වී ඇත්තේ ඔහු විසින් ලියන ලද "යුද කලාව" නමැති ග්‍රන්ථය හේතුවෙනි. යුද කලාව කෘතිය වසර දෙදහස් පන්සීයක් තරම් දීර්ඝ කාලයක් තිස්සේ නොනැසී පවතින්නේ එහි අඩංගු යුද්ධ සිද්ධාන්ත වර්තමාන යුද නායකයින්ටද එකසේ ප්‍රයෝජනවත් වන නිසාය. වසර ගණනාවක් ගත වී තිබුනත් එහි ප්‍රායෝගික බවේ වැඩි වෙනසක් සිදු වී නොමැති හෙයින් එය අතීතයට මෙන්ම වර්තමානයටද එකසේ වැදගත් වේ. ලෝකයේ රටවල් ගණනාවක විවිධ භාෂාවන් විශාල ප්‍රමාණයකට පරිවර්තනය වී ඇති මෙම වටිනා කෘතිය තුළින් යුද කලාව පිළිබඳ සුවිශේෂ චින්තන රටාවක් හා චර්යා ධර්ම රටාවක් ඉදිරිපත් කරයි. එය ගැඹුරු මනෝ විද්‍යාත්මක දැක්මක්ද අන්තර්ගත වේ. මෙය එක්තරා විධියක යුද කලා සූත්‍රයක්ද වේ. යුද කලා කෘතිය ආරම්භ කරමින් සන්-ත්සු තුමා විසින් කර ඇති මෙම ප්‍රකාශයෙන්ම එහි ඇති වැදගත්කම මනා ලෙස පිළිඹිබු වේ.

"යුද කලාව රාජ්‍යයකට ඉතාම වැදගත් වන්නේය. යුද කලාව වූ කලී ජීවිතය හා මරණය පිළිබඳ කරුණක් වන අතර, පෞද්ගලිකව ජීවත් වීමේ හෝ විනාශ වී යාමේ මාර්ගයක් වන්නේය. එහෙයින් මෙය නොසලකා හැරිය යුත්තක් නොව විමර්ශනය කළයුතු විෂයක් වන්නේය."

සන්-ත්සු තුමාට අනුව යුද කලාව පාලනය කරන මූලික කරුණු හයකි.

1. සදාචාරය 2. නීතිය 3. මෝක්ෂය 4. මිහිකත 5. සේනාධිපති 6. විනය හා ක්‍රමවේදය

## සදාචාර නීතිය

මෙයින් අදහස් කරන්නේ රටක වැසියන් තම පාලකයා කෙරෙහි තබන පූර්ණ විශ්වාසයයි. සැබෑ පාලකයා වැසියන්ගේ මෙම විශ්වාසය තහවුරු කළයුතු වේ. වැසියන් තම පාලකයා ගැන සැක නොකරයි. එනිසා ඔවුන් කිසිදු ආකාරයකට බිය නොවේ. එසේම යම් විටක තම ජීවිතයද නොසලකා තම පාලකයා වෙනුවෙන් මිය යැමට වුවද සූදානම් වේ.

මෙයින් කාලගුණික තත්වය, දේශගුණික තත්වය විමර්ශනය කෙරේ. එනම් දහවල, රාත්‍රිය, සිසිලස, උණුසුම හා සෘතු භේදයන්ද සැලකිල්ලට ගැනේ.

## මිහිකත

මෙයින් භූමියේ පිහිටීම, දුරස්ථ බව, සමීප බව, විශාලත්වය, කුඩා බව, භූමියේ අනතුරු, පුළුල්බිම්, පටු කපොලු මෙන්ම ජීවිතවල වාසනාව අවාසනාව ආදිය ද සැලකිල්ලට ගනී.

## සේනාධිපති

යුද නායකයන්ගේ ප්‍රඥාව, ගුණාංග, අවංකභාවය, යහපත් බව, නිර්භීතකම හා දැඩි විනයානුකූලභාවය මෙයින් විස්තර කෙරේ.

## විනය හා ක්‍රමවේදය

මේ යටතේ විස්තර වන්නේ හමුදාව කණ්ඩායම් අනුකණ්ඩ වශයෙන් සංවිධානය කිරීම, නිලධාරීන්ගේ තානාන්තර අනුපිළිවෙල, සැපයුම් මාර්ග, නඩත්තු වියදම්, පාලනය ආදියයි. ඉහත කී මූලික කරුණු පහ සෑම යුද නායකයකු විසින්ම මනාව ප්‍රගුණ කොට තිබිය යුතු බවටත්, මේවා හොඳින් දන්නා තැනැත්තා යුද්ධයේ ජයග්‍රහණය ලබන බවත්, නොදන්නා තැනැත්තා පරාජය ලබන බවත් සන්-ත්සු තුමා පවසයි.

යුද්ධයක ජයග්‍රහණය හෝ පරාජය පිළිබඳව නිසැක අනාවැකි පළකිරීමට හැකි වන්නේ තම පිලත්, සතුරු පිලත් අතර, පහත සඳහන් කරුණු පිළිබඳව තුලනාත්මකව කරුණු සොයා බැලීමකින් පසුව බව ඔහු වැඩිදුරටත් තම කෘතිය තුලින් පවසයි.

1. දෙපිලේ නායකයන් දෙදෙනාගෙන් කවරෙකු සදාචාරාත්මක නීතිය අනුව කටයුතු කරයිද?
2. වඩාත් හැකියාව ඇත්තේ කිනම් පිලේ සේනාංකාධිපතියන්ටද?
3. මෝක්ෂය හා මිහිකත පිළිබඳ (දේශගුණය හා භූමිය පිළිබඳ) වාසිය ඇත්තේ කුමන පාර්ශ්වයටද?
4. වඩාත් දැඩි විනයක් පවතින්නේ කුමන පිලේද ?
5. වඩාත් ශක්තිමත් වන්නේ කුමන පාර්ශවයද?
6. උසස් පුහුණුවක් ලැබූ නිලධාරීන් හා සෙබළුන් සිටින්නේ කුමන පාර්ශ්වයේද?
7. දඬුවම් කිරීම මෙන්ව ත්‍යාග ප්‍රධානය කිරීම සඳහා අඛණ්ඩ වූ ක්‍රියාවලියක් පවතින්නේ කුමන පාර්ශ්වයේද?

ඉහත දක්වා ඇති කරුණු හේතු කරගෙන තුලනාත්මක විමසීමක් කිරීමෙන් යුද්ධයේ ජයග්‍රහණය හෝ පරාජය පිළිබඳ අනාවැකි ප්‍රකාශ කළහැකි බව පවසන සන්-ත්සු සෙන්පති තුමා සෑම සේනාධිනායකයෙකුම මෙම කරුණු පිළිබඳව දැඩි අවධානයක් යොමු කළයුතු බව පවසයි.

"යුද කලාව රාජ්‍යයකට ඉතාම වැදගත් වන්නේය. යුද කලාව වූ කලී ජීවිතය හා මරණය පිළිබඳ කරුණක් වන අතර, පෞද්ගලිකව ජීවත් වීමේ හෝ විනාශ වී යාමේ මාර්ගයක් වන්නේය. එහෙයින් මෙය නොසලකා හැරිය යුත්තක් නොව විමර්ශනය කළයුතු විෂයක් වන්නේය."

## ව්‍යාජය හා රැවටීම

යුද්ධය යනු ව්‍යාජය හා රැවටීම සහිත ක්‍රියාවක් බව සන්-ත්සු තුමා පවසයි. එනිසා පහත සඳහන් ක්‍රියා අනුගමනය කිරීම ජයග්‍රහනයට හේතුවේ.




1. පහරදීමේ හැකියාවක් අප සතුව පවතින විට අප නොහැකියාවෙන් සිටින බව ඇඟවිය යුතුය. සතුරා බලය යොදවන්නට සැරසෙන විට අප අකර්මණ්‍යව සිටින බව ඇඟවිය යුතුය.
2. අප සමීපව සිට පහර දෙන විට දුරින් සිට පහර දෙන බව ඇඟවිය යුතුය. දුරින් සිට පහර දෙන විට සමීපව සිට පහර දෙන බව ඇඟවිය යුතුය.
3. සතුරාට සෑම විටම ඇමක් දමා රවටාගෙන සිටිය යුතුය. ඒ ඇම දමා ගැනීම තුළින් ඔවුන් ව්‍යාකූලතාවයට පත්කර විනාශ කළ යුතුය.
4. සතුරා සෑම අංශයකින්ම ආරක්ෂිතව සිටින්නේ නම් සූදානමින් සිටින්න. ඔහු බලසම්පන්නනම් මගහැර යන්න.
5. සතුරා ඉක්මනින් කිපෙන සුලු නම් තව තවත් ප්‍රකෝප කරවන්න. සතුරා, අප පිළිබඳව පහත් කොට සලකන්නේ නම් ඔහු තව තවත් උඩඟු කරවන්න.
6. සතුරා විරාමයක සිටීනම් ඔහු තව තවත් මහන්සියට පත් කරවන්න. ඔහුගේ බළසේනාවන් ඒකරාශි කර ඇත්නම් භේදබින්න කරවන්න.
7. අනපේක්ෂිත මොහොතක කඩාවදින්න. ඔහු සූදානමකින් තොරව සිටින අවස්ථාවක් බලා පහර දෙන්න. ජයග්‍රහණයට හෝ පරාජයට හේතු වෙන මෙම අවස්ථාවේ රහස් බව රැකගන්න.

සටනේ යෙදී සිටින විට ජයග්‍රහණය පමා වීමත් දීර්ඝකාලීනව යුද්ධය පැවතීමත් හේතු කොට සෙබළුන්ගේ ශක්තිය මොටවන බව පවසන සන්-ත්සු තුමා ඒ තුළින් රාජ්‍යයේ ධන සම්පත් ප්‍රමාණයද හීන වී භාණ්ඩාගාරයද හිස්වන බව පවසයි. ඔබගේ සෙබළුන්ගේ ශක්තිය හීන වී ඇති බවත්, රාජ්‍ය මුදල් නොමැති බවත්, අවි ආයුධ මොට වී ඇති බවත්, සම්පත් හීනවී ඇති බවත්, සතුරා වටහාගත හොත්, එම තත්වයෙන් ප්‍රයෝජන ගැනීමට සතුරා ක්‍රියාත්මක වන බව පවසන ඔහු, කොතරම් බුද්ධිමත් නායකයෙකුට වුවද එයින් ඇති වන අයහපත් ප්‍රතිවිපාක මැඩ පැවැත්විය නොහැකි බව පවසයි. ඒ නිසා යුද්ධය ඉක්මනින් මුග්ධ ලෙස ජයග්‍රහණය ලැබීම පිළිබඳ

බලාපොරොත්තු තැබිය නොහැකි බව පවසන ඔහු යුද්ධයේ දීර්ඝ පමාව තුලින්ද යහපත් ප්‍රතිඵල ලැබූ රටක් නොමැති බවත් පවසයි. එසේම සටන මෙහෙය වීමේදී ඇතිවන අවාසි සහගත තත්වයන් පිළිබඳව දැනුමක් නැති තැනැත්තාට සටනේ වාසි ගැනද දැනුමක් ලබාගත නොහැකි වෙයි.

## යුද්ධයේ සම්පත් පාලනය

යුධ ශිල්පයේ දක්ෂයන් විටින් විට නැවත නැවත සෙබළුන් බඳවා ගැනීමක් සිදු නොකරන බවත් සැපයුම්, රථ වාහන නැවත නැවත ධාවනය නොකරන බවත් පවසයි. සටනට අවශ්‍ය යුධ අවි තම රාජ්‍යයෙන් ලබාගත යුතු බවත් එහෙත් හමුදාවට අවශ්‍ය ආහාර පාන සතුරු රාජ්‍යයෙන් පැහැරගත යුතු බවත් පවසන සන්-ත්සු තුමා මේ හේතුවෙන් රට තුළ ආහාර හිඟයක් ඇති නොවන බව පවසයි.

දුර බැහැර ප්‍රදේශයන්ට ආහාරපාන සැපයුම් කිරීමට සිදු වීමෙන් රාජ්‍යයේ භාණ්ඩාගාරය හිස්වී රට දරිද්‍රතාවයට පත්වේ. එවිට පාරිභෝගික භාණ්ඩවල මිළ ඉහළ යයි. එම නිසා රටේ ජනතාවට අදික ජීවන බරක් විඳින්නට සිදුවේ. බදු ගෙවීමට ද සිදුවේ. රටේ යැපුම් තත්වය බිඳ වැටේ. මේ ආකාරයෙන් සම්පත් හිඟවේ. යුධ වියදම් සඳහා වැයවන මුදල් වැඩි වූ විට රට ආරාජික තත්වයට පත්වන බව ඔහු තම කෘතියෙන් පවසා සිටී.

මෙම හේතූන් නිසා සතුරාගේ ධනය උදුරා ගැනීම ඉතා වැදගත්කොට සැලකිය යුතු බව පවසන සන්-ත්සු තුමා සටනේදී සතුරාගේ ධන සම්පත් පැහැර ගන්නා සෙබළුන්ට ඒවායේ වටිනාකම අනුව දිරි ගැන්වීමේ ත්‍යාග ප්‍රදානය කළයුතු බව පවසයි. එසේම අත්අඩංගුවට පත්වන සෙබළුන් හට කාරුණිකව සලකා රඳවාගත යුතු බව පවසන ඔහු ඒ සතුරන් ජයග්‍රහණය කිරීමට හේතුවන බව පවසයි.

මෙම කරුණු හේතුවෙන් සංග්‍රාමයේ අරමුණ විය යුත්තේ ක්ෂණික ජයග්‍රහණය මිස දික්ගැස්සුන යුද්ධයක් නොවන බව පවසන සන්-ත්සු සෙන්පති තුමා දක්ෂ සේනාධිපතිවරයා රටකට සාමය ගෙන දෙන්නා මෙන්ම රටේ ජනතාවගේ ඉරණම තීන්දු කරන පුද්ගලයා වන බවද පවසා සිටි.

*SUNTZU **විසින් රචිත** THE ART OF WAR **කෘතිය ඇසුරිනි.***

කර්නල් එම්පීපී පෙරේරා (විශ්‍රාමික) ශ්‍රීලයුපුබ

---

## තට්ටු කිරීමේ ගාස්තුව



මම පුවත්පත් බෙදාහරින එක් නිවසක තැපැල් පෙට්ටිය අවහිර වී ඇති බැවින්, මම දොරට තට්ටු කළෙමි.

අස්ථිර පියවර තබන මහලු මිනිසෙක් වන ඩේවිඩ් මහතා සෙමින් දොර විවෘත කළේය.

මම ඇසුවෙමි, "සර්, ඔබේ තැපැල් පෙට්ටිය අවහිර වී ඇත්තේ ඇයි?"

ඔහු පිළිතුරු දුන්නේ, "මම හිතාමතාම එය අවහිර කළෙමි" යනුවෙනි.

ඔහු සිනාසෙමින් තවදුරටත් මෙසේ පැවසීය, "ඔබ සෑම දිනකම මට පුවත්පත ලබාදිය යුතුයි. කරුණාකර දොරට තට්ටු කරන්න හෝ සීනුව නාද කර එය මට පෞද්ගලිකව දෙන්න."

මම ප්‍රහේලිකාවක් වී පිළිතුරු දුන්නෙමි, "ඇත්තෙන්ම, නමුත් එය අප දෙදෙනාටම අපහසුතාවයක් සහ කාලය නාස්ති කිරීමක් ලෙස පෙනේ."

"කමක් නෑ. මම ඔයාට මාසෙකට සැරයක් knocking fee විදියට වැඩිපුර ගෙවන්නම්" කියලා එයා කිව්වා.

ආයාචනාත්මක මුහුණකින් එයා කිව්වා,

"කවදා හරි දොරට තට්ටු කරලා ප්‍රතිචාරයක් නොලැබුනොත් පොලිසියට කතා කරන්න."

මම කම්පනයට පත් වෙලා ඇහුවා, "ඇයි සර්?"

ඔහු පිළිතුරු දුන්නා, "මගේ බිරිඳ නැති වුණා, මගේ පුතා විදේශගත වෙලා, මම මෙහෙ තනියම ජීවත් වෙනවා, මගේ කාලය කවදා එයිද කියලා කවුද දන්නේ."

ඒ මොහොතේ, මම මහලු මිනිසාගේ මීදුම සහිත, තෙත් ඇස් දැක්කා.

ඔහු තවදුරටත් කිව්වා, "මම කවදාවත් පුවත්පත කියෙව්වේ නැහැ. මම ඒකට දායක වෙන්නේ තට්ටු කරන ශබ්දය හෝ දොර සීනුව නාද වෙන ශබ්දය ඇහෙන්න. හුරුපුරුදු මුහුණක් දැකලා සතුටු සාමිචි හුවමාරු කරගන්න."

ඔහු අත් අල්ලාගෙන කිව්වා, "තරුණයා, කරුණාකරලා මට උදව්වක් කරන්න. මෙන්න මගේ පුතාගේ විදේශ දුරකථන අංකය." "කවදා හරි ඔයා දොරට තට්ටු කළත් මම උත්තර නොදුන්නොත්, කරුණාකරලා මගේ පුතාට කතා කරලා එයාට දැනුම් දෙන්න."

මෙය කියවීමෙන් පසු, අපේ මිතුරන්ගේ කවය තුළ මෙතරම් තනිකඩ, වැඩිහිටි පුද්ගලයින් සිටින බව මට වැටහුණා.

සමහර විට, ඔවුන් තවමත් වැඩ කරන දිනවල මෙන්, ඔවුන්ගේ මහලු වියේදීත්, WhatsApp හි පණිවිඩ යවන්නේ මන්දැයි ඔබ කල්පනා කළ හැකිය.

ඇත්ත වශයෙන්ම, මෙම උදෑසන සහ සවස සුබ පැතුම්වල වැදගත්කම දොර සීනුව තට්ටු කිරීමේ හෝ නාද කිරීමේ අර්ථයට සමානය; එය එකිනෙකාට ආරක්ෂාව ප්‍රාර්ථනා කිරීමේ සහ ඨකවරණය ප්‍රකාශ කිරීමේ ක්‍රමයකි.

වර්තමානයේ, WhatsApp ඉතා පහසු වන අතර, අපට තවදුරටත් පුවත්පත් සඳහා දායක වීමට අවශ්‍ය නැත.

ඔබට කාලය තිබේ නම්, ඔබේ වැඩිහිටි පවුලේ සාමාජිකයින්ට WhatsApp භාවිතා කරන ආකාරය උගන්වන්න.

එක් දිනක්, ඔබට ඔවුන්ගේ උදෑසන සුබ පැතුම් හෝ බෙදාගත් ලිපි නොලැබුනේ නම්, ඔවුන් අසනීප විය හැකිය, නැතහොත් ඔවුන්ට යමක් සිදුවී තිබිය හැකිය.

ඔබේ මිතුරන් සහ පවුලේ අය ගැන සැලකිලිමත් වන්න. මෙය කියවීමෙන් පසු, මගේ හදවත සතුටු කඳුළුවලින් පිරී ගියේය.

අපගේ WhatsApp පණිවිඩවල වැදගත්කම මම ගැඹුරින් තේරුම් ගතිමි. නැත්නම් එකිනෙකාට දුරකථන ඇමතුමක් දෙන්න.

සුභ දවසක්, හිතවත් මිත්‍රවරුනි...

*මුහුණුපොතෙන් උපුටා ගැනීමකි.*

ලුතිනන් කර්නල් අයිපී ජයරත්න



සොල්දාදුවකු තම නිල ඇඳුම පැළඳි දිනේ සිටම ඔහුට වෘත්තීය අභිමානය සතුව ඇති අතර, ඔහුගේ වගකීම වනුයේ එය නිසි අයුරින් පවත්වාගෙන යාමයි. තවද, යුද්ධ හමුදා සාමාජිකයකු තමන්ගේ පවුල තුළ ඉහළඅභිමානයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. රාජකාරි වටපිටාව මෙන්ම පවුල් පරිසරය ද සමානව කළමනාකරණය කිරීම ඔහු සතු වගකීමකි.

# ආත්ම අභිමානය හා සොල්දාදුවා

අභිමානය පිළිබඳව විග්‍රහ කිරිමේදි එයට විවිධ අර්ථකතනයන් දිය හැක. නමුත්, අභිමානය යනු ගෞරවයයි. මෙහිදී, අභිමානය පුද්ගලයකු සතුවූ විට එය ආත්ම අභිමානය වේ. ආත්ම අභිමානය යනු පුද්ගලයකුට තමා පිළිබඳ ඇති හැඟීම හා ගෞරවයයි. ආත්ම අභිමානය සෑම පුද්ගලයකුටම පොදුවේ. එය මිනිසාට ඇති ද්වීතීය අවශ්‍යතාවයකි. ඉහළ ආත්ම ගෞරවයක් ඇති පුද්ගලයකු සෑම විටම අනෙකාගෙන් ඉහළ ගෞරවයක් බලාපොරොත්තු වේ. පුද්ගලයකුගේ අභිමානය පහත පරිදි වැඩිදුරටත් විදහා දැක්විය හැක.




විශේෂයෙන් යුද්ධ හමුදා සාමාජිකයකු හට ඉහත සඳහන් සියලුම කොටස් නිසි ලෙස හා ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. එයට හේතුව සොල්දාදුවකු තම නිල ඇඳුම පැළඳි දිනේ සිටම ඔහුට වෘත්තීය අභිමානය සතුව ඇති අතර, ඔහුගේ වගකීම වනුයේ එය නිසි අයුරින් පවත්වාගෙන යාමයි. තවද, යුද්ධ හමුදා සාමාජිකයකු තමන්ගේ පවුල තුළ ඉහළ අභිමානයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. රාජකාරි වටපිටාව මෙන්ම පවුල් පරිසරය ද සමානව කළමනාකරණය කිරිම වැදගත් නිසාය. තවදුරටත් ජාතියේ ආරක්ෂකයා වන යුද්ධ හමුදාවේ කොටස්කරුවකු වීම තුළින් සොල්දාදුවා ඉඳුරාම ජාතික අභිමානයට දායක වන පුද්ගලයකු බවට පත්වන අතර, පෞරුෂ අභිමානය ද ඒ තුළින් ගොඩනැගෙන අතර එය සොල්ලාදුවකු තුළ තිබිය යුතු ඉහළ ගුණාංගයකි.

## අභිමානයේ වැදගත් කම

**පුද්ගලික ජීවිතය උදෙසා -** අභිමානය ඇති මනුස්සයෙක් තම හැසිරිම් කටයුතු හා වචන සඳහා සීමාවන් තබා ගනී. එවැන්නක් කිසි දිනෙකත් තම ආත්ම ගෞරවයට හානි කරන ක්‍රියා නොකරයි. ඔවුන් සදාචාරය ධර්මය හා සත්‍යය උදෙසා ජීවත් වේ. මෙම හැසිරිම මිනිසාගේ පුද්ගලික ජීවිතය සුන්දර හා ගෞරවනීය කරයි.

**පවුල සහ සමාජය උදෙසා -** පවුලක අභිමානය යනු එම පවුලේ ගෞරවය හා සදාචාරයයි. පවුලේ අය හැසිරෙන්නේ ගරුභාවයෙන් නම් එය සමාජය තුළ යහපත් ප්‍රතිරූපයක් ගොඩනැගේ.

**රට හා ජාතිය උදෙසා -** යුද්ධ හමුදාවේ අභිමානය රටේ ආරක්ෂාව හා ස්වාධීනත්වය රැකගැනීමේ අරමුණින් ගොඩනගන සෙබළුන් තම අභිමානය හේතුවෙන් යුද්ධයේදී තම ජීවිතය පවා පරිත්‍යාග කරන්නට සූදානම් වූහ. එබැවින් රටේ ගෞරවය හා ජාතික අභිමානය සෘජුවම යුද හමුදාවේ අභිමානය හා සම්බන්ධ වේ.

අවසාන වශයෙන් යුද්ධ හමුදාවේ අභිමානය යනු පුද්ගලික ආත්ම ගෞරවය ආයතනයේ ගෞරවය හා ජාතික අභිමානය එකට ගැළපෙන විශාල අගයකි. මේ මත සෙබළෙක්ගේ ගෞරවය එහි ශක්තිය සහ රටේ ආරක්ෂාව තීරණය වේ. එබැවින් යුද්ධ හමුදාව තුළ අභිමානය අත්‍යවශ්‍ය මූලධර්මයක් ලෙස සුරක්ෂිත කරගත යුතුය.



■ මේජර්
එම්අයි මරික්කාර්
සබුබ

# සක්වළ සවාරියක් යන්න නියම තැන

# ග්‍රහලෝකාගාරය

අපි හැමෝම ආසයි රාත්‍රී අහස දිහා බලාගෙන ඉන්න. රාත්‍රී අහස කියන්නේ විශ්වවිද්‍යාලයක්. සමහරක් උදවිය විනෝදාංශයක් විදිහට රාත්‍රී අහස නිරීක්ෂණය කරනවා. ඒ වගේම තරු රටා, ග්‍රහලෝකාගාර, උල්කාපාත සහ අභ්‍යාවකාශ වස්තූන් පිළිබඳ ඉගෙනගන්න උනන්දුවක් දක්වන පාසල් දරුවන් බොහෝ දෙනෙක් අපි අතර ඉන්නවා. ඒ වගේ අයට විනෝදවෙන්න වගේම දැනුමට යමක් එකතු කරගන්න, දවල්ටත් තරු රටා, ග්‍රහලෝක බලන්න තැනක් තියෙනවා කියලා ඔයා දන්නවද? අපි බලමු එහෙනම් මේ තැන මොකක්ද එහි ආරම්භය සිදුවුණේ කොහොමද කියලා.

1965 අවුරුද්දේ අපේ රටේ කාර්මික ප්‍රදර්ශනයක් කොළඹදී පවත්වන්න තීරණය වුණා. මේ ප්‍රදර්ශනයේ තරඟයකට නැගෙනහිර ජර්මනිය විසින් ග්‍රහලෝකාගාරය නමින් ප්‍රදර්ශන භාණ්ඩයක් ඉදිරිපත් කළා. හැබැයි ජර්මානුවන්ගේ ප්‍රදර්ශන භාණ්ඩය උනාට මේක හැදුවේ, සැලසුම් කළේ අපේ රටේ කොන්ක්‍රීට් වලින් වැඩ දාපු සුප්‍රකට කීර්තිමත් ඉංජිනේරුවෙක් වූ ආචාර්ය ඒඑන්ඒඑස් කුලසිංහ මහතා තමයි. ඔය පීලි පීලි වගේ තියෙන වී හැඩයේ කෑලි ඔක්කෝම හැදුවේ බිම. එකෙන් එක උඩට උස්සලා පුරුද්දලා සවිකරපු මේ ඉන්ජිනේරු විස්වකර්ම වැඩේ කියන්නේ මේ ගොඩනැගිල්ලේ රාමුවක්, එහෙමත් නැතිනම් සැකිල්ලක් නෑ. සමහර අති පණ්ඩිතයෝ මේ වැඩේ කරන්න බෑ කියලා කුලසිංහ මහත්තයාට දොස් කියලා එයාට වරදිනතුරු බලන් ඉඳලා තිබුණා. දන්නවානේ කුලසිංහ මහත්තයා කියන්නේ විස්වකර්ම වැඩවලට දස්සයා කියලා. අපේ රටේ තිබුන සීමිත සම්පත් වලින් උපරිම ප්‍රයෝජන අරගෙන එයා ග්‍රහලෝකාගාරය ඉදිකළා.

මේ අපූරු නිර්මාණය 1965 පෙබරවාරි මස 01 වන දින විවෘත කෙරුණා. කාර්මික ප්‍රදර්ශනය ඉවරවුනාට පස්සේ මේ ගොඩනැගිල්ලත් අනෙකුත් බඩු භාණ්ඩත් ශ්‍රී ලංකා රජයෙන් මිලදී ගත්තා. එදා ඉඳන් මේ ග්‍රහලෝකාගාරය අපේ රටේ ලක්ෂ සංඛ්‍යාත පිරිසකට විශ්වය ගැන දැනුම බෙදලා දිලා තියෙනවා. අවුරුදු ගනනාවක් මේ ග්‍රහලෝකාගාරය අයිතිව තිබුනේ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ. 1994 දි ග්‍රහලෝකාගාරය විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතට පැවරුනා.





ආචාර්ය එච්එන්එච්එන් කුලසිංහ මහතා



ප්‍රක්ෂේපන යන්ත්‍රය (**Carl Zeiss Universal Projector**)

මේ ග්‍රහලෝකාගාරයේ තියෙන සුවිශේෂී අපූරු උපකරණය තමයි විශ්ව ප්‍රක්ෂේපන යන්තරේ (Carl Zeiss Universal Projector). මේක අපි නැගෙනහිර ජර්මනියෙන් තමයි මිලදී අරන් තියෙන්නේ. ග්‍රහලෝකාගාරය ඇතුලේ ස්වභාවික අයුරින් කෘතිම අහසක් මවා පෙන්වන්න මේ උපකරණයට පුළුවනි. වොට් 1500ක බලයකින් යුක්ත විදුලි බුබුලක් හා කාච පද්ධතියක් මේ උපකරණයට තියෙනවා. මෙම යන්ත්‍රයේ ෂඩාස්‍රාකාර කොටසේ තරු සිතියම සටහන්ව තියෙනවා. මේ ප්‍රොජෙක්ටරයේ විශේෂත්ව වෙන්නේ දිශාවන් තුනකට භ්‍රමණය කරවන්න පුළුවන් වීමයි. පොළවේ අක්ෂයට සමාන්තරව භ්‍රමණය කළාම ආකාශ වස්තූන් දෛනිකව දිස්වෙන අයුරු බලාගන්න පුළුවනි. මේ යන්ත්‍රයේ නැගෙනහිර, බටහිර දිශාවන්ට භ්‍රමණ කළාම ලෝකයේ ඕනේම තැන ඉඳන් අහස, එහෙම නැත්නම් විශ්වය පෙනෙන හැටි බලාගන්න පුළුවනි. කොළඹදී අපි දකින රාත්‍රී අහසත් ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ හිටියා නම් බලාගන්න පුළුවන් අහසත් එකම මොහොතකදි පෙන්නවා. මේ ප්‍රොජෙක්ටරයට අමතරව ජපන් ආධාර යටතේ ලැබුණු රුපියල් කෝටි තුනක් විතර වටිනා උපකරණවලිනුත් අහසේ අපූරු දර්ශන රාශියක් දැක බලා ගන්න පුළුවනි.

ග්‍රහලෝකාගාරය ගැන විස්තර කිව්වාට තියෙන තැන කිව්වේ නෑ නේද? මේක තියෙන්නේ කොළඹ 07 ස්ටැන්ලි විජේසුන්දර මාවතේ. කොළොම්පුරේ විශ්වවිද්‍යාලය ගාව කිව්වොත් හරි. ග්‍රහලෝකාගාරය තුළ ආසන 570ක් තියෙනවා. ඒ විතරක් නෙමෙයි ග්‍රහලෝකාගාරය ආශ්‍රිතව තාරකා විද්‍යා සංගම් කිහිපයක් ක්‍රියාත්මක වෙනවා. ජපානයෙන් ලැබුණ අධාර යටතේ ජංගම ග්‍රහලෝකාගාරයක් ද මේ වෙනකොට අපිට තියෙනවා. ඒකට හුළං පුරවලා ගත්තාම පංති කාමරයක් තරමට විශාලයි. ඒ නිසා ඕනෑම දුර බැහැර ප්‍රදේශයකට ජංගම ග්‍රහලෝකාගාරය අරගෙන යන්න පුළුවනි.



මතක තියාගන්න

ග්‍රහලෝකාගාරයේ දර්ශන පෙන්වන්නේ දවසකට දෙවරක් පමණයි. ආසන 570ක් තිබුනත් ගොඩාක් පාසල්වලින් ග්‍රහලෝකාගාරයට එන නිසා තරමක තදබදයක්ද පවතිනවා. ඉරිදා සඳුදා හා රජයේ නිවාඩු දවස් හැරෙන්නට අනෙක් ඕනේම දවසක උදේ 10 ටයි හවස 2 ටයි දර්ශන පෙන්වනවා. ලෝකයේ අනෙකුත් ග්‍රහලෝකාගාරයන් එක්ක බැලුවොත් අපේ ග්‍රහලෝකාගාරයට තාක්ෂණය එකතුවෙන්නේ අඩුවෙන් තමයි. අළුත් උපකරණ ආදියෙන් පරිපූර්ණ වුනොත් අපිට තව තවත් විශ්වය ගැන දැනුමෙන් සන්නද්ධ වෙන්න පුළුවනි. තව ඔයගොල්ලන්ට 011 2586499 කියන මේ දුරකථන අංකයට කතාකළොත් ග්‍රහලෝකාගාරය ගැන වැඩිදුර විස්තර දැනගන්නත් පුළුවන්. ඉතිං... තවත් මේ වගේම අපේ රටේ තියෙන මිලකළ නොහැකි ස්ථානයක් ගැන ඔබ නොදත් බොහෝ දේවල් දැනගන්න ඊළඟ කලාපයෙන් ආයෙත් හමුවෙමු.




■ කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඒඑම්

11 ඉසේරෙ
ජනමාධ්‍ය හා මව්මෙ අම



# තරු ද නිදන මහ රෑ... සෙබළු තාම නිදි නෑ...



**යුද බිමේදී උණු බත් කටක් ලැබීම ඉතා විරලය. දිගු ක්‍රියාන්විතවලදී කල් තබා ගන්නා ආහාර වලින් තොර යමක් නොවීය. "රෙෂන් පැකට්" යනු ඒවාය. එහිදී බත්, කඩල, බැටළු මස්, කුකුල් මස්, එළවළු ආදී ද්‍රව්‍ය රැසක් කල් තබාගත හැකි අයුරින් පැකට් කර භාවිතයට ගැනිණ. එවකට ඒවා දේශීයව නිෂ්පාදනය නොවූ අතර ඉන්දුනීසියාව වැනි රටවලින් ආනයනය කරනු ලැබ තිබිණ. කඳවුරෙන් පිටත රාජකාරීවල දී පැය 24,48,72 ආදී වශයෙන් ගත කරන කාලය අනුව ආහාර සඳහා එම "රෙෂන් පැකට්" භාවිත විය. පැය 72 කට වඩා වැඩිපුර ගත කළ ඇතැම් දිගු මෙහෙයුම්වලදී ද එලෙසම එම පැකට් කළ ආහාර පාවිච්චි කෙරුණු අතර එහිදී අමතර ආහාර ද එම රෙෂන් පැකට් සමග සැපයිණ. රටඉඳි, චීස්, බිස්කට්, කිරි හෝ තේ පැකට්, වියළන ලද පලතුරු, කෝඩියල්, වෙනත් ශක්තිජනක පාන මේ ආදී බොහෝ දෑ එම රෙෂන් පැකට් තුළ අඩංගුය. ක්‍රියාන්විතයෙහි යෙදෙන කාලය අනුව ආහාර සඳහා සැපයෙන රෙෂන් පැකට් තුළ අඩංගු වන ද්‍රව්‍ය ද වෙනස්ය. විශේෂයෙන්ම කොමොන්ඩෝ හා විශේෂ බළකා සෙබළුන්ට භූමියේ සිදු කෙරෙන ගැඹුරු ක්‍රියාන්විතවල දී එම විශේෂ ආහාර පාන සැපයිණ.**

යුද්ධය නිමාවත් සමඟම සමස්තයක් ලෙස හමුදාව එම වියළි ආහාර පැකට් "රෙෂන් පැකට්" භාවිතය සහමුලින්ම පාහේ අඩු වූ අතර පුහුණු හෝ වෙනත් විශේෂ අවශ්‍යතා සඳහා පමණක් දැනට ඒවා භාවිත වේ. තවද, මේ වන විට එම රෙෂන් පැකට් දේශීයව ද නිෂ්පාදනය කරන බැවින් එමඟින් විශාල විදේශ විනිමයක් ඉතිරි කර ගැනීමට ද හැකිව තිබේ. කෙසේ වුවද, යුද සමයේ කුමන රාජකාරී අතරේ වුව එම රෙෂන් පැකට්වල රස නොබැලූ අයෙකු සොයාගත නොහැකිය. කෙසේ නමුත්, එකල දිගින් දිගටම ක්‍රියාන්විතවලම නිරත වූ සෙබළුන්ට නම් එම පැකට් කළ ආහාර අනුභව කොට එපා වී තිබිණ. එවන් තත්ත්වයක් තුළ කලාතුරකින් හෝ ඔවුන්ට උණු බත් කටක රස බලන්නට ලැබීම යනු අමෘතයක් බඳු විය. මේ අතර නිවාඩු වාරයක දී එම රෙෂන් පැකට් එකක් දෙකක් නිවසට රැගෙන විත් ලුණු මිරිස් යොදා රත්කර පදමට සකසා රස බැලූ මතක ද වැඩි දෙනකු සතුය.

යුදබිමේ කඳවුරු ජීවිතයේ දී කුස්සියේ ද තිබුණේ යුද්ධයකි. කඳවුරු මුළුතැන්ගෙය යනු එහි සිටින සෑම අයෙකුගේම කුස පුරවන තැනය. එහි ඉවුම් පිහුම් සඳහා පළපුරුදු හමුදා කෝකිවරු සේම ඇතැම් තැන්වල හමුදාවට බඳවා ගත් සිවිල් කෝකිවරු ද සිටියහ. කඳවුරක සිටින භට පිරිස අනුව කුස්සියේ යුද්ධය ද දරුණුය. පොල් ගාන්නට, පොල් මිරිකන්නට, එළවළු කපන්නට, ළූණු සුද්ද කරන්නට, බත හැඳි ගාන්නට වෙන වෙනම පිරිස් යෙද වේ. ඉවුම් පිහුම් කටයුතු සඳහා සිටින ප්‍රධාන සෙබළු හෝ සිවිල් සේවක කිහිප දෙනා හැරුණු විට දෛනිකව නම් කෙරෙන අත් උදව්කරුවෝ ද සිටියහ. එහිදී, කෑම සකස් කරන අතරේ ඔවුනගේ විහිළු තහළු වැල්වටාරම් කතා බස් ද බොහෝය. ඒත් මේ සියල්ල අතරේ කුස්සියේ පසෙක එකිනෙකාගේ පුද්ගලික අවි ද අත පොවන මානයේ තබන්නට ඔවුහු අමතක නොකළහ.

අවුරුදු සමයේ යුද භූමියේ ඉදෙන කිරිබත අමෘතයක් බඳු විය. විශාල භට පිරිසක් සඳහා එක වර ඉදෙන එම කිරි බතට දායක වෙන පිරිස බොහෝය. ඒවායේ කිරි රස යහමින් නැතත් වෙඩි හඬ අතරේ හුදෙකලා කැලෑ තුළ හිඳිමින් අවුරුද්ද සමරන්නට කවුරු කවුරුත් වගබලා ගත්හ. යුද සෙබළකුට අවුරුද්ද තරම් හදට දැනුණු තවත් දෙයක් නොමැති තරම්ය. වසරකට වරක් එළඹුණ එම සුවිශේෂී අවස්ථාවේ මුළු රටම තම පවුලේ සාමාජිකයන් හා එක්ව හිඳ අවුරුදු ප්‍රීතිය සමරද්දී යුද බිමේ ගස් ගල් අතර හුදෙකලා තැන්වල තනි වී අවුරුදු නැකත් සිතින්




අත්විඳින වාර සටන් බිමේ දිවි ගෙවූ බොහෝ දෙනෙකුට මතකය. සටන් බිමේ සෙබළුන් අලුත් අවුරුද්දේ ගෙවූ හුදෙකලාවේ තරම දැක්වෙන අපූරු බංකර් කුරුටු ගීයක් ද එකල ලියැවී තිබුණි. එය මෙසේ විය.

**ගම රට යන්න බෑ අපි හිරවෙලා බං වෙඩි වදින්නෑ කොහෝ මෙහෙ ඇවිත් හඬාපන්**

"මෙම කුරුටු ගීය ලියූ නාඳුනන සොල්දාදුවා තම අවුරුදු නිවාඩුවට යාමට නොහැකිව ළතවන සිය දහස් ගණන් සොල්දාදුවන්ගෙන් අයකු පමණි. සෙබළකුට පෞද්ගලික ජීවිතයේ

මෙන්ම පොදුවේ ඇති උත්සවවලට ප්‍රිය සම්භාෂණ වලට සහභාගී වීමට වරම් ලැබෙනුයේ ඉතා කලාතුරකිනි. මොහු සිංහල අවුරුදු නිවාඩුවට යාමට නොහැකිව ළතවන සිය දහස් ගණන් සොල්දාදුවන්ගෙන් අයකු පමණි. සිංහල අවුරුදු නිවාඩුව ගමේ ගත කිරීමට නොහැකි වීම පිළිබඳ ඔහු තුළ පශ්චාත්තාපයක් හටගෙන ඇත. "වෙඩි වදින්නෑ කොහෝ. මෙහි ඇවිත් හඬාපන්" යනුවෙන් කොහාට යුදබිමේ පෙදෙසට පැමිණෙන්නට ඔහු අහිංසකව ඇරයුම් කරන්නේ තමාට ගමට යෑමට නොහැකි වූ නිසාවෙනි.

"යුද බිමේ නොකී කතා" යටතේ ලියූ දීර්ඝ ලිපි පෙළ මෙතැනින් අවසන් වේ. ඒ පිළිබඳව ලියන්නට ඇති තවත් දේ ඉතිරිය. එහිදී ලියා පළකළ දේ සේම පළකරන්නට නොහැකි, සමීපතමයකුට පමණක් පැවසිය හැකි කාරණා ද නැත්තේ නොවේ. යුද්ධයට සෘජු ලෙස දායක වූ අපමණ පිරිසක් අද වනවිට විශ්‍රාම ගොසිණි. සැලකිය යුතු පිරිසක් තවමත් සක්‍රිය සේවයේ ද නිරතව සිටිති. අත්දැකීම් විඳී ඔවුන් සතුව යුදබිමේ බොහෝ අප්‍රකට මතක සමුදායක් ඇති බව නොරහසකි. නමුත්, කියාගන්නට නොහැකිව ඒවා ඔවුනගේ හදවත් තුළ තෙරපෙමින් කැකෑරෙමින් ඇතුවාට සැක නැත. ඒවා අකුරු බවට පත්ව සමාජයට මුදාහැරීමක් සිදු නොවී කාලයේ වැලිතලාවෙන් වැසී යනුයේ ඉතා අවාසනාවන්ත ලෙසය. සියලු කතා තුළ දුක, සතුට, පාළුව, ඉච්ඡාභංගත්වය, තරහව, වෛරය ආදී සෑමදේම අඩංගුය. කෙසේ නමුත් යුද භූමිය යනු ජීවිත නැසෙන තැනක් වුව ද ජීවිත වලට මෙහා පාඩම් කියාදුන් තැනකි. ඒ තුළ තිබුණේ වෙනස් වූ අපූරු සංස්කෘතියකි. එකල බංකර් තුළ සෙබළුන් අතින් ලියැවුණු පහත බංකර් කුරුටු ගී ඊට උදාහරණ සපයයි.

**අහිමි වූ නිදහස උණ්ඩයක් කොට අවියට දමමි**

"අනෙකුත් වෘත්තීන් මෙන් නොව සොල්දාදුවකුට ලැබෙන නිදහස ඉතා සීමාසහිත වේ. ඇතැම් විට මාස ගණන් යුදබිම්වල කඳවුරුවල සොල්දාදුවාට ගත කිරීමට සිදුවේ. පවුලේ සාමාජිකයන් එකට එකතු වී සතුටු වන උත්සව සාදවලට සොල්දාදුවාට සහභාගීවීමේ අවස්ථාව බොහෝ විට නොලැබේ. එය ඔහුගේ වෘත්තීය ජීවිතයෙන් ලැබුණු උරුමයයි. මෙම කුරුටු ගීය එසේ සීමා වූ නිදහස පිළිබඳ අපූරු විවරණයක් නොවේද ?"

**තෙපලා සමිඳු ගුණ ඉස පැන් හතර කොන**
**නිවලා මෙයුද ගිනිදැල් බුරබුරා යන**
**පොවලා අමා වැනි සදහම් වෙතට දන**
**සිඳලා කෙලෙස් පිරිසිදු කළ මැනවි මන**

"පිටතින් බලන අයෙකුට බැලූ බැල්මට රණවිරුවන්ගේ භූමිකාව පෙනෙනුයේ නිරන්තරව යුද්ධය වෙනුවෙන්ම කැපවෙන යුද්ධය බලාපොරොත්තුවෙන්ම සිටින පිරිසක් ලෙසය. එහෙත්, සැබෑ කරුණ නම් නොවැළැක්විය හැකි තත්ත්වයක් යටතේ යුද වැදෙනවා හැරෙන්නට ඔවුනගේ ඒකායන පැතුම සමාජයේ සෙසු අයකු බලාපොරොත්තු වනවාටත් වඩා ඉක්මන් සාමයකි. මේ කවියේ ප්‍රාර්ථනාව එයයි."

**වැලි මළුවලින් වට වූ දා**
**පුංචි බිම් අගලක**
**ගන අඳුර රජයන මුර කුටියේ**
**මැදියම් මහ රැයක**
**මා දෙනෙත අඳුර විනිවිද**
**ලැබෙන සුළු නිමේෂයක වුව**
**නැවත සිත පිනා යයි**
**වත යදින්නට**
**මගේ නෙතු අබියස**
**මගේ කුමරියේ**

"උතුරු නැගෙනහිර කඳවුරු වල රාජකාරී කරන සෙබළකුට රාත්‍රියේ මුර රාජකාරී ඉටුකර නිදියන්න වන්නේ ද බංකරය තුළය. එය ඔවුනගේ නිවහනය. තුරුණු සොල්දාදුවකු සිය පෙම්වතිය පිළිබඳව දුටු සිහිනය මෙම කුරුටු ගීයෙන් හෙළි කෙරේ."

**රජ කුමරෙක් නොවෙමි මම සුරසැප විඳින**
**දුප්පත් කොල්ලෙක්නෙ හමුදාවට බැඳුන**

"යුද බිමේ සෙබළුන් බවට වැඩි පුරම පත්වන්නේ රටේ දුප්පත් ජනතාවගේ දූ පුතුන්ය. සදාකාලික ආබාධිත බවට පත්වී ගෙපැලට එන තම දූ පුතුන්ගේ බර ඒ අහිංසක දෙමාපියන්ටය. මුද්‍රා තබන ලද මිනී පෙට්ටි බදා වැළඳගෙන වැලපීමේ ඉරණම ද ඒ දෙමාපියන්ටමය. කොයි රටකත් තත්ත්වය එ පරිදිය. අපේ රටේ ද එය එසේ විය. මෙම කුරුටු ගීයෙන් ඒ බව ගම්‍ය නොවේ ද?"

**තරුද නිදන මහ රෑ සෙබළු නාම නිදි නෑ**

"ජනප්‍රිය ගීයක අනුකරණය තුළින් ලියැවී ඇති මෙම කුරුටු ගීය තුළින් ධ්වනිත වන්නේ රැය පුරා සොල්දාදුවන් ඇස් දල්වා විමසිලිවන්ත වන බවකි."

**දයාබර හිතවතිය,**
**යුදබිමේ යුද වදින සොල්දාදුවෙක් ලෙසින්**
**යම් දිනක මා මියගියහොත්,**
**එපා රකින්නට පතිවතක් ඔබ,**
**විය යුතුයි ඔබ මවක්, බිහි කරනු මැන පුතෙක්,**
**බිහි වූ ඒ පුතත් කර සොල්දාදුවෙක්**
**මියගිය මා නමින්.**

"මෙතරම් අව්‍යාජ පරිත්‍යාගයක් පිළිබඳ සිතුවිල්ලක් හෝ පහළ වනුයේ රණවිරුවකුට මිස අන් කවරකුටද..?"

**මලක් සේ නැත මෙලෙක් වී සිත**
**ගලක් තරමට දැඩි වෙලා**
**තුවක්කුව ගත් රුවැත්තිය වෙත**
**කවක් සෙනෙහෙන් ලියවිලා**
**නිමක් දැකුමට පෙමක් තිබුණට**
**කමක් නෑ සුදු නංගියේ**
**ගමත් ගෙදරත් එපා මතකෙට**
**ඉමක් නොපෙනෙන යුද බිමේ**
**නිවන් දැකුමට නුවන් පින් මදි**
**රුවන් වන් මිණි මුතු ළඳේ**
**උපන් නුපන් පුතුන් වෙනුවෙන්**
**රුපුන් වනසමු යුද බිමේ**

"අවි දරා සිටින රුමත් සෙබළියක ගැන සෙනෙහසින් තවත් සෙබළෙකු ලියූ කුරුටු ගීයක්."

**තරු පිරුණු සඳ පිපුණු අහස යට**
**අමාවකදා වගේ මගේ සිත**

"හුදෙකලා බංකරයක රාත්‍රිය නිදිවරමින් රාජකාරී කරන මෙම සෙබළා අවට පරිසරයේ ඇති ස්වභාව සෞන්දර්යයෙන් යම් ආස්වාදයක් විඳී. නමුත් තමන්ගේ නිවස, ළබැඳියන් ගැන සිහිවෙද්දී මෙම සොල්දාදුවාගේ සිත හැඟුම්බර වෙයි. ඔහුගේ සිතට තනිකමක් පාළුවක් දැනේ. එය ධ්වනිත කිරීමට සොල්දාදුවා යොදාගෙන ඇත්තේ "අමාවක දා වගෙයි" යන වැකියයි. මෙම කුරුටු ගීය තුළින් සොල්දාදුවකු පිළිබඳ පොදුවේ සාමාන්‍ය මිනිසුන් නොදකින පැත්තක් විවරණය කොට යම් හැඟීමක් අප තුළ ජනිත නොවන්නේ ද ?"

නිමි.



ලුතිනන් කර්නල්
**ඊඒඊ සුජිත් චමින්ද**



# නිහඬ පරිත්‍යාගය

## කෙටි කතාව

> "නංගී එසේ කියා වෑන් එක වෙත දුවගෙන ගියා. මම දුවගෙන වෑන් එක ළඟට යද්දි මට දරා ගන්න බැරි බඩේ අමාරුවක් ආවා. මං යටි බඩ අල්ල ගන්නවත් එක්කම ඔක්කොම කළුවර වෙලා ගියා. මට ඇහුණේ අනේ ලොකු පුතේ කියන අම්මගෙ හඬ විතරයි."

"අනේ අයියේ ඉක්මනට National Hospital එන්න" දැන් මම ඉන්නේ Hospital එක ලඟ. එතනට ආවේ මගේ නංගි සයුරිගෙන් ආපු කෝල් එකක් හින්ද.

"ඇයි මොකද උනේ නංගි"

"අනේ අයියේ.....අපේ අම්මා" පැවසීමට වූයේ එපමණකි.

ඇය ඉකි ගසා අඬන්න පටන් ගත්තාය. ඉතින් මම ඉක්මනට ආවේ National Hospital එක ලඟටය.

ඒ එනකොට මගේ නංගි දැඩිසත්කාර ඒකකය ලඟට වෙලා අඬ අඬ ඉන්නවා මම ඇය ලඟට ගියා.

"කෝ අම්මා කියන්න මට....."

නංගී මා දෙස බලා අත දික් කරේ දැඩි සත්කාර ඒකකය වෙතටයි. එතනට ගිය මට දැක ගන්නට ලැබුනේ අම්මට හැමපැත්තෙන්ම බට ගහලා තියෙනවා.

ඒක දැක්ක ගමන් මම අඩි දෙකක් පමණ පසුපස තිබූ බංකුවක් වෙත ආවේ කකුල් දෙක පණ නැතිවී ඇද වැටෙයි කියන බයටය.

"නංගි කෝ තාත්තා?

මම ඇහුවේ නංගිගේ ඔළුව අතගාමින්.

"තාත්තා ඩොක්ටර් හම්බවෙන්න ගියා අයියේ" නංගී කීවේ අඬ අඬා.

"අම්මට මොකද වුණේ? උදේ මම ගෙදරින් යද්දි හොඳට හිටපු අම්මා දැන් මෙහෙම ඉන්නව දැකිද්දී හිත හදාගන්න බැරි නිසා.

"මම හිටියේ කාමරේ පාඩම් කරකර. මට එක පාරටම ඇහුණා කුස්සියේ බඩු පෙරලෙනව වගේ සද්දයක්. ඒ එක්කම අම්මේ... කියං මම ගියා කුස්සියට එතකොට, අම්මා හිටියේ බිම වැටිලා. මම තාත්තට කතා කළා. තාත්ත දුවගෙන ඇවිත් අම්මව Hospital එකට එක්කං ආවා අයියේ."

නංගි ඉකි ගසා අඬන්න පටන් ගත්තා.

ඒ අතර තාත්තා ඉතාමත් කලබලයෙන් වගේ අම්මා පරික්ෂා කළ වෛද්‍යවරයා හමුවිමට ඔහු සිටි වෛද්‍ය පරීක්ෂණාගාරය වෙත ගිය අතර ඒ වනවිට වෛද්‍යවරයා සිටියේ අම්මාගේ වෛද්‍ය පරික්ෂණයක් සිදු කරමින්.

තාත්තා වෛද්‍යවරයා විමසු පසු ඔහු තාත්තාව හමුවිමට පැමිණියේ වෛද්‍ය

පරීක්ෂණාගාර තුළ සිටය.

"අනේ දොස්තර මහත්තයෝ.... මගේ Wife ට මොනවද වෙලා තියෙන්නේ........ "

තාත්තා වෛද්‍යවරයාගෙන් පැවසුවේ කටහඬට හැගුම් මුසුවූ ස්වරයක් ද එක් කරමිනි.

"මිස්ට රත්නායක... ඔයාගෙ Wife ට ඉක්මනට ඔපරේෂන් එකක් කරන්න වෙනවා."

කලබලයෙන් වගේ ඔහු එසේ පැවසුවේ අම්මාගේ තත්වය ඉතාමත් බරපතල බව පෙන්වමිනි.

"ඇයි ඉක්මනට ඔපරේෂන් එකක් කරන්න ඕනි කියන්නනේ ඩොක්ටර්...."

"තාත්තාගේ දෑසේ රැඳී තිබුන කඳුළු කැට කම්මුල මත කඩා වැටෙන්නට ඉතා ආසන්න වූයේ හදවත කම්පා වූ නිසාවෙනි. ඔහු වෛද්‍යවරයා මුණගැසීමෙන් අනතුරුව ඉතා ඉක්මනින් ගියේ තමාගේ දුව රැඳී සිටි ස්ථානයටයි.

"තාත්තා Doctor මොනාද කියුවේ."

තාත්තා එනවා දැකදැක ඒ දෙසට දුවන් මා තාත්තගෙන් එසේ විමසුවේය. තාත්තා ඇස් දෙකේ කඳුළු පුරවාගෙන පුටුව මත වාඩි වූ අතර, මායි නංගියි ද තාත්තා දෙපැත්තෙන් වාඩි උනා.

"අම්මාගේ වකුගඩුව නරක් වෙලා පුතේ....."

"ඩොක්ටර් කියනවා දවසක් ඇතුලත අම්මට වකුගඩුවක් බද්ද කරන්න කියලා. නැත්නම් අම්මාගේ ජීවිතයට කරදරයක් වෙයිලු....."

දවසක් ඇතුළත වකුගඩුවක් හොයා ගන්න අමාරු වුනොත්.....

තාත්තාගේ ඇස්වලින් කවදාවත් නොදැකපු ලෙස කඳුළුකැට වැටෙන්න පටන් ගත්තා.

"මගේ බිලඩ් අම්මාගේ ඒවාට වැඩි වෙනසක් නෑ පුතේ....."

තාත්තා කිව්වේ කඳුලු අතරින් බොහෝ අමාරුවෙන් වචන ගලපගෙනයි. නංගිද තාත්තාගේ උරහිසට ඔලුව තියන් අඬන්නට පටන් ගත්තාය.

මමද දෙලොවක් අතර තනිවී කල්පනා කළේ මොනව ද කියන්නේ කියලා.

තාත්තේ අම්මට අනිත් වකුගඩුවෙන් ජීවත් වෙන්න පුළුවන්නේ.....

එකක් විතරක් නරක්වී ඇති බව සිතා මා එලෙස පැවසුවා.....

මම ඔයාට රහසක් කියන්න ද මගේ පුතේ.....

මොකක් ද තාත්තේ.....

පුතාට මතකද දැනට අවුරුදු 15කට කලින් පුතාට අසනීප වෙලා Hospital හිටියා.

**අවුරුදු 15කට කලින්,**

එතකොට මට අවුරුදු 15යි නංගිට අවුරුදු 7යි.

අපි උදේට School ගියේ School වෑන් එකේ. වෙනදා වගේම උදේම අවදි වී ලෑස්ති උනා.....

තාත්තා ඒ මතක අවුස්සද්දී මගේ හිත අතීතයට ගියේ ඉබේටමයි. ලොකු චූටි දූ කෝ එන්නකෝ කෑම කන්න ඒ අම්මා.....

නංගී මමයි කාලා, බුදුන් වැඳලා, අම්මටයි තාත්තටයි වැඳලා එළියට එන්න හදද්දිම School වෑන් ඒක ආවා.

අයියේ හනික එන්න School වෑන් ඒක ආවා.....

නංගී එසේ කියා වෑන් එකේ වෙත දුවගෙන ගියා. මම දුවගෙන වෑන් එක ළඟට යද්දී මට දරාගන්න බැරි බඩේ අමාරුවක් ආවා. මං යටිබඩ අල්ල ගන්නවත් එක්කම ඔක්කොම කළුවර වෙලා ගියා. මට ඇහුණේ අනේ ලොකු පුතේ කියන අම්මගෙ හඬ විතරයි.

මම ඇස් අරිද්දී හිටියේ සුදු පාට තීන්ත ගාපු කොළ පාට දොර රෙදි දාපු රූම් එකක. මට මොකුත්ම හිතාගන්න බැරි වුණා.

ඇඳෙන් නැගිටගන්න තරම් හයියක් ඇඟටවත් හිතටවත් තිබුණේ නෑ. යන්තමින් බඩේ වේදනාවක් දැනුණා. මම ඇස් ඇර වටපිට බලද්දී මගේ එහා පැත්තේ තාත්තා හිටියා.

"කොහොමද ලොකු පුතේ ඔයාට..? තාත්තා ඇහුවේ හිනා වෙලා ඔලුව අතගාමින්. පසුවයි මම දැනගත්තේ මම ශල්‍යකර්මයකට භාජනය කරලා දින 10ක් සිහිය නැතිව ඉඳලා කියලා.

තුවාල හොඳ වෙනවත් එක්කම මට කිසිම අමාරුවක් තිබ්බෙ නෑ..... අපි හතර දෙනා ගොඩක් සතුටින් හිටියා.

**ඉහත සිදුවීම ආවරණය වෙද්දී මා හට දැනුනේ එය චිත්‍රපට කතාවක් ලෙසය.**

"ඔව් ලොකු..... එදා ඔයාට අසනීප වෙලා ඉක්මනට වකුගඩුවක් බද්ද කරන්න සිද්ද වුණා. ඒ වෙලාවේ පුතාගෙ අම්ම තමා පුතාට වකුගඩුවක් දුන්නේ. එදා ඉඳං පුතේ අම්මටයි, පුතාටයි එකම එක වකුගඩුවයි තිබ්බේ. ඒක රහසක් විදියට මෙච්චරකල් අම්මයි මමයි තියාගෙන හිටියා"

තාත්තා එහෙම කියද්දි මගේ හදවත එක පාරටම නතර වෙලා යනවා වගේ දැනුනා.

මට මහ ලොකු දුකක්..... අසරණකමක් දැනුනා.....

එදා මගේ අම්මා හින්දා මගේ ජීවිතය රැකුණා. ඒත් අද මට කියලා කරගන්න මුකුත් නැති වුණා. නංගී කැමති වුනත් එයාට වයස සම්පූර්ණ වුණේ නැහැ. අන්තිමට මට ජීවිතය දීලා මගේ අම්මා මේ ලෝකෙන් සදහටම යන්න ගියා, අපිව තනි කරලා.

දසමසක් ඇකයේ දරාගෙන මේ ලෝකයට බිහිකර මගේ අම්මා දෙවැනි වතාවටත් මට ජීවිතය දුන්නේ ඇය. හිතේ කියාගන්න බැරි අමුතු වේදනාවක් දැනුණා.

තාත්තාගේ ඇස්වල තිබුණේ අපි ගැන බලාපොරොත්තු පිරිච්ච කඳුළු කැට නංගීත් තාත්තා අසලට පැමිණ මටත් ඒ වේදනාව කඳුළුවලින් පිටවුණේ නොදැනීමයි....

**"ඔබ නොදැනුවත්ව ඔබට බොහෝ දෙනෙක් උපකාර කර ඇත. තවද, දෙමව්පියන් හෝ ඔවුන්ගේ ආදරය කැපකිරීම් මෙලොව අන් කිසිකෙනකුට කළ නොහැක"**




■ **කාසෙ කුමාරි ඒඩබ්ලිව්ජීඩීඩී**
**1 ශ්‍රීලයුකාබ**



# සෙවණ සිතුවිලි

## ලොව හැර යන බව නොදද්දී...

සතුටට හැදුවා නොදැනිම නුඹෙ කුස තුළදී මා වැඩෙද්දී
දිනෙන් දින ගැන්නා මේ ලොව හැර යන බව නොදද්දී
කතාවක් කියන්නම් වනසන්නට ලොව නසද්දී
ජීවිතය යැයි සතුට යැයි කුමක් නුඹට දැනෙද්දී

රිදුනා අම්මේ කතුරු පිහිතුඩ මගේ අත් පා සිඳිද්දී
දැනුණා අම්මේ මටත් තිබුණේ හදවතක්මයි ගැහෙද්දී
වරටුණා අම්මේ කඳුළු බිඳුවක් නුඹෙ කුස තුළ සිටිද්දී
දුන්නා අම්මේ මගේ පණ ටික මා නුඹේ කුසේ ඉඳිද්දී

හිතුවා අම්මේ බේරගන්නට නුඹත් එයි මා කපද්දී
හැඬුවා අම්මේ ලේ විලක් මැද වේදනා මා විඳිද්දී
පැතුවා අම්මේ යළිත් එපා මට උපන්නට මේ ලොවේදී
යනවා අම්මේ මාත් දෙව්ලොව නුඹ සිහියට හැරෙද්දී

සෙ/318570
කෝප්‍රල් ප්‍රියන්ත එස්එම්
1 ශ්‍රීලපාහ

## සති අන්ත බස් රථය...

සිකුරාදා හවසට ගමට යන
සඳුදා උදේට කොළඹට එන
"බස්වල" යන අයගෙ
හිත කියවන්න පුලුවන්නම්
ඒ හිත් කියයි "ජීවිතය" ගැන
ගොඩක් දේ...
හැබැයි, ඒ කියන කතා
අහන් ඉන්න පුලුවන්
සංවේදී හිතක් තියෙන
මිනිස්සුන්ට විතරයි
මොකද, ඒ කැරකෙන රෝද උඩ
යන්නෙම දුක්බර කඳුළු කතා...

සෙ/11කිව්02319
සැරයන් අබේසිංහ ආර්පීකේජීඑස්සී
11 ශ්‍රීලංජාආබමු
ජනමාධ්‍ය හා මව්මෙ අම

## මව්පිය නැති වියෝව...

මා ඉපදුනා දා පටන්
මා හට අවුරුදු තුනක
කාලයක් යන විට
මාගේ මව පියා
මා හැරදමා යන්නේය
එදා පටන් අද වෙනකම්
මා වින්ද දුක් කම්කටොළු
සිහිවෙයි හැම මොහොතෙම
මගෙ හදවතට
මව්පිය සෙහෙනස නැති මේ අඩුව
කිසිදාක කිසි දරුවෙකුට
හිමි නොවේවා
දරුවෙකු ලෙසත්
මාත් සැමදා පැතුවේ
මව්පිය තුරුලේ හුරතල් විඳින්නට
පෙර ආත්මෙක මා කළ පවක් නිසා
මගේ මව්පිය දෙදෙනා
මා හැරදා ගියේය
මතුයම් ආත්මයක මාගේ
මව්පිය ආදරය ලැබේවායි
මා ප්‍රාර්ථනා කරන්නෙමි

සෙ/479659
කෝප්‍රල් විජේසිංහ ඒඑම්ඩීජී
231 පාබසේමු



## සොයුර නුඹ නැති දින...

අහස දරුණු වී මහ වර්ෂා ඇද හැලී
ගලයි ඇළ දොල පහළට දරුණු වී
රකුසු වෙස් ගෙන මහ ජල කඳ මඟ ඇත
සරණක් නැති මහ වනේ
අහස් ගව්ව මෙන් කඳු ඇත මඟ දිගේ
කටු පඳුරු වැල් ඇති බිමේ
රූස්ස ගස් ගල් පර්වත ඇත මහ කැළේ
තරණය කිරීමට සවියක් නැත මගෙ හිතේ
දරුණු කොටි වලස් ඇත යන මඟ දිගේ
දරුණු වී ඇත උන් හාමතේ
මෙල්ල කරනට අවියක් නැත මගෙ අතේ
නුඹ සිටියනම් ශක්තියකි මට මහ කැළේ

සෙ/427749
කෝප්‍රල් ඉසුර මධුසංක ඩබ්ලිව්කේ
12 ගැහේබ



## ස්පර්ශයේ අපූරුව...

ස්පර්ශ කරන්නට හැකි නම්
සිතුවිල්ලෙන් සිතුවිල්ල
කියාදෙයි නුඹට
ඇතිවෙන නැතිවෙන සැටි
සිතිවිල්ලෙන් සිතිවිල්ල
ස්පර්ශ කරන්නට හැකි නම්
කඩිමුඩියේ ඇඟිලි තුඩු මත
ගැටෙන ශරීරය නොව ආත්මය
දැනේවි නුඹට
රාගයේ සහ ආදරයේ
වෙනසේ අපූරුව
ස්පර්ශ කරන්නට හැකි නම්
මවගේ දෙපතුල නොව හදවත
දැනේවි නුඹට
ඇයට සමකළ හැකි කිසිවක්
තුන් ලොවෙහි නොමැති බව

සෙ/605907
ලා/කෝප්‍රල් කෞෂල්‍ය ඕවීඅයි
2 ශ්‍රීලයුයුබ

## මිතුරන් සතුරන්...

ඔහු ගමේ තරුණයෙක්
සමාජය වැළඳ නොමගත්
ටියුෂන් පන්තියට විත්
යුවතියක් දැක සිත් ගත්
මිතුරන් ළඟට විත්
ඇය කැමති බව පවසත්
බොහෝ දෙය රසවත්
ඇයට දෙන්නට ගෙන්නවා ගත්
කාලය ගෙවීයයි
ඇය තාම නිහඬයි
බැරිම තැන හමුවෙයි
මෙය ඔහු ඇයට පවසයි
ඇගේ අත ඔසවයි
කඳුළු නෙත රතුවෙයි
රැවටූ මිතුරෝ සිහිවෙයි
වැරහැලි ඇඳුම් මත
දැන් මහා මාවතේ ඇත
සෙනෙහසක මීවිත
විහිළුවට අරගැනුම හොඳ නැත
මේ සිදුවීම මත
ඔහුගේ අසරණ මවත් දැන් නැත

සෙ/418476
කෝප්‍රල් අල්විස් කේඑම්කේ ආර්එස්පී
1 ගැහේබ

## නොනිමි පිය සෙනෙහස...



හිරිමල් වියේ හිත රැඳි සිහිනය
සැබෑ කරගනිමින්
රටට ණය නැති අයෙකු වන්නට
එක්වුණෙමි දිවියේ
අත්පොත ලියන්නට
වෙහෙර මහා දේවියගේ පරපුරට
ගෙවූ කාලය, ලැබූ පුහුණුව
කෙතරම් දුෂ්කර වුවත්
නිතර සිහිවුනේ ඔබමය
දිවි ගමනට හිරුටත් වඩා
එළිය දුන් මුදුන් මල්කඩ වන් පියාමය
නික්ම එන විට මා නිවසින්
සිතෙහි රැඳුණේ එක් බලාපොරොත්තුවකි
රකින්නට මගේ ලොව හිරු මාරයා පරයමින්
ලැබූ පළමු දින දහයේ විරාමයේ
ඉගිල්ලුනෙමි මා නිවස කරා
සෙව්වත් සැම තැනම පියා
දුටුවෙමි වියලි දර මිටක් සේ
සයනයේ තබා වාවනු බැරි විය හදවත
කඩා වැටුනි මගේ මුළු ලෝකය
හිත හදනු පිණිස එදවස
සැඟවූ රහස දුටිමි නෙත් දෙකින්
ආදර වදන් තෙපලන්නට
නොහැකි වූවත් දුටිමි දෙනෙතින්
හිතේ සැඟවුණු රහස්
මලානික ලෙස වැතිර සිටියත් සයනයේ
පෙනුනි හිරුටත් වඩා එළියක් ඔය වතේ
ගෙවුනි දින එකින් එක කාලයේ ඇවෑමෙන්
අල්ලා ගත නොහැකි විය හුයකින් බැඳවත්
උදාවිය දිනය නැවත යන්නට
අවිය අත ගෙන පුහුණුවේ
දෙපා වැන්දෙමි හිර කරන් දුක
සියළු සොම්නස් තදකරන්
නෙතින් ගැලූ කඳුළු දුටුවෙමි ඔබේ
මගේ දුට සමිඳු සරණයි කියා
ගත පමණක් රැගෙන අළුයම නිවසින්
පිටව ගියෙමි ඇසිල්ලේ
යන්නට වූයේ බසයෙන් හුවක දුරකි
ලැබුනේ ඇමතුමකි හිත සලිත කරවනා
වෙව්ලුම් හඬින් ඇසුනෙමි මවගේ අදෝනාව
පිටවූ මොහොතේ මා නිවසින්
පිලිකා මාරයාට දිනුම දී
දිවි ගමන නිමකර ඇති බව පියානන්..
පහලොස් වසක් ගෙවී ගියත් හමුදා ජීවිතේ
මා හට ඇත්තේ තවත් කෙටි කලකි
එයට සමුදෙන්නට
එහෙත් අදටත් අසන පැනයකි
මගේ හිත අස්සේ
තාත්තේ එදා ඔබ හුස්ම අල්ලන්
සිටියාද මා එනතුරු ඇස් අස්සේ

සෙ/725390
සැරයන් වර්ණකුලසූරිය ඩබ්ලිව්එම්බීඑම්
1 ශ්‍රීලයුකාබ

## සඳ නැති රැයක තරු..

සඳ එළිය වැටී තරු සැඟව යන රැයක
තරුවකට පෙම් කරන්නට
සඳ එළිය ඉඩදේද?
සඳ ගෙව් ගෙවී අමාවක පෑයූ රැයක
කරුවලට සැනසීම තරු එළිය නොමවේද?

මේජර් එම්ඊඑල් ගුණවර්ධන
4 ශ්‍රීලකාහ




## මව්පිය සෙනෙහස..

එක කිරි බිඳක හෝ ණය මට ගෙවන්නට
පුළුවන් උනේ නෑ අම්මේ අනේ මට
දිවියේ සැඳෑ කළ දුක සැප බැලීමට
නොලැබුණු එක දුකකි බැහැ එය දැරීමට

ආදර පියා හිරු විය ලොව එළිය කළ
අම්මා සඳකි මගෙ ලෝකය සිසිල් කළ
මගෙ හැඩ මුසුව නොපිපුණු මුත් තඹර විල
දිවියම මලක් වී පුදනෙමි දෙපා මුල

සෙ/370613
මා/සැරයන් මධුසංඛ එම්ඩී ආර්එස්පී
6 ශ්‍රීලංසිරෙ
යුහපති ආරක්ෂක ඒකකය



## නිදහසේ සතුට...

ජාති බේද අතැර දමා
එක්වීලා සියලුදෙනා
නිදහස් නිවහල් මගේ රට
සුවඳ බෙදයි මුළු ලෝකෙට
අපේ රටේ උන්නතියට
උරදුන් ඒ සියළුදෙනාම
ආඩම්බර ලීලාවෙන් සිහිකරගෙන පතමි නිවන්

සෙ/433387
ලා/කෝප්‍රල් සම්පත් ඩීඑම්අයි
9 ගැහේබ

## අවසන් කථාව...

ආදරය මහමෙරක් සේ
හදවතේ රුවාගෙන
නුඹ නැවත එනතුරු
සිපගන්න ඔය මුහුණ
මම බලාගෙන හිටියා
මාන්කුලම් මායිමේ
වෙඩි සද්දේ පැතිරුණා
රුදුරු යුද්දෙට මැදි වූ
නුඹව මට සිහිවුණා
අපේ සොඳුරු නිවහනේ
පිපී දිලෙන මල් පෙලේ
සුදු මල්ද රතුවුණා
කුරුලු ගී වියකුණා
ඒ දවස පැමිණුනා
විරු සුවඳ පැතිරුණා
නිහඬ බව නැතිවුණා
නුඹේ රතු ලේවලින්
ලක් දෙරණ තෙත් උනා
නුඹේ සුසුම් නැවතිලා
වාතලය පාවුණා
පුංචි පුතු හා දුවට
පිය සෙනෙහෙ නැතිවුණා
සසර කතරේ අතරමං වී
නුඹ අපෙන් වෙන්වුණා
කාලයද වියැකුණා යුද්දෙ
අවසන් වුණා
මුළු රටම එක් වුණා
සිංහ ධජ එසවුණා
රණකාමී නුඹේ නම
ඉතිහාස ගත වුණා

(දිවිපිදූ සෙ/100091 බනි
1 එච්එඩ්ලිව්එන් ජයරත්න
බලලත් නිලධාරීගේ බිරිඳ
සීකේ කුමාරි ඇන්තනී
මහත්මිය - ගම්පහ රණවිරු
සංසදය)



**මෙහි දිගහැරෙනුයේ කෙඩෙට් පාඨමාලා කාලයේ ඉපැරණි සුන්දර මතක අවුස්සන "කැඩ්ඩන්ගෙ කතා" ය. නිත්‍ය ස්වේච්ඡා, පිරිමි, කාන්තා මේ සෑම කෙඩෙට් පාඨමාලාවකදීම ඔබ අත්විඳි නොඑසේනම් ඔබගේ දැස් ඉදිරිපිට ආසන්නම සගයා අත්විඳි රසබර තොරතුරු අපවෙත ලියා එවන්න. මේ පිටුව ඒ වෙනුවෙනුයි.**

<ins>මෙම නිත්‍ය පාඨමාලා අංක 71 හා සම්බන්ධ සිදුවීමකි.</ins>

කෙඩෙට් නිලධාරියෙකු ලෙස දියතලාව විද්‍යාපීඨය වෙත ලංකාවේ නන් දෙසින් සුදුසුකම් ලැබූ තරුණයන් පැමිණෙන්නේ, අධ්‍යාපනය මෙන්ම ක්‍රීඩා නිපුණත්වයෙන් ද අනූන ජවැති තරුණයන් ලෙසය. මෙසේ පැමිණෙන තරුණයින් තුළ ඇතැම්විට දඩබ්බර ගති පැවතුම්ද නැතුවාම නොවේ. ජයසුන්දරද පාසල් අධ්‍යාපනයෙන් පසුව ජාතික තලයේ ක්‍රීඩා ජයග්‍රහණ ලබාගත් එවැනි කෙඩෙට් නිලධාරියෙකි.



පාඨමාලාව ඇරඹුනා පමණි. සතියක පුහුණුවෙන් පසුව ඉරිදා දින විවේකයක් ලැබුණේ, ඇඳුම් පැළඳුම් ආදිය සෝදාගෙන, නේවාසිකාගාරය හා එහි අවට පිරිසිදු කිරීම අරමුණ කොටගෙනය. එදින උදෑසන එකී කටයුතු සිදුවෙද්දී, හදිසියේම පාඨමාලාවේ සියලුම කෙඩෙට් නිලධාරීන් ආමරිය වෙත කැඳවූයේ ආයුධ ගනන් කිරීමේ කටයුත්තකටය. සියලුදෙනා වහා නැවත මූණකට සෝදා රැවුල් ආදිය කපා සූදානම් වූවත් ජයසුන්දර රැවුල කපාගැනීමට කම්මැලි වූයේ ඉරිදා දින එය එතරම් ප්‍රශ්නයක් නොවණු ඇතැයි සිතාය.

"රැවුල කපාගනින් මචං... කටු කටු පේනවා රැවුල" යැයි යාබද සගයන් පැවසූවද ඔහුගේ ප්‍රතිචාරය වූයේ එය ගණනකටවත් නොගැනීමයි.

"ඉරිදනේ බන්... අනික අද සර් එන්නෙත් නෑ... ඔහොම බයවෙලා කොල්ලෙක් වෙන්න බෑ" යනුවෙන් දඩබ්බර ගතිය ඔහුගෙන් ඉස්මතු වූ නිසාම අනෙක් සගයෝ ද බීරි අලින්ට වීණා වාදනය නොකරන්නට කටයුතු කළහ.




ආමරිය වෙත ගොස් එහි ඇති ආයුධ ගණින අතරතුර එහි පැමිණ සිටි උසස් නිලධාරියකුට ජයසුන්දර රැවුල කපා නැති බව නිරීක්ෂණය වූයේ ඔහු අසළට ගොස් කටු කටු රැවුල අතගාමින්ය.

"ආ... ඉලන්දාරියා රැවුල කපන්න අමතක වුණාද? නැත්තම් රැට රැට වලස්තෙල් ගානවද?"

ඔහුගේ වදන් අසළ සිටි අනෙක් කැඩෙට් නිලධාරීන් ද බිය ගැන්වෙන තරම් විය. අනතුරුව උපදේශක නිලධාරී විසින් ඒ මොහොතේම ඔහුව ආමරිය අසළ නටි තැබුවේ, "අපි තව ටිකක් රැවුල වැවෙනකල් ඉමු" යනුවෙන් පවසමිනි. එලෙස අප හෝරා කිහිපයක් ආයුධ ගනන් කිරීම් අවසන් වන තෙක්ම ඔහු එම ඉරියව්වේම විය. දවල් ආහාරයට පෙර නේවාසිකාගාරය වෙත ගිය අප ජයසුන්දර නානකාමරයේ රැවුල බාමින් සිටිනු දුටවේ, අනෙක් අයට සිහින් සිනහවක් ද එක් කරමින්ය. එදින සිට පාඨමාලාව අවසන් වන තෙක්ම සෑම උදෑසනම පළමුව රැවුල කැපීම සඳහා නාන කාමරයට යන්නේ ජයසුන්දරය.

<ins>මෙය නිත්‍ය පාඨමාලා අංක 40 හා සම්බන්ධ සිදුවීමකි.</ins>

උදෑසන ශාරීරික අභ්‍යාස පුහුණුව යටතේ එදින යෙදී තිබුණේ, විද්‍යාපීඨය අසළ සිට දියතලාව නගරය හරහා ගම්මානය මැදින් මැරතන් ධාවනයක්ය. කිලෝමීටර 5කට ආසන්න එම වටය අප සියලුදෙනා දිවගියේ පාඨමාලාව භාර නිලධාරි හා පාඨමාලාව භාර සෙසු නිලයන් තිදෙනෙකුත් සමඟය. ටිකදුරක් දිවගිය කෙඩෙට් නිලධාරීන් දෙදෙනකු අසල කුඩා කඩයක් විවෘතව තිබෙනු දැක සාක්කුවේ වූ මුදලින් වහ වහා කාහටවත් නිරීක්ෂණය නොවන පරිදි ග්ලූකෝස් පැකට් 2ක් මිලදී ගත්තේ, ග්ලූකෝස් කෑමෙන් ශරීරයට ශක්තියක් ලැබෙනවායි යන මතය බොහෝ දෙනා පිළිගත් නිසාය. කෙසේ හෝ කිසිදු ප්‍රශ්නයක් නොමැතිව ඔවුන් දෙදෙනා ඒවා මිලදීගෙන ධාවනය අවසන් කරමින් ප්‍රධාන ගේට්ටුව වෙත පැමිණියා පමණි. ඔවුන්ගේ එම නොසැලකිලිමත් ක්‍රියාව පාඨමාලා භාර නිලධාරියා වෙත අරංචි වී තිබුණු අතර, හොඳ හැටි වචන මාලාවකින් සංග්‍රහය ලැබූ ඔවුන් දෙදෙනාට ලැබුණු දඩුවම අපූරු එකක් විය. එනම් ග්ලූකොස් පැකට් දෙක එකවර කටේ හලාගෙන බිමට නොවැටෙන ලෙස ආහාරයට ගැනීමය. දෙදෙනා අනෙක් සඟයන් බලාසිටියදී, ඉතා අපහසුවෙන් එය ගිලදැම්මේ ලැජ්ජාවද යටපත් කරගනිමිණි. එතැනින් නොනැවතුණු ඔවුන්ගේ ඊළඟ දඩුවම වූයේ විනාඩි කිහිපයක් ඇතුළත "වයිට් ගේට්" අල්ලා නැවත ප්‍රධාන ගේට්ටුව අසලට දිවඒමය.





# රහ කැලි

## ලාභ බඩුව

මුහුදු වෙරළ දිගේ
ඇවිදිමින් සිටි බීමත්
මිනිසෙකුට රැල්ලේ පාවී ආ
බෝතලයක් හමුවිය. ඔහු
එහි මූඩිය ගැලවූ සැනින්
ඉන් භූතයෙක් මතුවිය.

**භූතයා** - ඔබ තුමා මගෙන්
ඕනෑම වරයක් ඉල්ලන්න...



**බීමත් මිනිසා** - මට කිසිම
රෙද්දක් ඕනෙ නෑ යකෝ...

සැනෙකින් බීමත් මිනිසා
ඇඳසිටි ඇඳුම්ද, භූතයාද
අතුරුදහන් විය.

## දඩ ගැසීම...

වාහනවල වැරදි ඇල්ලීම සඳහා යොදවා ඇති පොලිස් නිලධාරියෙකු ඈතින් එන පා පැදියක වැරදි රැසක්ම දුර සිටම දුටුවේය. වහාම ක්‍රියාත්මක වූ ඔහු පාර මැද්දට පැන්නේය.

**පොලිස් නිලධාරියා** - ඒයි... නවත්තනවා බයිසිකලේ... ඕකෙ බෙල් එකයි, මඩ්ගාඩ් දෙකයි නෑ නේද...?

**පා පැදිකරු** - පාරෙන් අයින් වෙන්ඩ රාළහාමි කරදර නොකර... ඒ දෙක විතරක් නෙවෙයි මේකෙ බ්‍රේකුත් නෑ...



# රණවිරුවා






**අධීක්ෂණය**

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එස් ගමගේ ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
පීඑස්සී





**උපදේශකත්වය**

ලුතිනන් කර්නල්
එච්වීකේඩබ්ලිව් අබේවික්‍රම
යූඑස්පී අයිජී

**ප්‍රධාන සංස්කාරක**

ලුතිනන් කර්නල්
ඊඑච් සුජිත් චමින්ද

**සහය සංස්කාරක**

කපිතාන්
එච්ජීජේ භවන්ති

**පරිගණක අකුරු සංයෝජනය,**
**කවර නිර්මාණය හා පිටු සැකසුම**

සෙ/752158 බනි II සේනාරත්න ජීසී - 3 ඉසේරෙ
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑච්එම් - 11 ඉසේරෙ

**ඔබේ නිර්මාණ, අදහස් හා යෝජනා එවිය යුතු ලිපිනය**

"රණවිරුවා"
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

**ඊමේල්**

dtemedia&psyops@army.lk
ranaviruwa@yahoo.com

**දුරකථන**

011 2993076

**යුහ දිගුව**

51445 / 51446 / 51447

**"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට**

**ප්‍රකාශනය**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය


# ඔබේ නිර්මාණ අපට එවන්න

සමස්ත යුද්ධ හමුදාවම නියෝජනය කරන එකම සඟරාව වන "රණවිරුවා" වසර ගණනාවක පටන් අඛණ්ඩවම ඔබ අතට පත්කෙරේ. යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන විශේෂිත සිදුවීම් මෙන්ම ක්‍රීඩා, සාහිත්‍යය, අධ්‍යාපනික, විදෙස් හා ඉතිහාස තොරතුරු වඩා විචිත්‍රවත් ලෙස හා හරවත්ව එළිදක්වන රණවිරුවා ඔබගේ දැනුම හා රසාස්වාදය පිණිස මාහැඟි පිටිවහලක් වී ඇති බැව් අප වෙත නිරතුරුව ලැබෙන ලිපි හා ඇමතුම් මඟින් සනාථ වේ.

එහෙත් විවිධ අංශ අපව වෙත ලිපි සහ නිර්මාණ යොමුකළද යුද්ධ හමුදාවේ ඇතැම් ආයතන වෙතින් තොරතුරු ලැබෙනුයේ ඉතා අල්ප වශයෙනි. එනිසාම යුද්ධ හමුදාව තුළ සිදුකෙරෙන බොහෝ ක්‍රියාකාරකම් පිළිබඳව සෙසු අය දැනුවත් නොවන තත්ත්වයක් පවතී එබැවින් ඔබගේ ඒකකයේ, රෙජිමේන්තුවේ, බලසේනාවේ, පුහුණු පාසලේ හෝ කුමන ස්ථානයක වුවද සිදුවන විශේෂ වැදගත්කමින් යුත් තොරතුරු ඇත්නම් අපවෙත යොමු කරන්න. අප ඒවා අප්‍රමාදව රණවිරුවාහි පළකිරීමට කටයුතු යොදා ඇත. එසේම, රණවිරුවා යුද්ධ හමුදාවට පමණක් සීමා නොවන්නකි. බාහිර පාඨකයන්ගේ ලිපි, නිර්මාණ, ඡායාරූප හා කාලීන තොරතුරු වෙනුවෙන්ද එහි නිරතුරු ඉඩකඩ වෙන්කොට ඇති බව සතුටින් දැනුම් දෙන්නෙමු. මාසිකව නොමිලේ ඔබ අතට පත්වෙන රණවිරුවා සඟරාව මඟින් පාඨක ඔබගේ නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කර ගනිමින් දැනුම හා තොරතුරු බෙදාහදා ගැනීමට එකතුවන්න.

- සංස්කාරක

# සෙන්පතියකුගේ පිළිබඳ මතක...

**මේජර් ජෙනරාල් විජය විමලරත්න ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී විරු සෙන්පතිගේ භූමිකාව මෙරට යුද වංශ කතාවේ සන්ධිස්ථානයකි. දේශප්‍රේමීත්වය මේ යැයි පසක්කොට තම යටත් පිරිසට වචනයේ පරිසමාප්තියෙන්ම නායකයකු වූ එතුමන් තම දිවිසැරිය නිමකරන අවසන් මොහොත තෙක්ම මව්බිම වෙනුවෙන් ඉටුකරන ලද්දේ අසමසම මෙහෙවරකි.**



# සතුරු බල බිඳ උතුරු බිමේදී සමුගත් යුද සෙන්පති

කොළඹ රාජකීය විද්‍යාලයේ දීප්තිමත් ආදි ශිෂ්‍යයකු වූ එතුමන් මූලික අධ්‍යාපන කටයුතුවලදී මෙන්ම විෂය බාහිර කටයුතුවලදී ද කැපීපෙනුණු සිසුවෙක්ව එහි ගුරු භවතුන්ගේ නොමඳ ආදරයට පාත්‍ර වූ අයෙකි. විද්‍යාලයීය ශිෂ්‍යභට කණ්ඩායමට එක්ව එහි සැරයන් තනතුරට ද පත්වූ හෙතෙම විද්‍යාලයේ හොකී, මුෂ්ටි ප්‍රහාරක සහ රග්බි ආදී ක්‍රීඩා කණ්ඩායම් රැසක සාමාජිකත්වය ද දැරීය.

1961 ඔක්තෝබර් මස 21 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බලසේනාවේ කෙඩෙට් නිලධාරියකු ලෙස එක්වන එතුමන් ඉන්දීය යුද හමුදා විද්‍යාපීඨයේ පාඨමාලාව හැදෑරීමට ශ්‍රී ලංකාවෙන් තේරුණු පළමු සිව්දෙනා අතරට එක්වීමට වාසනාවන්ත විය. සිය පුහුණුවෙන් අනතුරුව 1963 අගෝස්තු මස 01 වන දින සිට අධිකාරියට පත්වන ඔහු 1 ගැමුණු හේවා බළඇණියේ සාමාජිකයකු ලෙස සිය වෘත්තිය අරඹනුයේ එවකට ත්‍රස්තවාදය රටතුළ උඩුදුවමින් පැවති සමයකය. පසුකාලීනව ගජබා රෙජිමේන්තුව ස්ථාපිත කරමින් එහි නිර්මාතෘවරයා ලෙස ඔහු යුද්ධ හමුදාව තුළ එය අතිවිශිෂ්ට රණකාමී රෙජිමේන්තුවක් බවට පත්කරලන්නේ එහි පෙරගමන්කරු ලෙසය.

මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව, බ්‍රිගේඩියර් විජය විමලරත්න එකල යුදබිමේ සුවිශේෂී සුසංයෝගයක් වූ අතර, එය කොතරම් පැහුණි ද යත් ත්‍රස්තවාදිනට එය මරු පහරක්ම විය. මෙරට යුද ඉතිහාසයේ සන්ධිස්ථාන රැසක් තම නමින් ලියා තැබූ මේජර් ජෙනරාල් විජය විමලරත්න 1992 අගෝස්තු මස 08 වන දින අරාලි තුඩුවේදී ත්‍රස්තවාදීන් විසින් ඇටවූ බිම්බෝම්බයකට හසුව මේජර් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව ඇතුළු පිරිසක් සමඟම ජීවිතක්ෂයට පත්වන්නේ යුද හමුදාවට ද සමස්ත රටට ද වීරෝදාර සෙන්පතියකු මෙන්ම දැහිතකාමී යුග පුරුෂයකු ද අහිමි කරවමිනි.





ජනමාධ්‍ය හා මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල.